# කැලණිය සංවර්ධන සැලැස්ම
## 2019 - 2030

පළමු වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
2019 අගෝස්තු



# කැලණිය සංවර්ධන සැලැස්ම

## 2019–2030

**වෙළුම I**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
නාගරික සංවර්ධන අධිකාරිය

## කැලණිය සංවර්ධන සැලැස්ම 2019 – 2030 - පළමු වෙළුම

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2019

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

**ප්‍රකාශනය**

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන,7 වන හා 9 වන මහල, “සෙත්සිරිපාය”,
බත්තරමුල්ල, කොළඹ, ශ්‍රී ලංකාව

වෙබ්අඩවිය– www.uda.gov.lk
විද්‍යුත් තැපෑල– info@uda.gov.lk
දුරකථන අංක- + 94112 873 637

ප්‍රකාශනය 2019 - අගෝස්තු

කැලණිය සංවර්ධන සැලැස්ම 2019 - 2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමුවන කොටස සහ දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමේ පළමුවන කොටස මඟින් සංවර්ධන සැලසුම හැඳින්වීම, මූලික අධ්‍යයනය සහ සංවර්ධන සැලසුමේ අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මඟින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපායමාර්ගික සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මේ දෙවැනි වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර එහි 2019 -2030 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි සහ කලාපිකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

කැලණිය සංවර්ධන සැලැස්ම 2019 - 2030 නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟ පෙන්වීම පෙරදැරි කරගෙන සිදු කර ඇත.

**අධීක්ෂණ කටයුතු**

ආචාර්ය ජගත් මුණසිංහ ***සභාපති - නා.සං.අධි.***, ඉංජිනේරු එස්. එස්. පි. රත්නායක ***අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී කේ. ඒ. ඩි. චන්ද්‍රදාස ***හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ඩි.එම්. බි. රණතුංග ***අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.***, එම්. පී. රණතුංග ***නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර ***අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් හා පරේයේෂණ හා සංවර්ධන අංශය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ලලිත් විජේරත්න ***හිටපු අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය) - නා.සං.අධි.***, වයි. ඒ. පී. කේ. ගුණතිලක ***අධ්‍යක්ෂ (බස්නාහිර පලාත් අංශය) - නා.සං.අධි.***

**සැලසුම් කණ්ඩායම**

නගර නිර්මාණ ශිල්පී ජේ.සෝමසිරි ***නියෝජ්‍ය අධ්‍යක්‍ෂ සැලසුම් (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී එම්.එල්.එන්. යෙහියා ***නියෝජ්‍ය අධ්‍යක්‍ෂ සැලසුම් (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී එම්.ඒ.ඩී.ඒ. මුතුගල ***නියෝජ්‍ය අධ්‍යක්‍ෂ සැලසුම් (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී දයානි ෆැන්සිස් මෙනවිය ***නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (සැලසුම්), බස්නාහිර පළාත - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.යූ. විමලරත්න ***සහකාර අධ්‍යක්‍ෂ සැලසුම් (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, නගර නිර්මාණ ශිල්පී නදීපා පල්ලියගුරු ***සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් කාර්යාලය)***, වයි. එස්. සේනාරත්න සැලසුම් නිලධාරී (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි., සමන්ලතා කොඩිතුවක්කු, සැලසුම් නිලධාරී (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි., ඒ. එම්.සී. සමන්තිලක ***සහකාර සැලසුම් නිලධාරී (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, කේ. එම්. අයි. පතිරණ ***සහකාර සැලසුම් නිලධාරී (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***, ඩබ්.එම්.ඩී.ඒ. වාසල ***සහකාර සැලසුම් නිලධාරී (ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය) - නා.සං.අධි.***

**සහය කණ්ඩායම්**

සංවර්ධන සැලසුම් අංශය - නා.සං.අධි.
පර්යේෂණ සහ සංවර්ධන ඒකකය - නා.සං.අධි.
භූගෝලීය සහ තොරතුරු පද්ධති අංශය - නා.සං.අධි.
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අධි

# ප්‍රණාමය

කැලණිය නාගරික බල ප්‍රදේශයේ අනාගත සංවර්ධන දිශානතිය හඳුනාගනිමින්, 2019 – 2030 කාල පරාසය සඳහා භෞතික, ආර්ථික, සමාජීය සහ පාරිසරික අංශයන් ඒකාබද්ධ වූ නගර සංවර්ධන සැලසුමක් සකස් කරලීම උදෙසා ඍජුව මෙන්ම වක්‍රාකාරව සහය දැක්වූ පාර්ශවයන් රාශියක් ඇත. එම සියලු පාර්ශවයන් ගෞරවයෙන් සහ ස්තූති පූර්වකව සිහි ගැන්වීම අප සතු යුතුකමක් වේ.

පළමුකොට ම මෙම සංවර්ධන සැලැස්ම සාර්ථක කරගැනීම උදෙසා නොමසුරු අනුශාසනාවන් ලබා දෙමින් කටයුතු කල කැලණිය විහාරස්ථානයේ විහාරාධිපති අති පූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමියන් හට ගෞරව පූර්වක ප්‍රණාමය පුද කෙරෙන අතර විහාරස්ථ දායක සභාව ද ගෞරවයෙන් සිහිපත් කරන්නෙමු.

එමෙන්ම මෙම සංවර්ධන සැලැස්ම සාර්ථක කරගැනීම උදෙසා තම නොමසුරු සහයෝගය දක්වමින් ප්‍රදේශයේ අනාගත සංවර්ධන උන්නතිය උදෙසා කැපවෙමින් දායකත්වය ලබා දුන් කැලණිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමිය වන ඩබ්.ඩී. එස්. කුමුදිනී මහත්මිය ඇතුළු මහජන නියෝජිතයන් හට අපගේ ගෞරව පූර්වක ස්තූතිය පුද කරන්නට කැමැත්තෙමු. එසේම සංවර්ධන සැලැස්මේ මූලික පසුබිම ලෙස වර්තමාන තත්ත්වය විශ්ලේෂණය උදෙසා දත්ත හා තොරතුරු ලබා දෙමින් සහයෝගය පළ කළ ලේකම්තුමිය ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය ද විශේෂයෙන් සඳහන් කළ යුතුය.

කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්තුමිය, සහකාර ප්‍රාදේශීය ලේකම් තුමිය සහ සැලසුම් අංශයේ කාර්ය මණ්ඩලයට ද මෙහිදී විශේෂයෙන් ස්තූති කළ යුතුව ඇත. මීට අමතරව මෙම කැලණිය සංවර්ධන සැලැස්ම සැකසීමේ ආරම්භයේ සිටම මේ හා සම්බන්ධ වූ සියලුම ආයතනයන් නියෝජනය කරන ආයතන ප්‍රධානීන් ඇතුලු සියලු දෙනාටත් ප්‍රදේශයේ මහ ජනතාවටත් ගෞරවනීය ස්තූතිය පුද කරන්නෙමු.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ ඉහළ කළමනාකරණ මණ්ඩලය වන සභාපතිතුමා, අධ්‍යක්‍ෂක ජනරාල්තුමා, අතිරේක අධ්‍යක්‍ෂක ජනරාල්තුමා, නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්තුමා (සැලසුම්) සහ සංවර්ධන සැලසුම් අංශය, පර්යේෂණ සහ සංවර්ධන ඒකකය, බස්නාහිර පළාත් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය සහ පරිසර සහ භූ දර්ශන අංශයද ඇතුළු සහයෝගය දැක්වූ සියලුම අංශ වෙතද අපගේ ගෞරව පූර්වක ස්තූතිය හිමි විය යුතුය. එසේම බස්නාහිර පළාත් අධ්‍යක්‍ෂකතුමන් සහ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂකතුමන් ඇතුළු කාර්ය මණ්ඩලයද මෙහිදී ස්තූති පූර්වකව සිහිපත් කළ යුතුය.

# ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය



1978 අංක 41 දරණ පනත යටතේ ස්ථාපිත නාගරික සංවර්ධන අධිකාරිය, 2018 වසර වන විට ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත නාගරික ප්‍රදේශ උදෙසා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම සඳහා වූ බලයලත් නියාමන ආයතනය ලෙස අති විශිෂ්ට දායකත්වයක් සපයමින් වසර 40 ක සේවය අවසන් කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ 2018–2022 උපායමාර්ගික සැලැස්ම අනුව "නාගරික ප්‍රදේශයන්හි සැලසුම්ගත භෞතික සංවර්ධනය" යන දැක්ම අනුව යමින් 2020 වසර වන විට සියලු නාගරික බල ප්‍රදේශයන් උදෙසා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ අරමුණ පෙරදැරිව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් වසර දෙකක් පුරාවට ක්‍රියාත්මක කරන ලද පුළුල් ක්‍රියාවලියක් ඔස්සේ කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද නගර සංවර්ධන සැලැස්ම ගැසට් කර ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් කොට ඇත.

කැලණිය, ශ්‍රී ලාංකීය ඓතිහාසික විකාශනයෙහි සංධිස්ථානයක් ලෙස ප්‍රසිද්ධියක් උසුලන ප්‍රදේශයක් වශයෙනුත්, පසුකාලීනව උප නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රධාන වාණිජ නගරයටත්, පරිපාලන නගරයටත් ඉතා ආසන්නව පවතින අතර වත්මන් කැලණිය, උසස් අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙසත්, කිරිබත්ගොඩ නගරය කලාපයේ ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියත්මක වන භූමිකාව ඉතා වැදගත් වේ. මෙම සියලු වැදගත් සාධකයන් සලකා බලමින්, නිශ්චිත ඉදිරි දැක්මක් සහිත සැලැස්මක් ඉදිරිපත් කිරීම අගනා කර්තව්‍යක් ලෙස දැක්විය හැකිය.

ඒ අනුව කැලණිය සංවර්ධන සැලැස්ම 2019 – 2030 හි ප්‍රකාරව, එහි භෞතික පරිසරය හසුරුවමින් ඓතිහාසික ආගමික මධ්‍යස්ථානයක් ලෙස පවත්වා ගැනීමත්, නාගරික ප්‍රජාවගේ ජීවන තත්ත්වයන් නගා සිටුවමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහි කිරීම උදෙසා වන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අනුග්‍රහය දැක්වීම අපගේ අභිප්‍රායයි. එසේම, මෙම සැලසුම්මය මැදිහත්වීම් ඔස්සේ ප්‍රදේශය තුළ බල පැවැත්වෙන නාගරික ගැටලු විසඳා ගැනීමත්, මෙතෙක් ප්‍රයෝජනයට නොගත් සංවර්ධන විභවතාවන් තවදුරටත් නිසි අයුරින් යොදා ගනිමින්, නාගරික ප්‍රදේශය සඳහා වූ පුළුල් ඉදිරි දැක්ම සාක්ශාත් කර ගැනීම උදෙසා කටයුතු කිරීම අරමුණු වේ.

අවසාන වශයෙන්, මෙම කර්තව්‍යය සාර්ථකව සම්පූර්ණ කිරීම සඳහා මහඟු දායකත්වයක් සැපයූ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කළ කණ්ඩායම ඇතුළු නාගරික සංවර්ධන අධිකාරියේ සියලු කාර්යය මණ්ඩලයටත් ප්‍රශංසා කරමි. එසේම, මේ සඳහා දායකත්වය දැක්වූ අදාල පළාත් පාලන ආයතනය, රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ ආයතන සහ පොදු මහජනතාවත් ඉතා ඉහලින් අගය කරමි.

ඉදිරි දශකය තුළ, කැලණිය සංවර්ධන සැලැස්ම සියලු පාර්ශවකරුවන්ගේ සහයෝගීත්වය ඇතිව, 'සර්වප්‍රකාරයෙන් සාර්ථකව ක්‍රියාත්මක වේවා යැයි' සුභාශිංසන පිරිනමමි.

පාඨලී චම්පික රණවක
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මකව කළමනාකරණය කිරීමේ වගකීමද පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් නාගරික ප්‍රදේශ හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව  ඇත. ඒ අනුව සියලු නාගරික ප්‍රදේශ උදෙසා සැලසුම්ගත භෞතික සංවර්ධනයක් යන්න ඉලක්ක කරගනිමින් 2020 වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත සියලුම නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි පුළුල් සංවර්ධන සැලසුම් සකස් කිරීමට යොමු වී ඇත.

එම සංවර්ධන සැලසුම් සකස් කිරීම සංකීර්ණ, අභියෝගාත්මක සහ අවිනිශ්චිත වූත් කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය, නූතන තාක්ෂණය, මෙවලම් සහ ක්‍රමෝපායන් තුළින් උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සඳහා යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස කැලණිය නාගරික බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක කඩිනම් අවශ්‍යතාවය හඳුනාගත් අතර කැලණිය පූජා භූමිය කේන්ද්‍ර කොටගෙන ඉහළ නාගරීකරණය හමුවේ එහි පූජනීයත්වය සහ ආවේණිකත්වය ආරක්ෂාකර ගනිමින් වත්මන් සංවර්ධන නැඹුරුතාවයන් ද නිසි පරිදි යොදාගෙන කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් සහිත ව ගමනාගමනය පාදක කොටගත් ජනාවාස සහිත හරිත නගරයක් බිහිකිරීම යන අභිලාශය පෙරදැරිව එහි අනාගත දිශානතිය හඳුනාගෙන ඇත.

මෙම පුළුල් කාර්යය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ඇප කැප වී කටයුතු කළ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම සහ නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමෙන අතර මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගයක්  ඉදිරියටත්  බලාපොරොත්තු වෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

# ගරු ප්‍රාදේශීය සභාපතිතුමියගේ පණිවිඩය



දශක හතරක් පුරාවට ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයේ පුරෝගාමී මෙහෙවර ඉටු කරන නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රාදේශීය පරිපාලන ආයතන සමඟද ඒකාබද්ධ වෙමින් නිසි භූමි පරිහරණ රටාවකින් යුක්තව සියලු නාගරික අවශ්‍යතා සපුරාලමින් ජීවත් වීමට හිතකාමී නගර නිර්මාණය උදෙසා පෙළ ගැසී සිටී. කැලණිය ප්‍රාදේශීය බල සීමාව 2001 වසරේදී නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් බවට පත් වීමත් 2017 වසරේ සිට මහ කොළඹ සංවර්ධන හර ප්‍රදේශයට අයත් වීමත් සමඟම නාගරික සංවර්ධන අධිකාරියට භෞතික, ආර්ථික, සමාජීය සහ පාරිසරික අංශයන්හි ගුණාත්මක සහ තුලනාත්මක සංවර්ධනය උදෙසා වඩා වැඩි බරක් එක් වූ අතර ප්‍රාදේශීය පරිපාලන ආයතනය ලෙස කැලණිය ප්‍රාදේශීය සභාවද මෙම සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කරමින් පොදු මහජන සුභසිද්ධිය උදෙසා නොපිරිහෙලා තම වගකීම් සමුදාය ඉටු කරන ලදී.

ඒ අනුව 2019 – 2030 කාල සීමාව තෙක් බල පැවැත්වෙන කැලණිය සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය මඟින් සම්පාදනය කොට තවදුරටත් නෛතික රාමුවක් යටතේ ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය යහපත් දිශානතිකයකට පත්කරලීමට කටයුතු කර ඇත. එමඟින් අනාගත නේවාසික ප්‍රජාව මෙන්ම එදිනෙදා තම ජීවන අවශ්‍යතා සඳහා ප්‍රදේශයට සංසරණය වන නාගරික ප්‍රජාවද ඉලක්ක කර ඇති අතර පවතින සංවර්ධන විභවතාවයන් හරහා ආර්ථික, සමාජීය ප්‍රතිලාබ එක් කරලීමටත් කටයුතු යොදා ඇත. එපමණක්ද නොව මෙම නගර සංවර්ධන සැලැස්ම හරහා කැලණිය පූජා නගරය පාදක කොටගත් ඉහළ නාගරීකරණය හමුවේ එහි පූජනීයත්වය සහ ආවේණිකත්වය ආරක්ෂා කර ගනිමින් වත්මන් සංවර්ධන නැඹුරුතාවයන් ද නිසි පරිදි යොදාගෙන කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් සහිත ව ගමනාගමනය පාදක කොටගත් ජනාවාස සහිත හරිත නගරයක් බවට කැලණිය ප්‍රාදේශීය බල ප්‍රදේශය පත් කරලීමේ අපේක්ෂිත දැක්ම උදෙසා මා ඇතුළු කැලණිය ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයන් කැප වී සිටින අතර එම උදාරතර අරමුණ වෙනුවෙන් තම වගකීම් සහ යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමටද බලාපොරොත්තු වේ.

ඩබ්.ඩී. එස්. කුමුදිනී
සභාපති
කැලණිය ප්‍රාදේශීය සභාව

# පූර්විකාව

2001 පෙබරවාරි 13 දින අංක 1171/10 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මේ වන විට මහා කොළඹ සංවර්ධන හර ප්‍රදේශයට අයත් වේ. ඒ අනුව ප්‍රදේශය තුළ පවතින තත්ත්වය විද්‍යාත්මක විශ්ලේෂණයන් මත පදනම්ව සිදු කළ අධ්‍යයනයන් තුළින් හඳුනාගත් ප්‍රධාන ගැටළු අනුව 2019 –2030 වසර සඳහා බල පැවැත්වෙන ලෙස කැලණිය නාගරික සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත. එහි පළමු වෙළුම, පළමුවන සහ දෙවන ලෙස කොටස් දෙකකින් සමන්විත වන අතර පළමුවන කොටස මඟින් පරිච්ඡේද තුනක් යටතේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයනය සහ සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කෙරේ. දෙවන කොටස තුළ සංවර්ධන සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන පරිච්ඡේද අඩංගු වේ.

සංවර්ධන සැලැස්මේ පසුබිම වන පළමු පරිච්ඡේදය තුළ හැඳින්වීම, සංවර්ධන සැලසුම් කණ්ඩායම, විෂය පථය සහ අනුගමනය කරන ලද සැලසුම් ක්‍රියාවලිය විස්තරාත්මකව ඉදිරිපත් කෙරේ. මූලික අධ්‍යයනය වන දෙවන පරිච්ඡේදය මඟින් අධ්‍යයන ප්‍රදේශය, සැලසුම් සහ තත්ත්ව සන්දර්භය මෙන්ම සැලසුම් බල ප්‍රදේශය නිර්ණය කිරීම පිළිබඳව විස්තර කෙරේ. පරිච්ඡේදය තුන මඟින් කැලණිය නාගරික බල ප්‍රදේශය සඳහා නගර සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය තාර්කික පදනමකට අනුකූලව ප්‍රධාන ගැටළු තුනකට ගොනු කරමින් සාකච්ඡා කොට ඇත.

එහි දෙවන කොටස සංවර්ධන සැලසුම් රාමුව ලෙස පරිච්ඡේද හතර මඟින් ආරම්භ වන අතර කැලණිය පූජා නගරය පාදක කොටගෙන ඉහළ නාගරීකරණය හමුවේ එහි පූජනීයත්වය සහ ආවේණිකත්වය ආරක්ෂාකර ගනිමින් වත්මන් සංවර්ධන නැඹුරුතාවයන් ද නිසි පරිදි යොදාගෙන කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් සහිත ව ගමනාගමනය පාදක කොටගත් ජනාවාස සහිත හරිත නගරයක් බිහි කිරීමෙහිලා වන අපේක්ෂාව මුදුන් පමුණුවා ගත හැකි පරිදි අනාගත දැක්ම, එහි ප්‍රකාශනය, අරමුණු සහ පරමාර්ථ අඩංගු කොට ඇත. පරිච්ඡේදය පහ මඟින් අරමුණු තුනට අදාලව කරන ලද SWOT විශ්ලේෂණයන් සාරාංශ වශයෙන් මෙන්ම විස්තරාත්මකව විශ්ලේෂණය කොට ඇත.

2030 වසර සඳහා වන අපේක්ෂිත දැක්ම සාක්ෂාත් කරලීම උදෙසා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම හයවන පරිච්ඡේදය මඟින් විස්තර කෙරෙන අතර එහි සංකල්පිත සැලැස්ම, යෝජිත භූමි පරිහරණ සැලැස්ම සහ උපායමාර්ගික සැලසුම් අන්තර්ගත කර ඇත. මෙහිදී අපර ව්‍යූහ පහසුකම් සංවර්ධනය කිරීමේ සැලැස්ම, පූජා භූමි සංවර්ධන, ආර්ථික සහ පාරිසරික සංරක්ෂක සැලැස්ම ප්‍රධාන උපායමාර්ගික සැලසුම් ලෙස දක්වා ඇති අතර ඒ යටතේ යෝජිත උපායමාර්ගික ව්‍යාපෘති සහ වගකිව යුතු ආයතනික රාමුවත් විස්තර කෙරේ.

# පටුන


| | |
|---|---|
| ප්‍රණාමය | III |
| ගරු අමාත්‍යතුමාගේ පණිවිඩයය | IV |
| ගරු සභාපතිතුමාගේ පණිවිඩය | V |
| ගරු ප්‍රාදේශීය සභාපතිතුමියගේ පණිවිඩය | VI |
| පූර්විකාව | VII |

පළමු කොටස

| | |
|---|---|
| පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම | 01 |
| 1.1. හැඳින්වීම | 02 |
| 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් | 02 |
| 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය | 04 |
| 1.4. සැලසුම් ක්‍රියාවලිය | 05 |
| පරිච්ඡේදය 02 : මූලික අධ්‍යයනය | 09 |
| 2.1. අධ්‍යයන ප්‍රදේශය | 10 |
| 2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය | 11 |
| 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම | 18 |
| පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය | 21 |
| 3.1. කැලණියේ ආගමික, සංස්කෘතික හා ඓතිහාසික වැදගත්කමත් සමඟ ගොඩනැගුනු අනන්‍යතාව හෙවත් එහි ස්ථානීය හැඟීම වියැකී යාම (Declining of the 'Sense of Place') | 22 |
| 3.2. පාරිසරික අසමතුලිතතාව නිසා ඇතිවන ක්ෂණික ගංවතුර හා නාගරික තාපය ඉහළ යාමත් සමඟ සුවදායක නොවන පරිසරයක් නිර්මාණය වීම | 25 |
| 3.3. රථ වාහන තදබදය ඉහළ යාම | 28 |

දෙවන කොටස

| | |
|---|---|
| අමාත්‍යතුමාගේ අනුමැතිය | 32 |
| ගැසට් නිවේදනය | 33 |
| පරිච්ඡේදය 04 : සංවර්ධන සැලැසුම් රාමුව | 35 |
| 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම | 36 |
| 4.2. දැක්මෙහි ප්‍රකාශනය | 37 |
| 4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු | 38 |
| 4.4. සංවර්ධන සැලැස්මේ පරමාර්ථ | 38 |
| පරිච්ඡේදය 05 : SWOT විශ්ලේෂණය | 41 |
| 5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය | 42 |
| 5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය | 48 |

පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම 73

6.1. සංකල්පිත සැලැස්ම 74
6.2. යෝජිත භූමි පරිහරණය සැලැස්ම 76
6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධන කිරීමේ උපායමාර්ගික සැලැස්ම 79

6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම 79
6.3.2. මාර්ග හා ප්‍රවාහන සැලැස්ම 94
6.3.3. ජල සැපයුම් සැලැස්ම 100
6.3.4. විදුලි සැපයුම් සැලැස්ම 103
6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම 105
6.3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 106

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 111

6.4.1. යෝජිත ආර්ථික සැලැස්ම 111

6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 116

6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම 116
6.5.2. භූ දර්ශන සැලැස්ම 118
6.5.3. ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම 120
6.5.4. පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 124

6.6. සංස්කෘතික හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපායමාර්ගික සැලැස්ම 129

6.6.1. ප්‍රපූජා භූමි සංවර්ධන සැලැස්ම 129

6.7. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම 122

6.7.1. උපායමාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති 134
6.7.2. වගකිවයුතු ආයතනික රාමු 161

අර්ථ කථනයන් 165
කෙටි යෙදුම් 165
සිතියම් ලේඛනය 166
වගු ලේඛනය 167
රූප සටහන් ලේඛනය 168
ඇමුණුම් ලේඛනය 169
ඇමුණුම් 171
පරිශීලිත මූලාශ්‍ර 227



# පළමු කොටස

# 01

පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මේ පසුබිම

01 පරිච්ඡේදය
සංවර්ධන
සැලැස්මේ පසුබිම

හැඳින්වීම

සංවර්ධන සැලැස්මේ
පාර්ශවකරුවන්

# 1.1. හැඳින්වීම

තෝරාගත් ප්‍රදේශයක් උදෙසා නිශ්චිත ඉදිරි දැක්මක් අනුව ක්‍රමවත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම මඟින් ජනතාවගේ සමාජීය, භෞතික හා ආර්ථික උන්නතිය හා අභිවෘද්ධියත් කලාපයේ විභවතාවයන් වැඩිදියුණු කරගනිමින් පවත්නා ගැටළු මඟහරවා ගැනීම අපේක්ෂා කෙරේ. නාගරික සංවර්ධන අධිකාරිය, 1978 අංක 41 දරණ පනත යටතේ ශ්‍රී ලංකාවේ ප්‍රකාශිත නාගරික බල ප්‍රදේශ සඳහා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම සඳහා වූ බලයලත් නියාමන ආයතනයයි. එමෙන්ම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධන) පනතේ කොටස 8 අ (I) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන බල ප්‍රදේශයන් සඳහා ඒකාබද්ධ සංවර්ධන සැලසුම් සකස් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත බලය ලබා දී ඇත.

ඒ අනුව කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි කැලණිය ප්‍රදේශය, වර්ෂ 1987 දී ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් ලෙසට ස්ථාපිත කර ඇති අතර, 1978 අංක 41 දරණ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව 2001 පෙබරවාරි 13 වන දින අංක 1171/10 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් නාගරික සංවර්ධන අධිකාරියට අයත් වන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. එහෙත් 2018 වසර වන විටත් මෙම ප්‍රදේශය ගැසට් කරන ලද නාගරික සංවර්ධන සැලැස්මක් මඟින් නිසි පරිදි සැලසුම් කර නොමැත. මේ නිසා නාගරික සංවර්ධන අධිකාරියේ 2018-2022 උපායමාර්ගික සැලැස්ම අනුව "නාගරික ප්‍රදේශයන්හි සැලසුම්ගත භෞතික සංවර්ධනය" වෙත අවධානය යොමු කර ඇති අතර, වත්මන් නගර සංවර්ධනය සම්බන්ධයෙන් වූ සංකීර්ණත්වය හේතුවෙන් කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීමට තීරණය කර තිබේ.

එබැවින් 2019 සිට 2030 දක්වා කාලයට වලංගු වන පරිදි ප්‍රාදේශීය මට්ටමේ සැලසුමක් ලෙස කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය උදෙසා උපායමාර්ගික සංවර්ධන සැලැස්මක් සකස් කර ඇත. මෙම සංවර්ධන සැලැස්ම මඟින් ප්‍රදේශයේ නාගරික තදබදය අවම කරගනිමින්, පූජනීය කැලණි පුද බිමෙහි ආවේණිකත්වය මෙන්ම ස්වභාවික පරිසරය ආරක්ෂා කරගනිමින් ආර්ථික, සමාජීය, හා භෞතික වශයෙන් තිරසාර සංවර්ධනයක් කරා යොමු වීම අපේක්ෂා කෙරේ.

# 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

කැලණිය උපායමාර්ගික සංවර්ධන සැලැස්ම 2019 – 2030 දක්වා සකස් කිරීම සඳහා අදාල සියලුම රාජ්‍ය හා පෞද්ගලික මෙන්ම වගකීම් සහිත බලධාරීන්,ආයතන සහ ප්‍රජාව සම්බන්ධ කරගනු ලැබීය. මේ තුළින් ප්‍රදේශයට සම්බන්ධ සියලුම ආයතන,බලධාරීන් සහ ප්‍රජාවගේ අදහස්,උපදේශ හා යෝජනා ලබාගෙන සර්වග්‍රාහී සැලැස්මක් සකස් කිරීම අපේක්ෂා විය.

### මූලික පාර්ශවකරුවන්

1. *කැලණිය ප්‍රාදේශීය සභාව*

### මූලික උපදේශක ආයතන

1. *කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*
2. *කැලණිය රජමහා විහාරස්ථානය*
3. *ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව*
4. *මාර්ග සංවර්ධන අධිකාරිය*
5. *ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව*
6. *වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව*

7. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
8. මධ්‍යම පරිසර අධිකාරිය
9. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
10. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
11. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
12. ලංකා විදුලිබල මණ්ඩලය
13. ලංකා විදුලි පෞද්ගලික සමාගම

මෙම ප්‍රධාන උපදේශක ආයතනයන්හි සහභාගිත්ව නාම ලේඛනය ඇමුණුම 01 මඟින් දැක්වේ.

## පාර්ශවකරුවන්ගේ කණ්ඩායම්

1. කලාප අධ්‍යාපන කාර්යාලය
2. මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
3. වෙළඳ සංගමය – කිරිබත්ගොඩ
4. කිරිබත්ගොඩ සිංහල වෙළඳ සංගමය
5. බස් සවිය / ත්‍රිරෝද රථ සංගමය
6. ගොවිජන සේවා මධ්‍යස්ථානය
7. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
8. කැලණිය පොලිස් ස්ථානය

## නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම

1. අධ්‍යක්ෂ (සැලසුම්) , බස්නාහිර පළාත - වයි. ඒ. ජී. කේ. ගුණතිලක
2. හිටපු අධ්‍යක්ෂ (සැලසුම්) , බස්නාහිර පළාත - ජනක් රණවීර මහතා
3. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), බස්නාහිර පළාත – දයානි ෆැන්සිස් මෙනවිය
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය – ජේ. සෝමසිරි මහතා
5. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය – එම්.ඒ.ඩී.ඒ. මුතුගල මහතා
6. නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය – එම්. එල්. එම්. යෙහියා මහතා
7. සැලසුම් නිලධාරී, බස්නාහිර පලාත් අංශය – නදීපා පල්ලියගුරු මෙනවිය
8. සැලසුම් නිලධාරී, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය – එච්. එස්. සේනාරත්න මිය
9. සැලසුම් නිලධාරී, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය – සමන්ලතා කොඩිතුවක්කු මිය
10. සහකාර සැලසුම් නිලධාරී, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය - ඒ. එම්.සී. සමන්තිලක මෙනවිය
11. සහකාර සැලසුම් නිලධාරී, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය - කේ. එම්. අයි. පතිරණ මිය
12. සහකාර සැලසුම් නිලධාරී, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය - ඩබ්. එම්. ඩී. ඒ. වාසල මෙනවිය
13. පරිගණක ක්‍රියාකරු – එච්. චතුර ලංකා මහතා

## ඉහළ කළමනාකරණ සහ නාගරික සංවර්ධන අධිකාරියේ සහාය අංශ

1. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය – ආචාර්ය ජගත් මුණසිංහ මහතා
2. අධ්‍යක්ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය –
   ඉංජිනේරු එස්.එස්.පී. රත්නායක මහතා
3. හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), නාගරික සංවර්ධන අධිකාරිය –
   කේ.ඒ.ඩී. චන්ද්‍රදාස මහතා
4. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), නාගරික සංවර්ධන අධිකාරිය –
   ඩී.එම්.බී. රණතුංග මහතා
5. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), නාගරික සංවර්ධන අධිකාරිය –
   එම්.පී. රණතුංග මහතා

නාගරික සංවර්ධන අධිකාරියේ අනුග්‍රාහක අංශ

1. *සංවර්ධන සැලසුම් අංශය*
2. *පර්යේෂණ හා සංවර්ධන ඒකකය*
3. *භූගෝලීය තොරතුරු පද්ධති අංශය*
4. *පරිසර සහ භූ දර්ශන අංශය*

# 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

කැලණිය, කොළඹ නගරයට තදාසන්න ජනාකීර්ණ ප්‍රදේශයක් ලෙස අතීතයේ සිටම සංවර්ධනය වෙමින් පවතී. 1978 අංක 41 දරණ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව 2001 පෙබරවාරි 13 වන දින අංක 1171/10 දරණ අති විශේෂ ගැසට් නිවේදනය යටතේ අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් වන කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වත්මන් සංවර්ධන තීව්‍රතාව හේතුවෙන් ඇමුණුම 02 හි සඳහන් පරිදි 2017.12.11 වන දින සිට අංක 2049/11 දරණ ගැසට් නිවේදනය යටතේ "මහා කොළඹ සංවර්ධන කලාපයේ හර ප්‍රදේශයට" අයත් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන බෞද්ධ විහාරස්ථානයක් වන ඓතිහාසික කැලණිය රජමහා විහාරස්ථානයේ පිහිටීම හේතු කොටගෙන මෙම ප්‍රදේශයට ඉමහත් ආවේණික වටිනාකමක් උරුම වී ඇත. නමුත් වර්තමානයේ පැන නැගී ඇති නාගරික ගැටළු හමුවේ එම ප්‍රදේශයට සිදුවන බලපෑම අවම කර ගනිමින් භෞතික හා සමාජීය වශයෙන් අභිවෘද්ධියක් ළඟා කර ගැනීම උදෙසා සැලසුම්මය මැදිහත් වීමක අවශ්‍යතාවයක් පවතී. මෙහි ප්‍රතිඵලයක් ලෙස කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා උපායමාර්ගික නාගරික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා අවධානය යොමු කෙරේ.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ, කැලණිය පූජා නගරය පාදක කොටගෙන ඉහළ නාගරීකරණය හමුවේ එහි පූජනීයත්වය සහ ආවේණිකත්වය ආරක්ෂාකර ගනිමින් වත්මන් සංවර්ධන නැඹුරුතාවයන් ද නිසි මඟට යොමු කරමින් කාර්යක්‍ෂම ප්‍රවාහන පහසුකම් ද වැඩි දියුණු කරමින් ගමනාගමනය පාදක කොටගත් ජනාවාස සහිත හරිත නගරයක් බිහි කිරීමයි. වසර 2030 වන විට මෙම තත්ත්වය උදා කර ගනිමින් භෞතික, පාරිසරික, ආර්ථික හා සමාජ සුභසාධනයක් ඇති කිරීම උදෙසා සංස්කෘතික හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපායමාර්ග, භෞතික හා සාමාජීය අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග, ආර්ථික සංවර්ධන උපායමාර්ග හා තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග යොදාගනිමින් සැලසුම් සම්පාදනය කර ඇත.

මේ අනුව කැලණිය පූජා නගර සැලැස්ම, අපර ව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම, ආර්ථික සැලැස්ම හා පාරිසරික කළමනාකරණ සැලැස්ම යන ප්‍රධාන සැලසුම්මය මැදිහත්වීම් ඔස්සේ ඒකාබද්ධ නාගරික සංවර්ධන සැලැස්මක් ලෙස ඉදිරිපත් කෙරෙන අතර, මෙම සැලැස්ම 2019 සිට 2030 දක්වා වසර 12 ක කාල සීමාවක් සඳහා වලංගු වේ. මෙය කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සැලසුම් බල ප්‍රදේශයක් ලෙස සලකමින් කරන ලද ප්‍රාදේශීය මට්ටමේ උපායමාර්ගික සැලැස්මකි. මෙහි 2030 වසර උදෙසා වන දැක්ම ඉන් ඔබ්බට දිව යා හැකි දීර්ඝකාලීන දැක්මක් වුවද සැලැස්ම වසර 12ක් දක්වා සීමා වීමත් මෙම ප්‍රදේශය කලාපීය සන්දර්භය තුළ ආකර්ෂණීය කර්මාන්ත ප්‍රදේශයක් ලෙස පැවතිය ද ප්‍රාදේශීය සන්දර්භය සැලකිල්ලට ගනිමින්, කැලණිය පූජා භූමියේ ඓතිහාසික, සංස්කෘතික හා ආගමික සුවිශේෂීත්වය අවධාරණය කරමින් එහි ආවේණිකත්වය පිළිබඳව වැඩි අවධානයක් යොමු කර තිබීමත් මෙහි සීමාවන් ලෙස දැක්විය හැකිය.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

**අප සිටින්නේ කොහේද ?**

**පසුබිම් අධ්‍යයනය**

**රාමුගත කිරීම හා විමර්ශනය**

- 2017 මැයි මාසයේ ආරම්භ කරන ලදී.
- දත්ත රැස්කිරීම: ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත - ඉතිහාසය සහ පුරා විද්‍යාව/ ජනගහනය / සමාජ / ආර්ථික/ පරිසරය සහ භෞතික / ආපදා සහ වෙනත්
- දත්ත එකතු කිරීමේ ක්‍රම: සමීක්ෂණ, ක්ෂේත්‍ර නිරීක්ෂණ, අන්තර්ජාලය ගූගල් භූමි සිතියම්, චන්ද්‍රිකා ඡායාරූප, ආදිය
- දත්ත ගබඩා කිරීම : GIS භූ දත්ත සමුදාය (Geo-Data Base - Exell)

**මහජන/පාර්ශවකරුවන්ගේ උපදේශනය**

- දිනය: 2017 නොවැම්බර් 20
- ස්ථානය: රෝයල් පාර්ක් හෝටලය, කිරිබත්ගොඩ
- විශ්ලේෂණ ක්‍රම NVIVO තාක්ෂණය

**ගැටළු සහ විභවතා හඳුනාගැනීම හා අර්ථ දැක්වීම**

- ගැටළුවල වැදගත්කම, සන්දර්භය හා පරිමාණය අනුව සැලකියයුතු ගැටළු හඳුනා ගැනීම.
- විශ්ලේෂණය:සංවර්ධනය පීඩනය, පාරිසරික සංවේදීතාව, Typological analysis, රථවාහන තදබදය සහ NDVI විශ්ලේෂණය, ලේඛන ආශ්‍රිත විමර්ශන

**අපිට යාමට අවශ්‍ය කොතැනටද ?**

**දැක්ම සහ අරමුණු සැකසීම**

- හඳුනාගත් ප්‍රධාන ගැටළු, ප්‍රාදේශීය හා සංවර්ධන ප්‍රවණතා නියෝජනය වන පරිදි 2030 වසර සඳහා නව දැක්ම හා අරමුණු සකස් කිරීම

**සවිස්තරාත්මක විශ්ලේෂණය**

- සෑම ඉලක්කයක් සඳහා ම SWOT විශ්ලේෂණය.
- විශ්ලේෂණය: අධි ඝනත්ව වාසස්ථාන සඳහා සුදුසු බිම් හඳුනා ගැනීමට GIS බහු විශ්ලේෂණ, තෙත්බිම් වර්ගීකරණය සඳහා GIS බහු විශ්ලේෂණ, water flow accumulation , ආදිය.

**පරමාර්ථ සකස් කිරීම**

- SWOT විශ්ලේෂණය පදනම් කොටගෙන අනාගත දැක්ම සපුරා ගැනීම උදෙසා පරමාර්ථ සම්පාදනය.

**අපි එහි යන්නේ කෙසේද ?**

**සැලසුම් සහ උපායමාර්ග සම්පාදනය**

- පරමාර්ථයන් උපායශීලීව ප්‍රවාහන, ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික සැලසුම්වලට පරිවර්ථනය කිරීම

**රෙගුලාසි සම්පාදනය**

- සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි ස්ථාපිත කිරීම.

**අනුමැතිය ලබා ගැනීම**

- අදාල පළාත් පාලන බලධාරීන්ගේ හා මහජන අනුමැතිය ලබා ගැනීම.

**අවසන් අනුමැතිය**

- සංවර්ධන සැලැස්මේ දළ කෙටුම්පත ප්‍රධාන සැලසුම් කමිටුවට හා සංවර්ධන සැලසුම් අංශයට ඉදිරිපත් කිරීම.

**නීති ගත කිරීම හා ප්‍රකාශනය**

- නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සංවර්ධන සැලැස්ම ස්ථාපි කිරීම

*රූප සටහන 1.1 : සැලසුම් ක්‍රියාවලිය*

*මූලාශ්‍රය : සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

## 01 පරිච්ඡේදය සංවර්ධන සැලැස්මේ පසුබිම

### සැලසුම් ක්‍රියාවලිය

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සැලැස්මෙහි මුළු සැලසුම් ක්‍රියාවලිය රූප සටහන් අංක 1.1 හි දැක්වෙන පරිදි ප්‍රධාන අදියර තුනක් යටතේ විකාශනය විය.

පළමුවැන්න 'අප සිටින්නේ කොහේද?' (where are we now?) දෙවනුව 'අපට යාමට අවශ්‍ය කොතැනටද?' (where are we want to go?) සහ තුන්වැන්න 'අප එහි යන්නේ කෙසේද?' (How we go there?) යන්නයි.

ඒ අනුව 2017 මැයි මාසයේ දී සැලැස්මෙහි පළමු අදියර ලෙස පවතින තත්ත්වය සහ සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවය හඳුනාගැනීම ආරම්භ කරන ලදී. පසුබිම් අධ්‍යයනය තුළින් ක්ෂේත්‍ර නිරීක්ෂණය, ලේඛන ගත තොරතුරු, අන්තර්ජාලය, ගූගල් සිතියම්, චන්ද්‍රිකා ඡායාරූප ආදිය හරහා ඓතිහාසික, සමාජීය, ආර්ථික, පාරිසරික හා භෞතික සාධක මත පදනම්ව ප්‍රාථමික දත්ත සහ ද්විතීක මූලාශ්‍ර ආශ්‍රයෙන් දත්ත රැස්කරනු ලැබිය. විශේෂයෙන්ම කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව යන ආයතනයන් දත්ත ලබා ගැනීමෙහිලා ප්‍රමුඛ විය. මෙම සියලු දත්ත භූගෝලීය තොරතුරු පද්ධති (GIS) තුළ භූ දත්ත සමුදායක් ලෙස ගබඩා කර ඇත. රාමුගත කිරීම යටතේ, පසුබිම් අධ්‍යයනයන්හිදී රැස් කරගත් දත්ත සහ නිරීක්ෂණ භාවිතා කරමින් පැතිරුම් පත් (Excel), ගූගල් සිතියම්, භූගෝලීය තොරතුරු පද්ධති පදනම් කරගත් (GIS) සිතියම්කරණ යන මූලික විශ්ලේෂණයන් මත පදනම්ව ජාතික සහ කලාපීය සන්දර්භය තුළ සැලසුම් කලාපයෙහි පිහිටීම විශ්ලේෂණය කරන ලදී. එම කරුණු අධ්‍යයනයෙන් පසුව 2017 නොවැම්බර් මස 20 වන දින කිරිබත්ගොඩ රෝයල් පාර්ක් හෝටලයේදී මහජන පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගැනීමේ සැසිය පවත්වන ලදී. NVIVO තාක්ෂණය භාවිතයෙන් සියලු පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා විශ්ලේෂණය කරන ලදී. එම කර්තව්‍යය සංවර්ධන සැලසුම් අංශය සමඟ එක්ව සම්පූර්ණයෙන්ම මෙහෙයවනු ලැබිය. ගැටළු සහ විභවතා හඳුනා ගැනීම හා අර්ථ දැක්වීම යටතේ දත්ත විශ්ලේෂණය සඳහා කරනු ලැබූ NVIVO, සංවර්ධන පීඩනය, පරිසර සංවේදීතාව, ගණිතමය විශ්ලේෂණ, NDVI ආදී සියලු විශ්ලේෂණයන් මත පදනම්ව සංවර්ධන සැලසුම් මඟින් අවධානය යොමු කල යුතු ගැටළු හඳුනා ගැනුණි.

දෙවන අදියරය ලෙස 'අපට යාමට අවශ්‍ය කොතැනටද?' (where are we want to go?) යටතේ, හඳුනාගත් ගැටළු, විභවතාවයන් සහ සංවර්ධන ප්‍රවණතාවයන් නිසි ලෙස කළමනාකරණය කරමින් කාලීන නාගරික සංවර්ධනයක් ඇති කිරීම සඳහා දැක්ම හා අරමුණු ගොඩ නැංවීම සිදු විය. ඒ අනුව, දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන අරමුණු තුනක් ඇත. ඉන්පසු පියවර ලෙස සවිස්තරාත්මක විශ්ලේෂණ යටතේ එක් එක් අරමුණ සඳහා වෙන් වෙන් වශයෙන් SWOT විශ්ලේෂණයන් සිදු කරනු ලැබිණි. මෙසේ කරන ලද සවිස්තරාත්මක SWOT විශ්ලේෂණයන් පාදක කොට ගෙන කලාපය තුළ පවත්නා ශක්තීන් සහ අවස්ථාවන් දායක කරගනිමින් දුර්වලතා හා තර්ජන මගහරවා ගත හැකි පරිදි පරමාර්ථයන් සකස් කරන ලදී. මෙම සැලැසුම් ක්‍රියාවලිය තුළ පවත්නා සියලුම අවස්ථාවන් ර්ට ඉහත පියවරයන් සමඟ ඒකාබද්ධව ඉදිරියට ක්‍රියාත්මක වූවකි.

අවසාන අදියර යටතේ, සැලසුම් කිරීම හා උපායමාර්ග සැකසීමේ පියවර තුළ මාර්ග හා ප්‍රවාහන, ඓතිහාසික ආවේණිකත්වය, ආර්ථික, සමාජ, භෞතික සහ පරිසරය යන සියලු අංශ ඒකාබද්ධ වන පරිදි පරමාර්ථයන් උපක්‍රමශීලී භෞතික සැලසුම් වලට පරිවර්තනය කරනු ලැබිණි. එම උපායමාර්ග ප්‍රමුඛතා අනුපිලිවෙල අනුව ප්‍රායෝගික තත්ත්වය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. පසුව මෙම උපායමාර්ගයන් සැබෑ භූමිය තුළ ක්‍රියාත්මක කිරීම උදෙසා ඉහත සඳහන් සැලසුම්වලට අදාළ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ස්ථාපිත කරන ලදී.

අනුමැතිය ලබා ගැනීමේ අදියර යටතේ කෙටුම්පත් සංවර්ධන සැලැස්ම අදාල පළාත් පාලන බලධාරීන්ගේ හා මහජන අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි. මේ සඳහා 2018 ඔක්තොම්බර් 9 වන දින කැලණිය ප්‍රාදේශීය සභාවේ පැවති පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් මඟින් ප්‍රාදේශීය අධිකාරීන්හි අවසරය හා මහජන අදහස් ලබාගන්නා ලදි. ඒ තුළින් ලද අදහස් හා යෝජනා අනුව අදාළ වෙනස්කම් සිදු කර අවසන් සැලසුම් කෙටුම්පත අනුමැතිය උදෙසා ප්‍රධාන සැලසුම් කමිටුව සහ සංවර්ධන සැලසුම් අංශය වෙත ඉදිරිපත් කෙරිණි. ඉන් අනතුරුව කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 2019-2030 නීතිමය ක්‍රියාමාර්ගයන්ට අනුකූලව ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රකාශයට පත් කරන ලදි.

# 02

## පරිච්ඡේදය



# මූලික අධ්‍යයනය

**02 පරිච්ඡේදය**
**මූලික අධ්‍යයනය**

*අධ්‍යයන ප්‍රදේශය*

## 2.1. අධ්‍යයන ප්‍රදේශය

කැලණිය ප්‍රදේශය, බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ අධිකාරී පත්තුවේ කොළඹ – නුවර ප්‍රධාන මාර්ගය දෙපසට විහිදී යන ලෙස පිහිටා ඇති අතර, ශ්‍රී ලංකාවේ වාණිජමය අගනුවර වන කොළඹ නගරයේ සිට කි.මී. 12ක් පමණ දුරින් සහ පරිපාලනමය අගනුවර වන, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරයට කි.මී. 8ක් පමණ දුරින් පිහිටා ඇත. පරිපාලනමය වශයෙන් කැලණිය ප්‍රදේශය, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වන අතර එය කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පළාත් පාලන බල ප්‍රදේශයන් දෙකෙන් එකකි.




***රූප සටහන 2.1 :** අධ්‍යයන ප්‍රදේශය*
***මූලාශ්‍රය :** Openstreetmap,2017/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය,2017*

ඉහත 2.1 රූප සටහන මඟින් දැක්වෙන පරිදි කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, දකුණු දෙසින් සමනළ කන්දෙන් ආරම්භව කොළඹින් මහ මුහුදට එකතුවන කැලණි ගංගාවෙනුත්, ඇමුණුම 03 හි දැක්වෙන පරිදි නැගෙනහිර දෙසින් බියගම ප්‍රාදේශීය සභා බල සීමාවෙනුත්, උතුර දෙසින් මහර ප්‍රාදේශීය සභා බල සීමාවෙනුත්, වයඹ හා බස්නාහිර දෙසින් වත්තල නගර සභා බල සීමාවෙනුත්, නිරිත දෙසින් පෑලියගොඩ නගර සභා බල ප්‍රදේශයෙනුත් කැලණිය සංවර්ධන සැලැස්මට අදාල අධ්‍යයන ප්‍රදේශය මායිම්ව පවතී. මෙම සැලසුම් ප්‍රදේශය ග්‍රාම නිලධාරී කොට්ඨාශ 30 කින් සමන්විත වේ.

# 2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

ඓතිහාසික වශයෙන් කැලණිය ප්‍රදේශය, අනුරාධපුර හා පොලොන්නරුව යන පැරණි නගර අභිබවා යන දීර්ඝකාලීන ඉතිහාසයකට උරුමකම් කියන්නකි. මහාවංශ පුරාවෘතයට අනුව කැලණිය ක්‍රි.පූ. හයවන සියවස නෙක් අතීතය කරා දිව යයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ විසූ මුල් ජන ගෝත්‍රිකයන් කැලණිය සහ නාගදීපය යන ගංගා ආශ්‍රිත ප්‍රදේශය ජනාවාස කර ගනිමින් ජීවත් වූ බව කියවේ. එවකට මෙම ප්‍රදේශය නාග ගෝත්‍රික ප්‍රදේශයක් ලෙස පැවති අතර එය 'කැලණි නගර්' ලෙස හඳුන්වනු ලැබීය.

බුද්ධත්වයෙන් වසර අටකට පසුව යෙදුනු, ගෞතම බුදුරජාණන් වහන්සේගේ තෙවන හා අවසන් ලංකාගමනය හේතුවෙන් කැලණි පුරවරයට සුවිශාල ඓතිහාසික මෙන්ම, ආගමික වැදගත්කමක්ද හිමි විය. එවකට කැලණිය පාලනය ගෙන ගිය මණිඅක්ඛිත නා රජුගේ ආරාධනය පරිදි කැලණියට වැඩම කළ බුදුරජාණන් වහන්සේ චූලෝදර මහෝදර යන නාග සහෝදරයන් මැණික් පුටුවක් සඳහා කළ අරගලය සමථයකට පත්කිරීම හේතුවෙන් පසුකාලීනව එම මැණික් පුටුව පූජනීය වස්තුවක් ලෙස නිධන් කර, ස්ථූපයක් ඉදි කරන ලදී. මෙම ස්ථානය වර්තමාන කැලණිය පූජා භූමි ප්‍රදේශය ලෙස ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධියට පත්ව ඇති අතර ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් වන්දනා කරන ඉමහත් වැදගත්කමක් පවතින බෞද්ධ සිද්ධස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. ඊට අදාළ රූප සටහන් 2.2 මඟින් දක්වා ඇත. මෙම ඓතිහාසික ආගමික බලපෑමෙන් පසුව කැලණිය, රටේ සමස්ත බටහිර වෙරළ ආශ්‍රිත ප්‍රදේශය පාලනය කළ කැලණිතිස්ස රජුගේ රාජධානියක්ව පැවති බව පුරාවෘත කරුණු විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිවේ. පසුව රාජධානිය කෝට්ටේ ප්‍රදේශයට මාරු වීමත් සමඟ කැලණිය, කෝට්ටේ රාජධානියේ ගිම්හාන ස්ථානය ලෙස භාවිතා විය.



***රූප සටහන 2.2 :*** *බුදුරජාණන් වහන්සේ කැලණියට වැඩම කිරීම හා අතීත කැලණි විහාරය හා දාගැබ-1940*
***මූලාශ්‍රය :*** *ලංකාපුර වෙබ් අඩවිය, 2010*

මෙම ඓතිහාසික, ආගමික හා සංස්කෘතික බලපෑමත් සමඟ, කැලණිය විහාරස්ථානයෙන් ලැබී ඇති තොරතුරුවලට අනුව, දිනකට දේශීය හා විදේශීය වන්දනාකරුවන් 10000 – 20000 අතර ප්‍රමාණයක් කැලණි විහාරස්ථානය වෙත පැමිණෙන අතර පෝය දිනයන්හි දී 75000 – 100000 අතර බැතිමතුන් වන්දනාමාන කරන සිද්ධස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම කැලණි විහාරයේ ප්‍රධාන සංස්කෘතික මංගල්‍යයක් ලෙස සෑම වසරකම කැලණිය දුරුතු පෙරහැර පවත්වන අතර මෙය නැරඹීමට 200,000කට අධික පිරිසක් පැමිණෙයි. මේ අනුව පුරාවිද්‍යාත්මක සහ පූජනීය නගරයක් ලෙස කැලණිය ඉමහත් වැදගත්කමක් සහිත ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය.

කෙසේ වෙතත්, මෙම ප්‍රදේශය කොළඹට ඉතා ආසන්නව පිහිටා තිබුණද, එය අතීතයේ දී භෞතික බාධකයක් වන කැලණි ගඟෙන් ස්වභාවිකව ම වෙන්ව පැවතුනි. පසුව දහනව වන ශත වර්ෂයේ මුල් භාගය වන විට කොළඹ – නුවර ප්‍රධාන මාර්ගය, කැලණි පාලම හා ප්‍රධාන දුම්රිය මාර්ගය ඉදි වීමත් සමඟ කැලණිය, ගම්පහ දිස්ත්‍රික්කයේ පරිපාලන නගරය වන ගම්පහට නගරයට වඩා කොළඹ නගරය

## 02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

### සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

සමඟ සමීපව සම්බන්ධ විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂ 1948 පැට්‍රික් ඇබර්කොම්බි සැලැස්ම හා 1978 – කොළඹ මහනගර සැලැස්ම මඟින් කොළඹ දිස්ත්‍රික්කයට අමතරව ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන් ආවරණය කරන ලදී. මෙසේ මෙම ප්‍රදේශය ගම්පහ දිස්ත්‍රික්කයට අයත් වුවද, එහි භෞතික, සමාජීය, ආර්ථික හා ක්‍රියාකාරී සම්බන්ධතාවන් හේතුවෙන් කොළඹ නගරය සමඟ සමීපව සම්බන්ධ වී පවතී. පසුගිය කාලසීමාව තුළ සිට කොළඹ නගරය සම්බන්ධයෙන් කරනු ලබන නගර සැලසුම්වලට ද කැලණිය ප්‍රදේශය සම්බන්ධ කර තිබීම තුළින් එය තවදුරටත් තහවුරු කර ගත හැකිය. මෙම ප්‍රදේශයෙහි පිහිටීම අනුව කලාපය මධ්‍යයෙන් දිවෙන කොළඹ – මහනුවර ප්‍රධාන මාර්ගය (ඒ 1) හා හුණුපිටිය, වනවාසල සහ කැලණිය යන ආසන්න දුම්රිය පොළවල්වලින් සමන්විත ප්‍රධාන දුම්රිය මාර්ගයන් හේතුවෙන් පහසුවෙන් කලාපීය හා ජාතික මාර්ග ජාලය හා සම්බන්ධ වීමේ හැකියාවක් පවතී. වර්තමානය වන විට කලාපයට බටහිරින් හා නැගෙනහිරින් දිවෙන අධිවේගී මාර්ගයන්හි පෑලියගොඩ, කඩවත හා කඩුවෙල යන හුවමාරු මධ්‍යස්ථානයන්ට ආසන්නයෙන් පිහිටා තිබීම හේතුවෙන් දිවයිනේ බොහෝ ප්‍රදේශ සමඟ පහසුවෙන් සම්බන්ධ වීමේ අවස්ථාව සැලසේ. එය ඇමුණුම 03 මඟින් දැක්වේ. මෙසේ විවිධ ප්‍රවාහන මාධ්‍යයන්ගේ බලපෑම සෘජුවම ලැබීම හේතුකොට ගෙන මෙම ප්‍රදේශය, ජාතික හා කලාපීය වශයෙන් ඉහළ සම්බන්ධතාවයක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. මීට අමතරව, කිරිබත්ගොඩ – හුණුපිටිය සහ මාකොළ යන බී පන්තියේ මාර්ග ජාලය ඔස්සේ ද ප්‍රාදේශීය වශයෙන් කලාපයේ අනෙකුත් නගර සමඟ සමීපව සම්බන්ධ වීමත් එගොඩ කැලණිය සහ මෙගොඩ කැලණිය යා කෙරෙන සිරිමෙවන් කැලණි පාලම හරහා කිලෝ මීටර් 8 ක් පමණ දුරින් පරිපාලන අගනුවර වෙත ළඟා වීමටද පවතින හැකියාව හේතු කොට ගෙන පෑලියගොඩ, බියගම හා කටුනායක යන වෙළෙඳ කලාප වල මෙන්ම කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල රැකියාවන්හි නියුතු ජනතාවගේ නේවාසික අවශ්‍යතා සපුරාලන ප්‍රදේශයක් ලෙස කැලණිය හඳුනා ගත හැකිය.

මේ අනුව 2017 වසර වන විට කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු ජනගහනය ආසන්න වශයෙන් 137,339 කි. ව.කි.මී. 23.10 ක භූමි වපසරියක් තුළ විසිරී පැතිර ඇති මෙම ජනගහනය ගම්පහ දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයෙන් 5% කි. 2015 ජන සංගණන වාර්තා අනුව ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම ජන ඝනත්වය කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වාර්තා වී ඇත. ගම්පහ දිස්ත්‍රික්කයේ ජන ඝනත්වය ව.කි.මී. එකට පුද්ගලයින් 1700 ක් පමණ වන අතර, රූප සටහන 2.3 හා 2.4 මඟින් දැක්වෙන පරිදි ව.කි.මී. 23.1 ක් පමණ වන කැලණිය ප්‍රා.ලේ.කො. තුළ ව.කි.මී. එකට පුද්ගලයින් 5945 ක් පමණ වේ.




**රූප සටහන 2.3 :** *ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රා.ලේ.කො. අනුව ජන ඝනත්වය (2010-2015)*
**මූලාශ්‍රය :** *ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2015 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




*__රූප සටහන 2.4 :__ ගම්පහ දිස්ත්‍රික්කයේ ජන ඝනත්වය ප්‍රා.ලේ.කො. අනුව (2010-2015)*
*__මූලාශ්‍රය :__ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2015 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

නමුත් මෙහිදී සැලසුම් කලාපය ලෙස කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශය සලකා බැලෙන අතර 2017 වසර වන විට එහි ජනගහනය 111,300කි. එමෙන්ම මෙම ජනගහනය ව.කි.මී. 17.9ක් තුළ විසිරී ඇති අතර එහි ජන ඝනත්වය ව.කි.මී. එකකට පුද්ගලයින් 6,218කි. ඇමුණුම 04 හි දැක්වෙන පරිදි, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජන ඝනත්වය ග්‍රාම නිලධාරී කොට්ඨාශ අනුව සලකා බලන විට හුණුපිටිය, නාහේන, ඊරියවැටිය, වනවාසල ප්‍රදේශය ආශ්‍රිතව වැඩි ජන ඝනත්වයක් දැකිය හැකිය. එය හෙක්ටයාරයකට පුද්ගලයින් 80–100 අතර වේ. එමෙන්ම කොළඹ – නුවර මාර්ගය  ආසන්නයේ තිබෙන කිරිබත්ගොඩ, තලවතුහේන්පිට දකුණ, තලවතුහේන්පිට උතුර සහ වෙදමුල්ල යන ප්‍රදේශ වල ප්‍රධාන මාර්ගය පාදක කර ගනිමින් වාණිජ, කර්මාන්ත හා ගබඩා ව්‍යාප්ත වීම හේතුවෙන් ජනගහනය ඝන වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. මෙම ප්‍රදේශය තුළ විවිධ ජාතීන් මෙන්ම ආගමික විවිධත්වයකින් යුතු ජනගහනයක් වාසය කරන අතර ප්‍රධාන වශයෙන් බෞද්ධ ආගමික පදනමකින් යුතු ප්‍රදේශයකි. ඒ අනුව ජනගහනයෙන් 75% ක් බෞද්ධ, 19% ක් කතෝලික සහ 6% ක් වෙනත් ආගම් ලෙස වාර්තා වී ඇත.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන වේගය 2001 සිට 2012 දක්වා 0.75% ක් වන අතර ගම්පහ දිස්ත්‍රික්කය තුළ සමස්ත වර්ධන වේගය 1.05% ක් ලෙස ජන හා සංඛ්‍යාලේඛන වාර්තා ප්‍රකාශ කර ඇත. වර්තමාන කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සාමාන්‍ය ස්වාභාවික වර්ධන වේගය 0.45 කි. එසේම වගුව 2.1 හි දැක්වෙන පරිදි 1981 සිට 2016 දක්වා ජනගහන වර්ධන වේගය වැඩිවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරයි. ස්වාභාවික වර්ධන අනුපාතය සලකා බැලීමේදී 2030 වසර වන විට සැලසුම් කලාපය තුළ මුළු ජනගහනය 117000 ක් පමණ විය හැකිය.

| වර්ෂය | සාමාන්‍ය ස්වභාවික වර්ධන වේගය | ජනගහනය |
|---|---|---|
| 1981 - 2001 | 0.23 | 104544 |
| 2011 | 0.45 | 107853 |
| 2016 | 0.45 | 109603 |
| 2030 | 0.45 | 117135 |

*වගුව 2.1 ජනගහන වර්ධනය - කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*
*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2011 සහ සම්පත් පැතිකඩ කැලණිය ප්‍රා.ලේ.කො. 2016 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙසේ ඉහළ ජන සනත්වයක් මෙන්ම ජනගහන වර්ධනයේ ප්‍රවණතාවයක් පවතින ප්‍රදේශයක් ලෙස 2017 වන විට මුළු භූමි ප්‍රමාණයෙන් 58% ක් ම නේවාසික භූමි පරිහරණය සඳහා වෙන්ව පවතින ආකාරය ඇමුණුම 05 මඟින් විශ්ලේෂණය කෙරේ. ඉහත සඳහන් පරිදි මෙහි පවතින ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ මාර්ග සම්බන්ධතාවය හා ජීවත්වීමට යෝග්‍ය පාරිසරික තත්ත්වයන් පැවතීම හේතුවෙන් කොළඹ හා ඒ ආශ්‍රිත තදාසන්න ප්‍රදේශ වල රැකියාවල නියුතු පුද්ගලයන් මෙන්ම කැලණිය උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගෙන බොහෝ දෙනෙක් නේවාසික අවශ්‍යතාවන් උදෙසා මෙම ප්‍රදේශයට සංක්‍රමණය වෙමින් පවතී. ඒ අනුව වත්මන් සැලසුම් කලාපය තුළ  නිවාස සනත්වය ව.කි.මී. එකකට නිවාස ඒකක 1463 කි.

| | | |
|---|---|---|
| **කැලණිය ප්‍රා.ලේ. කොට්ඨාශය** | නිවාස ඒකක ගණන | 33404 |
| | නිවාස සනත්වය | ව.කි.මී. එකකට නිවාස ඒකක 1876 |
| **කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය** | නිවාස ඒකක ගණන | 26339 |
| | නිවාස සනත්වය | ව.කි.මී. එකකට නිවාස ඒකක 1463 |

*වගුව 2. 2 නිවාස ඒකක සහ නිවාස සනත්වය - කැලණිය (2016)*
*මූලාශ්‍රය: සම්පත් පැතිකඩ කැලණිය ප්‍රා.ලේ. කොට්ඨාශය - 2016 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

වගුව 2. 2 අනුව, සාමාන්‍ය නිවාස සනත්වය ව.කි.මී. එකකට නිවාස ඒකක 1463 ක් ලෙස පැවතියද ඇමුණුම 06 හි සඳහන් කෙරෙන පරිදි නාහේන, හුණුපිටිය, ඊරියවැටිය සහ සිංහාරමුල්ල යන ග්‍රා. නි. වසම් වල නිවාස සනත්වය ව.කි.මී. එකකට නිවාස ඒකක 2000 කට වඩා වැඩි සනත්වයක් වාර්තා කරයි. කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්තා වලට අනුව මුළු නිවාස ඒකක වලින් 8% ක් තාවකාලික හා අර්ධ ස්ථිර නිවාස ලෙස වාර්තා වේ. පිලපිටිය, නිලමේගේ වත්ත, මාහේනේ, කැලණි ගඟ උතුරු බැම්ම සහ දුම්රිය රක්ෂිත කලාපය යන ප්‍රදේශ වල මෙම තාවකාලික නිවාස වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත.

ජාතික මට්ටමේ සැලසුම්මය මැදිහත්වීම් තුළින් පවා ප්‍රදේශයේ ජනගහනය තව දුරටත් ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමුව පවතී. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සැලසුම් කෙටුම්පතට අනුව කැලණිය ප්‍රදේශය, එහි හඳුනාගෙන ඇති ප්‍රධාන ආර්ථික තීරයන් හතර අතරින් නැගෙනහිර – බටහිර ආර්ථික තීරයට අයත් වන අතර 2050 වසර වනවිට එහි ජනගහනය 20% – 25% දක්වා වර්ධනය කිරීමට යෝජනා කර තිබේ. එසේම ඇමුණුම 07 හි පෙන්නුම් කෙරෙන පරිදි කැලණිය ප්‍රා. ලේ. කො. සඳහා යෝජිත ජන සනත්වය ව. කි. මී. එකකට පුද්ගලයන් 6000 – 10000 අතර විය යුතු බව

යෝජනා කර ඇත. මෙය ප්‍රදේශයේ ඉදිරි ජනගහන වර්ධනය කෙරෙහි සෘජු බලපෑමක් එල්ල විය හැකි තත්ත්වයකි. එමෙන්ම කලාපීය සැලසුම්මය මැදිහත්වීම් වශයෙන් ඇමුණුම 08 හි දැක්වෙන 2030 බස්නාහිර කලාපීය සැලැස්මට අනුව පිටත වටරවුම් මාර්ගය ඇතුළත ප්‍රදේශය අධි ඝනත්ව කලාපය ලෙස හඳුනාගෙන ඇත.

ප්‍රදේශයේ ආර්ථික ක්‍රියාකාරිත්වය සලකා බැලූ විට, කැලණිය ප්‍රමුඛතම වාණිජ හා සේවා මධ්‍යස්ථානයක් ලෙස හඳුනා ගත හැකිය. වර්ෂ 1998 මහ කොළඹ ව්‍යුහ සැලැස්මට (CMRSP) අනුව කැලණිය, බියගම වර්ධක ප්‍රදේශයට අයත් වන අතර කැලණියේ ප්‍රධාන නගරය වන කිරිබත්ගොඩ නගරය කලාපය තුළ 4 වන ශ්‍රේණියේ නගරයක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව යෝජිත නාගරික මධ්‍යස්ථානවල ධූරාවලිය ඇමුණුම 09 හි දැක්වේ. එමෙන්ම කිරිබත්ගොඩ නාගරික සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත විය.




*රූප සටහන 2.5 : බස්නාහිර කලාපයේ වෙළෙඳ මධ්‍යස්ථාන*
*මූලාශ්‍රය : Lang LaSalle වාර්තාව, 2016*

**02 පරිච්ඡේදය**
**මූලික අධ්‍යයනය**

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

ඇමුණුම 10 හි සඳහන් පරිදි ගම්පහ දිස්ත්‍රික්කයේ නාගරික ධුරාවලිය අනුව කිරිබත්ගොඩ, දෙවන ගණයේ නගරයක් ලෙස හඳුනාගෙන ඇත. මාර්ග සම්බන්ධතාවය සලකා බැලීමේදී කිරිබත්ගොඩ නගරය ප්‍රාදේශීය මට්ටමින් 1 වන ගණයේ නගරයක් ලෙස ඇමුණුම 11 මඟින් විශ්ලේෂණය කෙරේ. එම මැදිහත්වීම් මත වර්තමානයේ කිරිබත්ගොඩ නගරය ප්‍රාදේශීය හා ජාතික වශයෙන් ප්‍රසිද්ධියක් උසුලන සහ දිවා රාත්‍රී දෙකෙහි ම ක්‍රියාත්මක වන ප්‍රධාන පෙලේ නිමි ඇඳුම් සාප්පු සංකීර්ණයන්ගෙන් සමන්විත ප්‍රධාන වාණිජ නාගරික මධ්‍යස්ථානයක් වශයෙන් හඳුනා ගත හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස රූප සටහන 2.5 හි සඳහන් පරිදි 2016 වසරේදී කිරිබත්ගොඩ නගරය බස්නාහිර කලාපය තුළ නැගී එන වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. මීට අමතරව හුණුපිටිය, ටයර් හන්දිය, කැලණිය විශ්ව විද්‍යාලය අවට, මාකොළ පාර සහ කැලණිය පූජා භූමි ප්‍රදේශය අවට ද ප්‍රාදේශීය වශයෙන් වාණිජ කටයුතු ව්‍යාප්තව ඇති අතර එය ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 5% ක් පමණ වේ.

2004 බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්ම (CESMA) අනුව, වෙනස් වූ ආර්ථික මැදිහත්වීමක් වෙත යොමු වූ මෙම ප්‍රදේශය පෑලියගොඩ කාර්මික සංවර්ධනය සමඟ ගබඩා හා කර්මාන්ත සංවර්ධනයට යොමු විය. නවද කොළඹ වරාය හා පෑලියගොඩ අධිවේගී පිවිසුම් මාර්ගය පදනම්ව පිහිටා ඇති කර්මාන්ත ශාලා සහ ගබඩා, ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික අංශයක් බවට පත් වී ඇත. ඇමුණුම 12 හි දැක්වෙන පරිදි, ගම්පහ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රා.ලේ. කොට්ඨාශ අතුරින් ව.කි.මී. 23 ක භූමි වපසරියක් සහිත කැලණිය ප්‍රා.ලේ. කොට්ඨාශය තුළ සැලකිය යුතු කර්මාන්ත ප්‍රමාණයක් ව්‍යාප්තව ඇති අතර 400 කට ආසන්න යකඩ හා කාර්මික උපාංග නිෂ්පාදන කර්මාන්තයන් ව්‍යාප්තව ඇත. මේ වන විට කැලණි ටයර් / කැලණි කේබල් / අක්බාර් බ්‍රදර්ස් වැනි මහා පරිමාණ කර්මාන්ත මෙන්ම පොලිතින් / පිත්තල / ආහාර නිෂ්පාදනය වැනි සුළු පරිමාණ කර්මාන්ත ශාලා පුළුල් පරාසයක ව්‍යාප්තව ඇත. මුළු ඉඩම් ප්‍රමාණයෙන් 6% ක් කර්මාන්තවලින් සමන්විත වන අතර සමස්ත ගම්පහ ප්‍රදේශයේ කර්මාන්ත ව්‍යාප්තියට අනුව, කැලණිය ප්‍රදේශයේ කර්මාන්ත ව්‍යාප්තිය මධ්‍යම ප්‍රමාණයෙන් සිදුවී ඇත. මෙහි කර්මාන්ත 250 ක් පමණ පවතින අතර ඒවා ලෝහ නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ උපකරණ කර්මාන්ත ලෙස දැක්විය හැක. මෙම අංශය ප්‍රාදේශීය මෙන්ම ජාතික ආර්ථික වර්ධනය සඳහා ද දායකත්වයක් සපයයි. නමුත් කර්මාන්ත හා ගබඩා සඳහා පවතින අධික ඉල්ලුම හේතුවෙන් ප්‍රදේශයේ බොහෝමයක් පහත් බිම් කේන්ද්‍ර කොටගෙන කර්මාන්ත හා ගබඩා ව්‍යාප්ත වන අතර මේ වන විට කැලණිය පූජා භූමි ප්‍රදේශය ආසන්නය දක්වාම අක්‍රමවත් ලෙස සංවේදී ප්‍රදේශ ආක්‍රමණය කරමින් කර්මාන්ත හා ගබඩා විහිදී යයි.

වර්තමානයේ කර්මාන්ත සංකේන්ද්‍රණයට යොමුව ඇති කැලණිය ප්‍රදේශය ඈත අතීතයේ සිටම දේශීය කර්මාන්ත වශයෙන් පරිසර හිතකාමී මැටි කර්මාන්තය පැවති ප්‍රදේශයකි. දැනට ජාතික ශිල්ප සභාව සතුව පවතින ගල්බොරැල්ල මැටි කර්මාන්ත ශාලාවෙන් ලබාගත් තොරතුරු වලට අනුව කැලණිය, ගල්බොරැල්ල හා සිංහාරමුල්ල ආදී ප්‍රදේශ කේන්ද්‍ර කොටගෙන 1925 වසරේ දී මැටි කර්මාන්ත ශාලාවක් ලෙස ස්ථාපිත කර ඇත. එය ශ්‍රී ලංකාවේ ජාතික ශිල්ප සභාව සතු මධ්‍යස්ථාන 200 න් එකක් වන අතර ලංකාවේ පළමු මැටි පර්යේෂණ ආයතනය ද මෙය වේ. අතීතයේදී කැලණිය පූජා භූමි ප්‍රදේශය වෙළෙඳ මධ්‍යස්ථානය කොට ගෙන ඉතා ඉහළ මට්ටමින් ගම්වාසීන් විසින් පවත්වාගෙන ගිය මැටි කර්මාන්තය අද වන විට ඝීන වී ගොස් ඇත. දැනට ගම්වාසීන් 35ක් පමණ ගෘහ කර්මාන්තයක් වශයෙන් මෙම ආයතනය හා සම්බන්ධව නිෂ්පාදනයන් කරගෙන යනු ලබයි. මෙසේ ප්‍රදේශයේ කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින රැකියා අවස්ථාවන් තුළින් ද ආර්ථික ස්ථාවරත්වය සඳහා යම් දායකත්වයක් ලබා දෙයි.

ඇමුණුම 13 හි දැක්වෙන පරිදි, මෙම ප්‍රදේශයේ රැකියා අනුපාතය 94% ක් වන අතර සමස්ත රැකියා වලින් 58%ක් පුද්ගලික අංශය සමඟ ඒකාබද්ධ වී ඇත. ඒ සඳහා කොළඹ මධ්‍යම ව්‍යාපාර ප්‍රදේශය සහ රැකියා උත්පාදනය කරන්නා වූ අනෙක් ප්‍රදේශ වන බියගම නිදහස් වෙළඳ කලාපය, සපුගස්කන්ද, කෙරවලපිටිය සහ කටුනායක අපනයන වෙළඳ කලාප හේතු වේ.

ප්‍රදේශයේ සමාජීය හා භෞතික යටිතල පහසුකම් යටතේ කැලණිය විශ්ව විද්‍යාලය විශේෂත්වයක් උසුලයි. වර්ෂ 1978 කැලණිය විශ්ව විද්‍යාලය ආරම්භයත් සමඟ මෙම ප්‍රදේශය ජාතික අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපීපෙනෙන වෙනසක් පෙන්වයි. ඊට අමතරව මෙහි , ද්විතීක පාසල් 10 ක් සහ ප්‍රාථමික පාසල් 9 ක් පවතින අතර කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිසුන් 23509 දෙනෙක් එම පාසල් වල අධ්‍යාපනය ලබයි.

මෙම පරිච්ඡේදයේ ඉදිරිපත් කරන ලද පසුබිම් තොරතුරුවලට අනුව, අතීතයේ බුදුරජාණන් වහන්සේගේ වැඩමවීමත් සමඟ කැලණිය බෞද්ධාගමික වශයෙන් ඇගයීමක් උසුලන නගරයක් වුවද රැකියා සොයා ලංකාවේ නන්දෙසින් කොළඹ නගරයට පැමිණෙන අධික ජනගහනයට වාසස්ථාන සපයන ප්‍රදේශයක් බවට පරිවර්තනය වීම හේතුවෙන් ආගමික හා පූජනීය වටිනාකම් ඉස්මතුවීම කෙරෙහි තර්ජනයක්ව ඇත. ඒ සමඟම කිරිබත්ගොඩ නගරය සේවා සපයන ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් වශයෙන් පවතින අතර වර්තමානයේ ප්‍රදේශය පුරා පහත්බිම් ගොඩ-කරමින් කර්මාන්ත හා ගබඩා ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවයක් පවතී.

භූගෝලීය වශයෙන් කැලණිය, පහතරට තෙත් කලාපයේ නිරිතදිග තැනිතලාවට අයත් වේ. ප්‍රදේශයේ දකුණු මායිමෙන් ගලා බසින කැලණි ගඟ ප්‍රධාන ජල ප්‍රභවය වන අතර කි. මී. 6ක ගං මුහුණතක් කැලණිය ප්‍රා. ස. බල ප්‍රදේශයට අයත් වේ. ඒ අනුව ඒ ආශ්‍රිත ප්‍රදේශය කැලණි ගංගා ද්‍රෝණියට අයත් වේ. ශ්‍රී ලංකාවේ බටහිර වෙරළාශ්‍රිත ප්‍රදේශයට ඉතා ආසන්නයෙන් පිහිටා ඇති කැලණිය ප්‍රදේශය විශාල වගුරු බිම්වලින් යුතු තැනිතලා ප්‍රදේශයක් ලෙස පවතී. ඇමුණුම 14 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ සමෝච්ච රේඛීය පිහිටීම සලකා බැලීමේදී, මුළු භූමි ප්‍රමාණයෙන් 20%ක්ම මුහුදු මට්ටමට වඩා අඩු උසකින් පිහිටා ඇති අතර අනෙකුත් ප්‍රදේශ මුහුදු මට්ටමේ සිට උස අඩි 7 සිට 15 අතර පවතී.

මෙසේ මුහුදු මට්ටමට ආසන්නව උච්චාවචනය වන ප්‍රදේශයක් ලෙස, මෙහි මුළු භූමි ප්‍රමාණයෙන් 15% ක බිම් ප්‍රමාණයක් තෙත්බිම්වලින් සමන්විත වේ. එහි ව්‍යාප්තිය ඇමුණුම 15 මඟින් විශ්ලේෂණය කරයි. කලාපයේ මතුපිට පස පිළිබඳ සැලකීමේදී රතු කහ පොඩ්සොලික් පස, ගංගා ද්‍රෝණි ආශ්‍රිත ඇලුවියල් පස ප්‍රධාන වේ. මි.මී. 2219ක පමණ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලබන මෙම ප්‍රදේශය නිරිතදිග මෝසමෙන් සහ අන්තර් මෝසම් වර්ෂාව මඟින් වැසි ලබයි. මෙහි සාමාන්‍ය උෂ්ණත්වය 28 ° C පමණ වුවද වර්තමානයේ පවතින ඉහළ නාගරීකරණයත් සමඟ එය ඉහළ යාමේ අවදානමක් පවතී. සියලු පාරිසරික සාධකයන් සලකා බැලීමේදී, මෙම ප්‍රදේශය ඉහළ හා මධ්‍යම ප්‍රමාණයේ පාරිසරික සංවේදීතාවයක් සහිත ප්‍රදේශයක් ලෙස ඇමුණුම 16 මඟින් දැක්වෙන පාරිසරික සංවේදීතා විශ්ලේෂණයට අනුව හඳුනා ගත හැකිය.

සියලුම ස්වභාවික භෞතික පරිසර ලක්ෂණයන්ට අයත් 15% ක තෙත්බිම් හා 2% ක ජලජ ප්‍රදේශයන් හැරුණු පසු මුළු භූමි ප්‍රමාණයෙන් 83%ක්ම සංවර්ධනය කළ හැකි ඉඩම් වේ. වර්තමානයේ මෙම 83%ක භූමි ප්‍රදේශය නේවාසික, වාණිජ, කර්මාන්ත, අධ්‍යාපන, ආගමික සහ විවෘත භූමි යන භූමි පරිහරණයන්ගේ මිශ්‍රණයක් වශයෙන් පවතී. ඒ අනුව ඇමුණුම 05 හි දැක්වෙන පරිදි, 2017 වසර වන විටත් ප්‍රදේශයේ ප්‍රධාන භූමි පරිහරණය ලෙස මුළු භූමි ප්‍රමාණයෙන් 58% ක් ම ආවරණය වන්නේ නේවාසික භූමි වලිනි.

## 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

සංවර්ධන සැලැස්මෙහි සැලසුම් සීමාව නිර්ණය කිරීම කෙරෙහි භෞතික හා භූගෝලීය සීමාවන්, පරිපාලනමය සීමාවන් සහ ක්‍රියාකාරී සීමාවන්වල ස්වභාවයන් සලකා බලනු ලැබිය.

ක්‍රියාකාරී සීමාවන්වල ස්වභාවය සලකා බැලීමේදී, ප්‍රාදේශීය හා කලාපීය වශයෙන් කිරිබත්ගොඩ වාණිජ හා සේවාවන් සපයන ප්‍රධාන නගර කේන්ද්‍රයක් ලෙස ක්‍රියාත්මක වේ. ඇමුණුම 17 මඟින් විශ්ලේෂණය කෙරෙන ආකාරයට සංවර්ධන පීඩනය මෙන්ම ඇමුණුම 18 මඟින් විශ්ලේෂණය කෙරෙන ආකාරයට මාර්ග සම්බන්ධතාවය පදනම් වන ක්‍රියාකාරී සීමාවන් ද කිරිබත්ගොඩ, පැලියගොඩ සහ කඩවත යන නගර කේන්ද්‍රයන් වටා ඒකරාශි වීමක් දැකිය හැකිය. එහි දී කිරිබත්ගොඩ නගරය වෙළෙඳ නගරයක් ලෙස කලාපීය හා ජාතික වශයෙන් ප්‍රසිද්ධියට පත් වුවද සැලසුම් සීමාව තීරණය කිරීමේදී සංවර්ධන පීඩනය හා මාර්ග සම්බන්ධතාවය පදනම් වන ක්‍රියාකාරී ප්‍රදේශය සැලකිල්ලට ගනිමින් එහි ව්‍යාප්තිය සලකා බලනු ලබයි. ඒ අනුව කිරිබත්ගොඩ අධි සංවර්ධන පීඩනයක් සහිත ප්‍රදේශයක් වන අතර හුණුපිටිය, මාකොල සහ කැලණිය දක්වා එය විහිදී යයි. එසේම එය පැලියගොඩ සහ කඩවත ප්‍රදේශවල වෙන් වෙන් වශයෙන් කේන්ද්‍ර ගතව ඇත. එමනිසා කිරිබත්ගොඩ හා ඒ ආසන්න ප්‍රදේශය ප්‍රායෝගික වශයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නාගරික සේවා සපයන මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. නමුත් මෙම ප්‍රදේශය දෙපසින් ජාතික හා කලාපීය මාර්ග ජාලය හා සෘජුව සම්බන්ධ විය හැකි කඩවත හා පැලියගොඩ අධිවේගී මාර්ග හුවමාරු මධ්‍යස්ථානයන්ට ආසන්නව පිහිටා තිබීම හේතු කොට ගෙන තවදුරටත් ආසන්න නගර සමඟ ක්‍රියාකාරී වශයෙන් සම්බන්ධ වේ.

භූගෝලීය සහ පාරිසරික ලක්ෂණ විමසා බලන විට, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, දකුණු දෙසින් කැලණි ගංගාවෙන් ද, වයඹ දෙසින් කළු ඇළ මඟින් ද ප්‍රධාන භෞතික හා පාරිසරික ලක්ෂණයන් ලෙස සීමාවී පවතී. පරිපාලනමය වශයෙන්, වර්ෂ 1977 ට පෙර කැලණිය යනු පැලියගොඩ, කැලණිය සහ බියගම යන ප්‍රදේශයන් ඒකාබද්ධව පැවති එක් පරිපාලන කොට්ඨාශයකි. එහෙත් බියගම අපනයන සැකසුම් කලාපය පිහිටුවීමෙන් පසු පැවති අවකාශමය දුරස්ථ බව යන ගැටළු තත්ත්වයන් උද්ගත කළ බැවින්, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වෙනත් පරිපාලන ප්‍රදේශයක් ලෙස වෙන් කිරීමත් සමඟ පැලියගොඩ නගර සභාව සහ කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ඇතුළත් විය. ඒ අනුව 1987.05.12 දින අංක 453/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය යටතේ ග්‍රා.නි. වසම් 30 කි න් සමන්විත ව.කි.මී. 17.9 ක් පමණ වන ප්‍රදේශය කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව 2.1 සිතියමේ දැක්වෙන පරිදි භෞතික වශයෙන් දකුණු හා වයඹ මායිම් පිළිවෙලින් කැලණි ගඟ සහ කළු ඇළෙන් ද පරිපාලනමය වශයෙන් උතුරින් හා ඊසාන දෙසින් මහර ප්‍රා.ස.බල සීමාවෙන්ද, නැගෙනහිරින් බියගම ප්‍රා.ස. බල සීමාවෙන්ද සීමාවී ඇති ව.කි. 17.9 ක භූමි ප්‍රමාණයක් සහිත ග්‍රා.නි. වසම් 30 කි න් සමන් විත වන කැලණිය ප්‍රාදේශීය සභා බල සීමාව සැලසුම් ප්‍රදේශය ලෙස හඳුනා ගෙන ඇත. එය ගෝලීය ස්ථානගත කිරීම අනුව, උතුරු අක්ෂාංශ 60 54'– 60 59' අතර හා නැගෙනහිර දේශාංශ 790 53'– 790 57' අතර පිහිටා ඇත.



***සිතියම 2.1 :*** *සැලසුම් ප්‍රදේශය*

# 03
## පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

**03 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය**

Declining of the 'Sense of Place'

කැලණිය, කොළඹ වාණිජ නගරයේ හා අවට ප්‍රදේශය තුළ පවතින කාලීන සංවර්ධනයේ බලපෑමත් සමඟ දැඩි ලෙස සංවර්ධනය වෙමින් පවතින ප්‍රදේශයකි. කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩිම ජන ඝනත්වයක් වාර්තා කරන ප්‍රදේශය ලෙස හඳුනා ගත හැකි අතර එය ආසන්න වශයෙන් ව.කි. මී. ට පුද්ගලයන් 5900 ක් පමණ වේ. කොළඹ, බියගම, පෑලියගොඩ සහ කටුනායක යන ප්‍රධාන රැකියා මධ්‍යස්ථාන වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි ප්‍රදේශයක් වීම හේතු කොටගෙන මෙම ප්‍රදේශය රැකියාවල නියුතු විශාල ජනතාවකගේ නේවාසික ගමනාන්තයක් වී ඇත. කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය සහ පිටත වටරවුම් අධිවේගී මාර්ග හරහා කටුනායක, දකුණු සහ මධ්‍යම ප්‍රදේශවලට සම්බන්ධ වන පෑලියගොඩ සහ කඩවත හුවමාරු මධ්‍යස්ථාන ස්ථානගත කිරීමත් සමඟ කැලණිය නාගරික ප්‍රදේශයේ තීව්‍රතාවය හා සංකීර්ණතාවය වැඩිවෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, 2017.12.11 වන දින සිට අංක 2049/11 ගැසට් නිවේදනය යටතේ "මහා කොළඹ සංවර්ධන කලාපයේ හර ප්‍රදේශයට" ට අයත් වේ.

මෙම සංකීර්ණත්වය යටතේ මෙම ප්‍රදේශය තුළ සංවර්ධනය උදෙසා දායක කරගත හැකි සැඟවුනු විභවතාවයන් ද පවතී. ඒ අනුව මෙම විභවතාවයන් නිසි ලෙස හසුරුවා ගනිමින් දැනට පවතින හා උද්ගත විය හැකි ගැටළු මඟහරවා ගැනීම සඳහා සංවර්ධන සැලසුමක අවශ්‍යතාවක් පවතී. මෙම කැලණිය සංවර්ධන සැලැස්මට අදාළ පාර්ශවකරුවන්ගේ අදහස් ලබා ගැනීමේ වැඩමුළුවේදී ප්‍රදේශයේ පවතින ගැටළු හා යෝජනා දීර්ඝව සාකච්ඡා කෙරුණි. එහිදී හඳුනාගත් ගැටළු හා යෝජනා ලැයිස්තුව ඇමුණුම 19 මඟින් දැක්වේ. අනතුරුව එම අදහස් හා මූලික අධ්‍යයනයන් මත පදනම්ව, මෙම ප්‍රදේශයට සංවර්ධන සැලැස්මක් සකස් කිරීම කෙරෙහි පවතින අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර ඒවා පහත පරිදි විශ්ලේෂණය කල හැකිය.

## 3.1. කැලණියේ ආගමික, සංස්කෘතික හා ඓතිහාසික වැදගත්කමත් සමඟ ගොඩනැගුනු අනන්‍යතාව හෙවත් එහි ස්ථානීය හැඟීම වියැකී යාම (Declining of the 'Sense of Place')

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය පරිච්ඡේදය තුළ මනාව ගොනුකර ඇති ඓතිහාසික ක්‍රියාවලියට අනුව කැලණිය යනු අනුරාධපුර, පොලොන්නරුව යන පැරණි නගර අභිබවා යන ඉතිහාසයක් සහිත ආර්ය ජනාවාසයකි. බුදුරජාණන් වහන්සේගේ තෙවන ලංකාගමනයත් සමඟ ඓතිහාසික, ආගමික හා සංස්කෘතිකමය වශයෙන් මුළුමහත් ශ්‍රී ලංකාවෙන්ම සුවිශේෂී වටිනාකමක් මෙන්ම අනන්‍යතාවයක් ගොඩනඟාගත් ස්ථානයකි. එසේ ම ප්‍රධාන සංස්කෘතික අංගයක් වශයෙන් කැලණි විහාරස්ථානයේ වාර්ෂිකව පවත්වනු ලබන දුරුතු පෙරහැර මංගල්‍යය එහි සංස්කෘතික අනන්‍යතාවය විදහා දක්වයි.

සැලසුම්මය දෘෂ්ඨි කෝණයට අනුව, ස්ථානීය බැඳීම ('Place Attachment'/ 'Place Identity'/ 'Sense of Place') මඟින් යම් ස්ථානයක ගුණාත්මකභාවය විස්තර කෙරෙන අතර එම ස්ථානය කෙරෙහි පවතින පුද්ගලානුබද්ධ සබඳතාවය රඳා පවත්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ මහනුවර, අනුරාධපුරය, කතරගම, මහියංගනය, නාගදීපය සහ රූප සටහන 3.1, 3.2 මඟින් දැක්වෙන පරිදි මෙහි සඳහන් කෙරෙන කැලණිය වැනි ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වටිනාකමක් සහිත ස්ථානයන් සිහිපත් කර බැලීමේදී, එම එක් එක් ස්ථානයන්ට අනුකූලව එහි කැපී පෙනෙන ලක්ෂණ සමඟ ශුද්ධ වූ හැඟීමක් ඇති වේ. නමුත් කැලණිය පූජා භූමියට පිවිසෙන විට, මෙම පූජනීය ස්ථානය අනෙක් පූජනීය ස්ථානයන්ට සාපේක්ෂව පාරිශුද්ධ අර්ථයක් ගෙන නොදේ. එනම් කැලණිය සමස්ත ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන පූජනීය, ආගමික හා ඓතිහාසික ස්ථානයක් වුවද එම ප්‍රදේශය නාගරීකරණයත් සමඟ සංකීර්ණ වීම හේතුවෙන් හා ඒ වටා නිර්මාණය වී ඇති භෞතික සැකැස්මේ විෂමතාවය හේතුවෙන් එය පූජනීය නගරයක් යන හැඟීම ඇතිවීම කෙරෙහි බාධා පමුණුවයි.



***රූප සටහන 3.1 :*** *පූජනීය කැලණිය විහාරය*
***මූලාශ්‍රය :*** *Dailynews වෙබ් අඩවිය, 2008*



***රූප සටහන 3.2 :*** *කැලණිය පෙරහැර මංගල්‍යය*
***මූලාශ්‍රය :*** *Sri Lanka News වෙබ් අඩවිය, 2016*

කැලණිය පූජා භූමිය බුදුන් වහන්සේගේ ස්පර්ශය ලද අති පූජනීය ස්ථානයක් වුවද, මහනුවර, අනුරාධපුර සහ කතරගම වැනි පූජනීය ස්ථාන නැරඹීමේදී දැනෙන පූජනීය හැඟීම දැනවීමට තරම්වත් මෙම ප්‍රදේශයේ භෞතික සැකැස්ම සමත් නොවේ. පහත රූප සටහන 3.3 මඟින් දැක්වෙන පරිදි, යම් ස්ථානයක භෞතික සැකැස්ම අනුව බලපැවැත්වෙන දෘෂ්‍ය ක්‍රියාකාරීත්වය (Visual performance) කෙරෙහි, එම ස්ථානයට සම්බන්ධව පවතින, පාරගම්‍යතාව (Permeability), සංඝටක (Components), සැරසිලි / වර්ණ (Decorations/ Colours), ආකෘතිය (Texture), Imageability, Legibility යන අංග වල පවතින ගුණාත්මක බව හා යෝග්‍යතාවය සෘජුවම බල පැවැත්වේ. නමුත් කැලණි ප්‍රදේශය වර්තමානය වන විට සැලසුම් සහගත නොවන පරිදි ජනාකීර්ණ ප්‍රදේශයක් බවට පත්වීම හේතු කොටගෙන ‘කැලණිය පූජා භූමිය’ යන ස්ථානීය හැඟීම ශක්තිමත් කිරීමට උපකාර වන භෞතික ගති ලක්ෂණ අවම වෙමින් පවතී. මෙය කැලණිය පූජා භූමි කලාපය ඇතුළුව අවට කි.මී 1 ක් පමණ දුරට ආවරණය වන භූමි ප්‍රමාණය සලකා බැලීමේදී මනාව පැහැදිලි වේ. ඒ අවට ප්‍රදේශයේ භූමි පරිහරණයෙන් 10% ක්ම කර්මාන්ත  හා ගබඩා, ජල මූලාශ්‍රයන්ද  ආවරණය වන පරිදි පහත් බිම්වල ව්‍යාප්තව පවතී. එසේම පූජා භූමිය ආසන්න වීදිවල දර්ශනය වන නාම පුවරු හා ගොඩනැගිලි වර්ණයන් හා ජ්‍යාමිතික හැඩයන් පූජා භූමි කලාපයේ පූජනීය හා ශාන්ත භාවය කෙරෙහි බලපෑමක් එල්ල කරයි.

ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද පූජා භූමි ප්‍රදේශයන් පිළිබඳව සැලකීමේදී යම් ජල මූලාශ්‍රයක් සමඟ සංස්කෘතික වශයෙන් සම්බන්ධව පවතී. උදාහරණ ලෙස ලංකාවේ මැණික් ගඟ සමඟ බද්ධ වී පවතින කතරගම, නුවර වැව සමඟ බද්ධව පවතින මහනුවර පූජා භූමි ප්‍රදේශයත් කළු ගඟ සමඟ බද්ධව පවතින කළුතර පූජා භූමියත් හැඳින්විය හැකිය. කැලණිය පූජා භූමි කලාපය, වටිනා ජල මූලාශ්‍රයක් වන කැලණි ගඟට යාබදවම පිහිටා තිබුණද කැලණි ගඟ හා කැලණිය පූජා භූමිය අතර සංස්කෘතික හා ආධ්‍යාත්මික වශයෙන් සැලකිය හැකි අන්‍යෝන්‍ය බැඳීමක් නොමැත. වර්තමානය වන විට කැලණි ගං ඉවුර ආශ්‍රිතව මුඩුක්කු හා පැල්පත් විහිදී තිබීමත් සමඟ පූජා භූමිය හා කැලණි ගඟ සමඟ භෞතික හා සංස්කෘතික වශයෙන් පවතින බැඳීම් විකෘති කිරීමට දායකත්වයක් සපයා ඇත.

එම වන්මන් ආර්ථික සංවර්ධන නැඹුරුතාවන් සමඟ කැලණිය පූජා භූමියේ ආවේණිකත්වය හා ඓතිහාසික වටිනාකම ආරක්ෂා කර ගැනීමට සැලසුම්මය මැදිහත් වීමක අවශ්‍යතාවය උග්‍ර වී ඇත.

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

Declining of the 'Sense of Place'




*රූප සටහන 3.3 : සංයුක්ත භූ විද්‍යාත්මක විශ්ලේෂණය (Typological)*
*මූලාශ්‍රය: සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

*As express in the literature,*
*"In cities, factors such as rapid development and gentrification, mobility, migration, and blurred boundaries between the natural and built environment complicate sense of place"*

*මූලාශ්‍රය: the nature of cities වෙබ් අඩවිය*

## 3.2. පාරිසරික අසමතුලිතතාව නිසා ඇතිවන ක්ෂණික ගංවතුර හා නාගරික තාපය ඉහළ යාමත් සමඟ සුවදායක නොවන පරිසරයක් නිර්මාණය වීම

2000 වසරේදී මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සමීක්ෂණයකට අනුව ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 28% ක් තෙත්බිම්වලින් සමන්විත විය. එහෙත් 2017 දී ප්‍රදේශයේ වේගවත් සංවර්ධනයත් කර්මාන්ත ශාලා ව්‍යාප්තියත් සමඟ මුළු තෙත්බිම් ප්‍රමාණයෙන් 46% ක් වසර 17 ක් ඇතුළත හීන වී ගොස් ඇත. මේ වන විට මුළු භූමි ප්‍රමාණයෙන් තෙත්බිම් හා හරිත ආවරණය ලෙස ඉතිරිව ඇත්තේ 15% ක භූමි ප්‍රමාණයක් පමණි. රූප සටහන 3.4 මඟින් දැක්වෙන Arc GIS භාවිතයෙන් කරන ලද NDVI විශ්ලේෂණය මඟින් 1992 සිට 2017 වසර දක්වා කාල වකවානු හතරකට අදාළව එනම් 1992, 2004, 2010 සහ 2017 වසරවල ගන්නා ලද ගුවන් ඡායාරූප භාවිතා කරමින් කරන ලද වෙනස් වූ හරිත කලාප දර්ශකයේ දැක්වෙන පරිදි, එහි කොළ පැහැයෙන් ඒ කාල වකවානුවල පවත්නා හරිත කලාප ප්‍රමාණයත්, රතු, කහ වර්ණයෙන් ඉදිකිරීම් සහිත ප්‍රදේශ සීඝ්‍රයෙන් වැඩි වී යන ආකාරයක් හඳුනාගත හැකිය.

ප්‍රදේශයේ ඉඩම් වටිනාකම පිළිබඳව සලකා බැලීමේදී, ඇමුණුම 20 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ පහත් බිම් ආශ්‍රිත ඉඩම් සාපේක්ෂව අඩු වටිනාකමක් පෙන්නුම් කරයි. මෙසේ සංවර්ධන ක්‍රියාකරකම් සමඟ සාපේක්ෂ වටිනාකමින් අඩු පහත් බිම් නීතිමය හෝ නීති විරෝධී ලෙස සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම තුළින් හරිත ආවරණය හා ප්‍රදේශයේ භෞතික සැකැස්මේ පීඩාවන් දරාගැනීමට සැකසුනු පොහොසත් ජල රැඳවුම් ප්‍රදේශවලට බලවත් තර්ජන එල්ල වී ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ක්ෂණික ගංවතුර අවදානමත් නාගරික තාපය ඉහළ යාමත් සමඟ නේවාසික ජනතාවට මෙන්ම නගරය භාවිතා කරන ජනතාවට සුවදායක නොවන පරිසරයක් නිර්මාණය කර ඇත.

## 03 පරිච්ඡේදය සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

පාරිසරික අසමතුලිතතාව නිසා ඇතිවන ක්ෂණික ගංවතුර හා නාගරික තාපය ඉහළ යාමත් සමඟ සුවදායක නොවන පරිසරයක් නිර්මාණය වීම




***රූප සටහන 3.4 :** හරිත ආවරණයේ හීන වීම (NDVI විශ්ලේෂණය)*
***මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

***සටහන :** තද කොළ පැහැයෙන් දැක්වෙන ප්‍රදේශය හරිත ආවරණය පෙන්වන අතර කහ පැහැයෙන් සහ රතු පැහැයෙන් දැක්වෙන ප්‍රදේශ ඉදිකිරීම් සහිත ප්‍රදේශ ලෙස පෙන්නුම් කරයි.*

**ක්ෂණික ගංවතුර :** මෙම තත්ත්වය මත සුළු වර්ෂාවන් තිදී පවා මෙහි ඇතැම් ප්‍රදේශ ජලයෙන් යටවේ. සැලසුම් කලාපය කැලණි ගංගා ද්‍රෝණියේ කොළොන්නාව ගංවතුර කලාපයට අයත් වීමත් මුළු භූමි ප්‍රමාණයෙන් 20% ක් පමණ මුහුදු මට්ටමට පවා උස අඩු භූමියක් වීමත් හේතු කොට ගෙන මි.මී. 100 ක වර්ෂාවන් තිදීත් අඩි 2–3 ක උස ප්‍රමාණයක් ජලයෙන් යටවේ. ඒ අනුව ඇමුණුම 21. මඟින් විශ්ලේෂණය කෙරෙන ආකාරයට වනවාසල, මුදුන් ඇළ, කොහොල්විල, මැවැල්ල සහ කැලණි ගං ඉවුර පැල්පත් නිවාස ආශ්‍රිත ප්‍රදේශ නිරන්තරයෙන් ක්ෂණික ගංවතුර හා කැලණි ගඟ ආශ්‍රිත ගංවතුර තත්ත්වයන්ට ගොදුරු වේ. පහත දැක්වෙන පරිදි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්තා වලට අනුව, 2008 සිට 2017 දක්වා ගංවතුර පීඩාවට පත් ජනගහනය සලකා බැලීමේදී එය සාමාන්‍යයෙන් වසරකට පුද්ගලයින් 20,000 ක් පමණ ජල ගැලීම් වලින් පීඩාවට පත් වෙයි.




***රූප සටහන 3.5 :*** *ගංවතුරෙන් බලපෑමට ලක් වූ ප්‍රමාණය (2008-2017) කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
***මූලාශ්‍රය :*** *desinventar වෙබ් අඩවිය,2017/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

**නාගරික උණුසුම ඉහළ යාම :** ප්‍රදේශයේ හරිත ආවරණය වියැකීයාමත් ගොඩනැගිලි ඝනත්වය මෙන්ම ජන ඝනත්වය ඉහළ යාමත් සමඟ නාගරික උණුසුම ඉහළ යාමේ අවදානමක් පවතී. 2016 වසරේ රුහුණු විශ්ව විද්‍යාලය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව වගුව 3. 1 හි දැක්වෙන පරිදි 2009 – 2014 කාලය තුළ කැලණිය ප්‍රදේශයේ නාගරික තාප ප්‍රදේශ ව්‍යාප්තිය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.

| වර්ෂය | 2006 | 2009 | 2014 |
|---|---|---|---|
| තාප ප්‍රදේශ ව්‍යාප්තිය (ව.කි.මී) | 0.76 | 4.61 | 13.69 |
| තාප ප්‍රදේශ ව්‍යාප්තිය (%) | 3.7 | 22.17 | 65.82 |

***වගුව 3.1 :*** *නාගරික තාප ප්‍රදේශ ව්‍යාප්තිය (2006-2014)*
***මූලාශ්‍රය :*** *Development of thermal risk map case study - රුහුණු විශ්ව විද්‍යාල, 2016 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 3.6 :*** *නාගරික තාප ප්‍රදේශ ව්‍යාප්තිය හා අවදානම් කලාප (කැලණිය ප්‍රා.ලේ.කො.)*
***මූලාශ්‍රය :*** *Development of thermal risk map case study- රුහුණු විශ්ව විද්‍යාල, 2016*

ඉහත රූප සටහන අනුව, කැලණිය ප්‍රා.ලේ.කො. සලකා බැලීමේදී 2006 වසරේදී පැලියගොඩ ප්‍රදේශය ආසන්නව ව්‍යාප්තව තිබූ නාගරික තාප ප්‍රදේශ 2014 වසර වන විට කැලණියේ බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්තව ඇත. ඒ අනුව තලවතුහේන්පිට, කිරිබත්ගොඩ, වරාගොඩ, නුන්ගමුගොඩ, දළුගම, දළුගම්ගොඩ හා හුණුපිටිය යන ප්‍රදේශ මේ වන විට අධි අවදානම් තාප කලාප ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව මුළු භූමි ප්‍රමාණයෙන් 65% ක ප්‍රමාණයක් තාප කලාප වේ. මෙසේ මෙම ප්‍රදේශය අධික තාපයට නිරාවරණය වීම හේතු කොටගෙන ප්‍රදේශවාසීන්ට මෙන්ම කිරිබත්ගොඩ නගරය ආශ්‍රිත මහජනතාවද නාගරික පරිසරය තුළ පීඩාවට පත් වෙයි.

මෙම අසමතුලිත පාරිසරික තත්ත්වය යටතේ, ඉහළ ජන ඝනත්වයක් පවතින ප්‍රදේශයක් ලෙස නේවාසික ජනතාවට මෙන්ම දෛනික සංක්‍රමණික ජනතාවටද පාරිසරික වශයෙන් සුව පහසු ප්‍රදේශයක් ඇති කිරීමට සැලසුම්මය මැදිහත්වීමක් ඔස්සේ නිසි පරිසර කලමනාකරණයක් කිරීම අත්‍යාවශ්‍ය වේ.

## 3.3 රථ වාහන තදබදය ඉහළ යාම

ලංකාවේ උතුරු, නැගෙනහිර සහ මධ්‍යම ප්‍රදේශයන් ප්‍රධාන වාණිජ හා පරිපාලන නගරය සමඟ සම්බන්ධ කෙරෙන ප්‍රධාන ගමන් මාර්ගය වන කොළඹ – නුවර (ඒ 1) මාර්ගය දෙපසට විහිදී යන ලෙස කොළඹට කි.මී.12ක් පමණ ආසන්නයෙන් පිහිටා තිබෙන මෙම සැලසුම් කලාපය දිනපතා අත්විඳින ගැටලුවක් ලෙස රථවාහන තදබදය හඳුනාගත හැකිය. මෙම ප්‍රදේශය ඔස්සේ දිනකට කොළඹ බලා ධාවනය වන සාමාන්‍ය රථ වාහන ප්‍රමාණය 150,000 ක් පමණ වේ. පහත වගුව 3.2 අනුව, මේ වන විට කොළඹ – නුවර මාර්ගයේ පවතින සාමාන්‍ය පැයක ධාරිතාවය ඉක්මවා යමින් උපරිම පැයක රථවාහන ධාරිතාවයේ අගය 4400ක් ලෙස සටහන්ව ඇත. කොළඹ හා සම්බන්ධ වන ප්‍රධාන මාර්ගයන් අතරින් ඉහළම ධාරිතාවය ඉක්මවා ගිය මාර්ගය ලෙස කොළඹ-නුවර මාර්ගය හඳුනාගෙන ඇත.

| ප්‍රධාන ගමන් මාර්ගය | උපරිම පැයක රථ වාහන ධාරිතාවය (pcu) | පැයක සාමාන්‍ය ධාරිතාවය (pcu) |
|---|---|---|
| මහනුවර කොරිඩෝව | 4400 | 3300 |
| පහළ ඔංවැල්ල කොරිඩෝව | 2900 | 2200 |
| මාලබේ කොරිඩෝව | 5100 | 4400 |
| ගාල්ල කොරිඩෝව | 2900 | 2300 |
| හොරණ කොරිඩෝව | 2200 | 2300 |
| මීගමුව කොරිඩෝව | 4000 | 4400 |

**වගුව 3.2 :** *ප්‍රධාන මාර්ගයන්හි සාමාන්‍ය ධාරිතාවය හා උපරිම පැයක රථ වාහන ධාරිතාවය*
**මූලාශ්‍රය :** *Com-Trans අධ්‍යයන වාර්තාව, 2014/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

ශ්‍රී ලංකාවේ නන් දෙසින් පැමිණ කොළඹ නගරය හා සම්බන්ධ වන ප්‍රධාන ප්‍රවාහන තීරයන් හත අතුරින් උපරිම පැයක් තුළ ධාවනය වන බස් රථ ප්‍රමාණයන්, විවිධ ප්‍රවාහන මාධ්‍යයන් අනුව මගීන් ප්‍රමාණයන් වැඩිම ප්‍රවාහන තීරය, කොළඹ- නුවර ප්‍රවාහන තීරය ලෙස ඇමුණුම 22 මඟින් විශ්ලේෂණය කෙරේ. මෙහි බලපෑම සෘජුව ලබන සැලසුම් කලාපයේ කේන්ද්‍රය වන වාණිජ හා සේවා සපයන ප්‍රධාන නගරය වන කිරිබත්ගොඩ නගරය රථවාහන තදබදයෙන් දැඩි ලෙස පීඩා විඳින ප්‍රදේශයක් ලෙස වගුව 3.3 දැක්වෙන පරිදි හඳුනාගත හැකිය. පැලියගොඩ රථවාහන පොලිස් වාර්තාවලට අනුව කිරිබත්ගොඩ නගර ආසන්නව කොළඹ-නුවර මාර්ගයේ සාමාන්‍ය වේගය පැ.කි.මී. 10-15 ක් පමණ වේ.

| මාර්ගය | දුර | ගමන් වේගය | සාමාන්‍ය ගමන් කාලය විනාඩි |
|---|---|---|---|
| කොළඹ - නුවර මාර්ගය (පෑලියගොඩ සිට මහර දක්වා) | කි.මී 8 | පැ. කි. මී 10-20 | 40 |
| කොළඹ - බියගම මාර්ගය (පෑලියගොඩ-කැලණි විහාරය) | කි.මී 5 | පැ. කි. මී 20-30 | 15 |
| වරාගොඩ මාර්ගය | කි.මී 3 | පැ. කි. මී 10 ට අඩු | 30 |
| මාකොළ - හුණුපිටිය මාර්ගය | කි.මී 5 | පැ. කි. මී 20- 30 | 15 |

***වගුව 3.3 :** කිරිබත්ගොඩ ප්‍රදේශයේ උපරිම පැයක සාමාන්‍ය ගමන් කාලය*
***මූලාශ්‍රය :** Com-Trans අධ්‍යයන වාර්තාව,2014 සහ ගූගල් සිතියම්/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 3.7 :** උපරිම පැයක රථවාහන තදබද - කිරිබත්ගොඩ (සඳුදා පෙ.ව. 8/ සඳුදා ප.ව. 6)*
***මූලාශ්‍රය :** ගූගල් සිතියම්*

ඒ අනුව සැලසුම් කලාපය හරහා කි.මී. 8 ක් පමණ කෙටි දුරක් ගමන් කිරීමට විනාඩි 40 කට වඩා කාලයක් ගත වන තරමටම උග්‍ර රථවාහන තදබදයකට මුහුණපා ඇත. එමෙන්ම උදෑසන මෙන්ම සවස් කාලයේද කොළඹ – නුවර මාර්ගය ආශ්‍රිතව උපරිම රථවාහන තදබදයක් පවතින බව පහත රූප සටහන 3.7 මගින් පෙන්නුම් කරයි.

බියගම වෙළඳ කලාපය සම්බන්ධ කෙරෙන මාකොළ මාර්ගයත්, වත්තල ප්‍රදේශය සම්බන්ධ කෙරෙන හුණුපිටිය –වත්තල මාර්ගයත් කිරිබත්ගොඩින් කොළඹ– නුවර මාර්ගයට සම්බන්ධ වීමත් ප්‍රධාන වශයෙන් ටයර් හන්දිය හා කිරිබත්ගොඩ ආසන්නයේ පවතින රථවාහන තදබදයට තවත් හේතුවකි. එය ඉහත 3.8 රූප සටහන හි දැක්වෙන ප්‍රදේශයේ පවතින මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය මගින් විදහා දැක්විය හැකිය.

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

රථ වාහන තදබදය
ඉහළ යාම




***රූප සටහන 3.8 :*** *කැලණිය ප්‍රදේශයේ මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය (Integration)*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

කොළඹ– නුවර කොරිඩෝව තුළ පවතින ප්‍රධාන නගර කේන්ද්‍රයක් වන කිරිබත්ගොඩ හා අවට ප්‍රදේශය ඉහළ මාර්ග ප්‍රවේශයක් සහිත ප්‍රදේශයක් ලෙස අවට පවතින රැකියා මධ්‍යස්ථානයන්හි සේවය කරන ජනතාවට නේවාසික මෙන්ම වාණිජ පහසුකම් සැපයීමේදී පවතින රථවාහන තදබදය හේතුවෙන් කැලණිය ප්‍රදේශය අධික ලෙස පීඩාවට පත් වන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත.

මෙසේ පාර්ශවකරුවන්ගෙන් ලබාගත් අදහස් හා යෝජනා මෙන්ම විද්‍යාත්මක විශ්ලේෂණයන් මත පදනම්ව ඉහත සදහන් පරිදි සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ප්‍රධාන ගැටළු තුනක් ඔස්සේ දීර්සව විග්‍රහ කළ හැකි අතර පාර්ශවකරුවන්ගෙන් ලබාගත් අදහස් හා යෝජනා පරිගණක ආශ්‍රිත වචන විශ්ලේෂණයෙන්ද (Word Cloud Analysis) මෙම ප්‍රධාන ගැටළු තුන තව දුරටත් සනාථ කරයි. එය ඇමුණුම 23 මඟින් දැක්වේ.

මෙම තත්ත්වය මත කැලණිය ප්‍රදේශය කාර්යක්ෂම පහසුකම් සහිත නගරයක් බවට පත් කරලීම සඳහා සංවර්ධන සැලැස්මක අත්‍යාවශ්‍යතාවයක් පවතී.



# දෙවන කොටස

**කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 4 දරණ පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8ඊ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019 ජූලි මස 09 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

..................................................
**පාඨලී චම්පික රණවක,**
**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය .**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,
17 හා 18 වන මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**2019 අගෝස්තු මස 01 වන දින.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2135/29 - 2019 අගෝස්තු මස 06 වැනි අඟහරුවාදා - 2019.08.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8අ වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මා විසින්, එකී පනතේ 8ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව, එකී පනතේ 8උ වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,  
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 අගෝස්තු මස 01 වැනි දින,  
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,  
17 හා 18 වන මහල,  
"සුහුරුපාය",  
සුභූතිපුර පාර,  
බත්තරමුල්ල.


1A - G 30685— 27 (2019/08)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතෙන් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8අ වගන්තියේ බලතල ප්‍රකාරව කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8ඊ වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2019 අගෝස්තු මස 01 වැනි දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 අගෝස්තු මස 01 වැනි දින.

08 - 756

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# 04
## පරිච්ඡේදය



# සංවර්ධන සැලසුම් රාමුව

# 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම

*"දිව්‍යමය නාගරික තලය"*
*"The Urban Locus of Divinity"*



***රූප සටහන 4.1 :*** *කැලණිය වසර 2030 සඳහා වූ සංකල්පමය දැක්ම*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

# 4.2. දැක්මෙහි ප්‍රකාශනය

*‘A Cavalcade of Urban Events in the Descending intensities of congestion towards a pinnacle of Tranquillity…’*

***‘කැලණිය පූජා නගරය පාදක කොටගෙන ඉහළ නාගරීකරණය හමුවේ එහි පූජනීයත්වය සහ ආවේණිකත්වය ආරක්ෂාකර ගනිමින් වත්මන් සංවර්ධන නැඹුරුතාවයන් ද නිසි පරිදි යොදාගෙන කාර්යක්ෂම ප්‍රවාහන පහසුකම් සහිත ව ගමනාගමනය පාදක කොටගත් ජනාවාස සහිත හරිත නගරයක් කරා.’***

“නාගරික තලය’ (Urban Locus) යන්න, කොළඹට කි.මී. 10 ක් පමණ දුරකින් පවතින කැලණිය දැනටමත් අධි සනත්ව කලාපයක් බවට පත්ව ඇත. එමෙන්ම වාණිජමය වශයෙන් කොළඹ – නුවර තීරයෙහි පවතින ප්‍රධාන වෙළෙඳ හා සේවා මධ්‍යස්ථානයක් ලෙසත්, විශ්ව විද්‍යාලය කේන්ද්‍ර කොට ගෙන උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙසත්, කර්මාන්ත ප්‍රදේශයක් ලෙසත් විවිධාකාරයේ නාගරික ලක්ෂණයන්ගෙන් ගහන ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. මෙසේ පවතින නාගරික සේවාවන් ඵලදායී කර ගැනීම උදෙසා කාර්යක්ෂම මාර්ග හා ප්‍රවාහන ජාලයක් මඟින් සම්බන්ධ වන ගමනාගමන පාදක කරගත් ජනාවාස ප්‍රදේශයක් ලෙස 2030 වන විට සැලසුම් සහගත නාගරීකරණයක් කරා පිවිසීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා දැනට පවතින හා නවීකරණය කිරීමට යෝජිත දුම්රිය මාර්ග හා යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග ඒකාබද්ධ කරගෙන මෙම ප්‍රදේශයේ සහ සමස්ත කලාපයේ ජීවත් වන ජනතාව සඳහා ප්‍රවාහන, වාණිජ සහ නාගරික සේවා සැපයීම අපේක්ෂාවයි.

“දිව්‍යමය” (Divinity) යන්න, කැලණි ගඟ සමනල කඳුවැටියෙන් ආරම්භ වී බස්නාහිර කලාපය ඔස්සේ සාගරයට ගලා බසින අතර තුර කැලණිය ප්‍රදේශයත්, පූජා භූමියත් හමුවන සුවිශේෂ ඓතිහාසික, ආගමික හා සංස්කෘතික සංධිස්ථානයක් ලෙස මෙම ප්‍රදේශය හඳුනා ගත හැකිය. මෙසේ ජාතික වශයෙන් අනන්‍යතාවයක් පවතින ප්‍රදේශයක් ලෙස වන්දනාකරුවන්ට මෙන්ම සමස්ත කලාපයටම ආශිර්වාදයකි. අධික නාගරීකරණය හමුවේ පූජනීයත්වය හා ආවේණික හැඟීම ආරක්ෂා වන පරිදි කැලණි ගඟ ද ඒකාබද්ධ කර ගනිමින් අධි සනත්ව ප්‍රදේශය තුළ පවතින නිස්කලන ප්‍රදේශයක් ලෙස ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. ඉහත විස්තර කෙරෙන පරිදි නාගරික ප්‍රදේශයක් ලෙස පවතින සියලුම අංගයන් නීල හරිත ස්වභාවික පරිසර පද්ධතීන් ද ආරක්ෂා වන පරිදි ප්‍රදේශයේ උතුරු දෙස සිට පූජා නගරය පෙදෙසට පැමිණෙන විට සියළු නාගරික අංගයන්හි සනත්වය හා තීව්‍රතාවය ක්‍රමයෙන් හීන වන පරිදි පෙළගැස්වීමට අපේක්ෂා කෙරේ.මෙම සංකල්පමය දැක්ම රූප සටහන 4.1 මඟින් දැක්වේ.

# 4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු

අරමුණ 01

කැලණිය පූජා භූමියෙහි නූතන ප්‍රතිරූපය කැලණි ගඟ සමඟ ද ඒකාබද්ධ කරමින් " කැලණිය පූජා නගරය"යන පූජනීය හැඟීම ස්ථාපිත කිරීම.

අරමුණ 02

ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීම.

අරමුණ 03

නීල-හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීම

# 4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අරමුණ 01

කැලණිය පූජා භූමියෙහි නූතන ප්‍රතිරූපය කැලණි ගඟ සමඟ ද ඒකාබද්ධ කරමින් " කැලණිය පූජා නගරය"යන පූජනීය හැඟීම ස්ථාපිත කිරීම.

පරමාර්ථ

1. 2030 වන විට කැලණිය රජමහා විහාරය ඇතුළු පූජා භූමිය සෘජු මාර්ග ඔස්සේ සම්බන්ධ විය හැකි කේන්ද්‍රීය ස්ථානයක් ලෙස ස්ථාන ගත කිරීම.
2. 2025 වන විට කැලණි විහාරස්ථානය වටා මීටර් 500 ක් ආවරණය වන පරිදි හෙක්ටයාර 105 ක භූමි ප්‍රමාණයක් පිටත පූජා භූමිය ලෙස ප්‍රවර්ධනය කිරීම.
3. 2025 වන විට කැලණි ගඟේ කි.මී. 1 ක් පමණ මුහුණත ගං ඉවුර පූජා භූමියේ දර්ශනීයත්වය ඉහළ  නැංවීම උදෙසා විවෘත කිරීම.
4. 2030 වසර වන විට කැලණිය ප්‍රදේශය පුරාම පවතින පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකමක් සහිත ස්ථාන යා කරමින් නැරඹුම් ස්ථාන ජාලයක් නිර්මාණය කිරීම.
5. 2030 වසර වන විට පැරණි මැටි කර්මාන්තය පූජා නගරය හා සම්බන්ධ කරමින් දේශීය ආර්ථිකය නගා සිටුවීම උදෙසා දායක වීම.

අරමුණ 02

**ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීම.**

පරමාර්ථ

1. 2030 වසර වන විට නව මාර්ග ධූරාවලියක් හරහා කාර්යක්ෂම ගමනාගමන සංසරණයක් ස්ථාපිත කිරීම.
2. 2030 වසර වන විට නව දුම්රිය නවීකරණයන් හා සැහැල්ලු දුම්රිය සේවා කේන්ද්‍ර කොටගෙන ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන පර්ෂදයන් 6 ක් ඇති කිරීම.
3. 2030 වසර වන විට මුළු ජනගහනයෙන් 60% ක් සඳහා ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන පර්ෂදයන් තුළ පහසුකම් සැපයීම.
4. 2030 වසර වන විට කිරිබත්ගොඩ නගරය පදිකයින් සඳහා පහසුකම් සලසන වීදි වෙළඳසැල් සහිත වාණිජ නගරයක් බවට පත් කිරීම.

අරමුණ 03

**නීල-හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීම**

පරමාර්ථ

1. 2030 වසර වන විට හෙක්ටයාර 300 ක තෙත් බිම් කලාප ක්‍රමවත්ව යොදා ගනිමින් ගංවතුර බලපෑම අවම කිරීම.
2. 2030 වසර වන විට හෙක්ටයාර 140 ක තෙත් බිම් සංරක්ෂණ කලාපය පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ක්‍රමවත්ව යොදා ගැනීම.
3. 2030 වසර වන විට 100% ක් අඛණ්ඩ ඇළ මාර්ග ජාලයක් නිසි ලෙස කලමනාකරණය කිරීම.
4. 2030 වසර වන විට කැලණිය විශ්ව විද්‍යාල ප්‍රදේශය ආශ්‍රිතව හරිත විශ්ව විද්‍යාල පරමාදර්ශය පෙරදැරිව හරිත නගරයක් කරා යොමු වීම.

# 05

## පරිච්ඡේදය



# SWOT විශ්ලේෂණය

## 5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය

අරමුණ 01 *කැලණිය පූජා භූමියෙහි නූතන ප්‍රතිරූපය කැලණි ගඟ සමඟ ද ඒකාබද්ධ කරමින් " කැලණිය පූජා නගරය"යන පූජනීය හැඟීම ස්ථාපිත කිරීම.*

### S

- ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වටිනාකමකින් යුතු ප්‍රධාන ආගමික මධ්‍යස්ථානයක් ලෙස කැලණි විහාරයේ පිහිටීම.
- දෙස් විදෙස් වන්දනා කරුවන් විශාල ප්‍රමාණයක් වන්දනා කරන ස්ථානයක් වීම. *(පෝය දිනවල වන්දනාකරුවන් 100,000 ක් පමණ ද වාර්ෂික කැලණි පෙරහැර වෙත 200,000 ක් පමණ පැමිණේ.)*
- කැලණි විහාරය ද සමඟ මම ප්‍රදේශය තුළ පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුවෙන් හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන 18 ක් ස්ථානගත වී තිබීම.
- කැලණිය පූජා භූමි ප්‍රදේශය ආසන්නයේ පාරම්පරික මැටි කර්මාන්තය හා සර්ප විෂ වෛද්‍ය රෝහල පිහිටා තිබීම.
- කැලණි ගඟේ කි.මී. 6 ක් පමණ වන ගංගා මුහුණත ප්‍රදේශයක් සැලසුම් ප්‍රදේශයට අයත් වීම.
- කැලණි ගඟ උතුරු බැම්ම මඟින් පූජා භූමි ප්‍රදේශයෙහි ගංවතුර පාලනය කිරීම.

### W

- පූජා භූමි ප්‍රදේශය අවට 10% ක භූමි ප්‍රමාණයක කර්මාන්ත හා ගබඩා ව්‍යාප්ත වී තිබීම.
- කැලණි විහාරස්ථානය ඉදිරිපිටින් ගමන් ගන්නා කොළඹ - බියගම මාර්ගය ඔස්සේ බියගම කර්මාන්ත කලාපයේ 1/3 ටත් වඩා ගමන් කිරීම හේතුවෙන් ඇතිවන තදබදය හා නොසන්සුන් බව.
- කැලණි ගං ඉවුරේ තාවකාලික පැල්පත් නිවාස 1200 ක් පමණ ව්‍යාප්තව තිබීම.

## O

- පූජා භූමි ප්‍රදේශය සඳහා යෝජිත ජාතික භෞතික සැලසුම් දෙපාර්තුමේන්තුවේ සැලැස්මෙහි කැලණි ගඟ ආශ්‍රය කරගන්නා ව්‍යාපෘති ඇතුළත් කර තිබීම.

- බස්නාහිර කලාපීය සැලසුමට අනුව කැලණිය ආගමික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනයට හඳුනාගෙන තිබීම.

- 2030 බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්මට අනුව කැලණි ගං ඉවුර ආශ්‍රිත ප්‍රදේශය පරිසර සංරක්ෂණ කලාපයක් ලෙස හඳුනාගෙන තිබීම.

- කොළඹ මූල්‍ය නගර සංවර්ධන සැලැස්ම මඟින් කැලණි ගංගාව ආශ්‍රිත ප්‍රදේශය විශේෂ පුනර්ජීවන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබීම.

- යෝජිත පරිපාලන අගනගර සැලැස්ම - 2030ට අනුව කැලණිය රජමහ විහාරය සහ අගනගරයේ කේන්ද්‍රය සම්බන්ධ වන සිරස් අක්ෂිය රේඛාවක් යෝජනා කර තිබීම.

## T

- මහ නගර සැලැස්මේ නියෝග වලට අනුව පෑලියගොඩ සිට රාගම දෙසට ප්‍රදේශය ලොජිස්ටික් කොරිඩෝව වශයෙන් හඳුනාගෙන තිබීමේ ප්‍රතිඵලයක් ලෙස පූජා භූමි ප්‍රදේශයට කර්මාන්ත ව්‍යාප්ත වීමේ ඉඩකඩ වැඩි වීම.

## අරමුණ 02 *ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීම.*

## S

- මාර්ග ප්‍රවේශය සහ සම්බන්ධතාවය *(Accessibility and connectivity)* කොළඹ හා තදාසන්න ප්‍රදේශ වල රැකියා ස්ථානයන්ට හා අධ්‍යාපන මධ්‍යස්ථානයන්ට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක් වීම.

- ප්‍රවාහන අතුරුමුහුණත් සහිත ප්‍රධාන ගමනාගමන කොරිඩෝව තුළ පිහිටා තබෙන ප්‍රදේශයක් වීම *(Transit corridors with transportation interfaces)*
  A1 මාර්ගය/ කඩවත සහ පෑලියමගාඩ අධිවේගී මාර්ගය අන්තර්හුවමාරු/ හුණුපිටිය, වනවාසල හා කැලණිය දුම්රිය ස්ථාන.

- ඝනත්වය *(Density)* :
  පවත්නා ජන ඝනත්වය හෙක්ටයාරයකට පුද්ගලයන් 61 කි. එය TOD න්‍යායට අනුව හෙක්ටයාරයකට සිටිය යුතු අවම පුද්ගලයන් ප්‍රමාණය ඉක්මවා ඇති අතර ප්‍රදේශය උතුරු කටස ඉහළ ඝනත්වයකින් සංවර්ධනය සඳහා ඉතාම යෝග්‍ය වේ.

- මිශ්‍ර භාවිතය *(Mixed of use)* :
  වාණිජ, සේවා, අධ්‍යාපන, නිවාස හා රැකියා ආදී මිශ්‍ර භූමි පරිහරණයක් ප්‍රදේශය තුළ පැවතීම.
  *(කිරිබත්ගොඩ - ආසන්න වශයෙන් 100,000 ක පමණ මගීන් දෛනික අවශ්‍යතා සඳහා සංක්‍රමණය වේ.)*

- සංයුක්ත සංවර්ධනය :
  කිරිබත්ගොඩ සිට හුණුපිටිය දක්වාත් මාකොළ දක්වාත් පවතින ඉහළ සංවර්ධන පීඩනය.

## W

- ප්‍රධාන මාර්ගය ඔස්සේ පවතින අධික රථ වාහන තදබදය *(උපරිම පැයවල දී උපරිම වේගය පැ. කි.මී. 10- 15).*

- බහු මාදිලි ප්‍රවාහන ක්‍රම අතර නිසි සම්බන්ධයක් නොමැති වීම හා පදික පහසුකම් නොමැති වීම *(Pedestrian oriented facilities, multi-model transport interfaces)*

  - දුම්රිය හා බස් ප්‍රවාහන ජාල අතර පවතින සබඳතාවය
  - වාහන ගාල් කිරීමේ ඉඩකඩ නොමැති වීම
  - පටු පදික වේදිකා

## O

- ජාතික භෞතික සැලසුම් කෙටුම්පත 2050 ට අනුව සැලසුම් කලාපය නැගෙනහිර - බටහිර ආර්ථික කොරිඩෝවට අයත් වන අතර එහි ජනගහනය 20%-30% ක් දක්වා වර්ධනය කිරීමට යෝජනා වී ඇත.
- යෝජිත පොදු ප්‍රවාහන සේවකයන්ගේ බලපෑම සෘජුවම ලබන ප්‍රදේශයක් වීම. *(ඉදි වෙමින් පවතින පිටත වටරවුම් අධිවේගී මර්ගය / මහනුවර අධිවේගී මාර්ගය / සැහැල්ලු දුම්රිය සේවා හා දුම්රිය නවීකරණ).*
- පෑලියගොඩ සංවර්ධන සැලසුම් කෙටුම්පතට අනුව මාර්ගය තදබදය අවම කිරීම සඳහා සැලසුම් ප්‍රදේශය හරහා පරිපාලන නගර සම්බන්ධ කරමින් සම්බන්ධිත මාර්ගයක් යෝජනා වී තිබීම.

## T

- පුද්ගලයින් 20,000 ට ආසන්සන ප්‍රමාණයක් වාර්ෂික ගංවතුරෙන් පීඩාවට පත් වීම.

## අරමුණ 03 *නීල-හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීම*

## S

- කැලණි ගඟ ප්‍රධාන ජල මූලාශ්‍රය කරගනිමින් ඇළ මාර්ගය පද්ධතියක් සමඟ මෙම ප්‍රදේශය පහළ කැලණි ගංගා ආශ්‍රිත උප ද්‍රෝණියකට අයත් වීම.
- මුළු භූමි ප්‍රමාණයෙන් 15%ක හරිත තෙත්බිම් ප්‍රමාණයක් ඉතිරිව පැවතීම.
- හරිත නාගරයක් බිහිකිරීම සඳහා මූලාරම්භක ස්ථාන පැවතීම. *(උදා: කැලණිය විශ්ව විද්‍යාලය / කැලණිය විහාරය / කැලණි ගඟ උතුරු බැම්ම සංරක්ෂණ කලාපය)*

## W

- කැලණි ගඟ හා දුම්රිය සංරක්ෂණ අවකාශයන් තුළ පැල්පත් නිවාස විසිරී තිබීම.
- ප්‍රදේශය තුළ පවතින සෑම ඇළ මාර්ගයක්ම මීටර 500 කට වැඩි ප්‍රමාණයක් අවහිර වී පැවතීම.
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිසි ක්‍රියාමාර්ගයන් නොමැති වීම.

## O

- යෝජිත බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්ම - 2030 ට අනුව කැලණි ගඟ ආශ්‍රිතව පරිසර සංරක්ෂණ කලාපයක් ලෙස හඳුනාගෙන තිබීම.
- කැලණිය විශ්ව විද්‍යාලය මෙරට ප්‍රථම හරිත සරසවිය ලෙස හඳුනාගන තිබීම.
- ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අනුව පවත්නා පරිසර ආරක්ෂණ රෙගුලාසි.

## T

- 65% ක භූමි ප්‍රමාණයක් අවදානම් නාගරික තාප ව්‍යාප්ති ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබීම.
- තෙත්බිම් පරිසර පද්ධතිය හායනය වීමේ තර්ජනයක් පැවතීම.

  මුළු බිම් ප්‍රමාණමයන් ,

  - 2000 - 28% වගුරු බිම්
  - 2017 - 15% වගුරු බිම්

# 5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය

## අරමුණ 01

*කැලණිය පූජා භූමියෙහි නූතන ප්‍රතිරූපය කැලණි ගඟ සමඟ ද ඒකාබද්ධ කරමින් " කැලණිය පූජා නගරය"යන පූජනීය හැඟීම ස්ථාපිත කිරීම.*

## ශක්තීන් | අරමුණ 01

### 1. *ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වටිනාකමකින් යුතු ප්‍රධාන ආගමික මධ්‍යස්ථානයක් ලෙස කැලණි විහාරයේ පිහිටීම.*

කැලණිය, බුදුරජාණන් වහන්සේගේ තෙවන මෙන්ම අවසන් ලංකාගමනයේ ප්‍රධාන සංධිස්ථානය ලෙස බස්නාහිර කලාපයට මෙන්ම මුළු ශ්‍රී ලංකාවටම සුවිශේෂී ආගමික සිද්ධස්ථානයක් ලෙස පැවතීමත්, අතීතයේ ජනාවාස ආරම්භයේ සිට සුප්‍රසිද්ධ ස්ථානයක් ලෙස බටහිර කලාපය තුළ පැවතීමත් හේතු කොටගෙන ඓතිහාසික, ආගමික හා සංස්කෘතික වටිනාකමකින් යුතු ස්ථානයක් ලෙස ප්‍රසිද්ධියට පත්ව තිබීම නිසා ස්ථානීය හැඟීම ස්ථාපිත කිරීමට තරම් ප්‍රමාණවත් ආධ්‍යාත්මික සංකල්පයක් තවදුරටත් රඳා පැවතීම. එසේම මෙම කැලණිය පූජා භූමි කලාපය 1952 වසරේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මඟින් කැලණිය, පූජනීය නගරයක් ලෙස ප්‍රකාශයට පත් කර තිබීමත් නිසා මේ වනවිටත් නීතිමය මැදිහත්වීම් මඟින් පූජා භූමි ප්‍රදේශය ස්ථාපිත කිරීමට ප්‍රයත්නයන් දරා තිබීම.

### 2. *දෙස් විදෙස් වන්දනාකරුවන් විශාල ප්‍රමාණයක් වන්දනා කරන ස්ථානයක් වීම.*

විහාරස්ථානයෙන් ලද තොරතුරු අනුව දිනපතාම පාහේ දේශීය හා විදේශීය වන්දනාකරුවන් 10,000 – 20,000 කට අධික පිරිසක් කැලණි විහාරස්ථානයට පැමිණෙන අතර, පෝය දිනවල වන්දනාකරුවන් 75000– 100000 ක් පමණද, ජනවාරි මාසයේදී කැලණිය දුරුතු පෙරහැර නැරඹීම සඳහා පැමිණෙන බැතිමතුන් 200000 ක් පමණ වේ. එය රූප සටහන 5.1 හා 5.2 මඟින් දැක්වේ. ජනවාරි මාසයේ පැවැත්වෙන කැලණිය පෙරහැර ලංකාවේ සංස්කෘතික මංගල්‍යයන්හි ආරම්භය ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය මඟින් ද ප්‍රකාශ කර ඇත.



**රූප සටහන 5.1 :** *පොහොය දිනවල වන්දනාකරුවන්*
**මූලාශ්‍රය :** *Dailymirror වෙබ් අඩවිය, 2018*



**රූප සටහන 5.2 :** *කැලණිය දුරුතු පෙරහැරට පැමිණෙන බැතිමතුන්*
**මූලාශ්‍රය :** *Dailymirror වෙබ් අඩවිය, 2018*

මේ අනුව විහාරස්ථානය සමඟ ගොඩනැඟී පවතින දෙස් විදෙස් සබඳතාවය මෙහි පූජනීය හැඟීම ස්ථාපනය කිරීම කෙරෙහි අතිශයින් වැදගත් වේ.

### 3. *කැලණි විහාරය ද සමඟ මෙම ප්‍රදේශය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන 18 ක් ස්ථානගත වී තිබීම.*

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුව, කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පුරාවිද්‍යා ස්ථාන 18 ක් ව්‍යාප්තව ඇති බව හඳුනාගෙන ඇත. එම එක් එක් ස්ථානවල පිහිටීම හා අදාළ ඡායාරූප ඇමුණුම 24 හි දැක්වේ. මෙසේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 1% ක් පමණ කුඩා ප්‍රමාණයක් ආගමික ස්ථාන ව්‍යාප්තව තිබුන ද ඒවායේ පවතින ඉහළ පුරාවිද්‍යාත්මක වටිනාකම හේතුවෙන් එය සමස්ත ප්‍රදේශයටම ඓතිහාසික හා සංස්කෘතික ස්ථානයක් ලෙස ස්ථාපිත කිරීමට තරම් සුදුසු පුරාවිද්‍යාත්මක බැඳීමක් අතීතයේ සිටම ආරෝපණය වී තිබීම.

### 4. *කැලණිය පූජා භූමි ප්‍රදේශය ආසන්නයේ පාරම්පරික මැටි කර්මාන්තය හා සර්ප විෂ වෛද්‍ය රෝහල පිහිටා තිබීම.*

කැලණිය ගල්බොරැල්ල ප්‍රදේශයේ 1925 වසරේ ආරම්භ කරන ලද මැටි කර්මාන්තය ප්‍රදේශයේ පෞරාණික අනන්‍යතාවය ස්ථාපිත කිරීම කෙරෙහි පවතින ශක්තියක් ලෙස සැලකිය හැකිය. අතීතයේ මැටි කර්මාන්ත ගම්මානයක් ලෙස පැවති මෙම ප්‍රදේශයේ අදටත් ආරක්ෂිතව පවතින මැටි කර්මාන්තය පූජා භූමිය සමඟ සම්බන්ධ කරමින් අනන්‍ය පූජනීය නගරයක් ලෙස ස්ථාපිත කිරීමට හැකියාවක් පවතී. එමෙන්ම පහත රූප සටහන 5.3 හි දැක්වෙන කැලණිය විෂ වෙද රෝහල සහිත වෛද්‍ය විද්‍යාලය කැලණිය පූජා භූමියට ඉතා ආසන්නව පිහිටා තිබීම නිසා කැලණිය පූජා භූමිය හා සම්බන්ධව එහි දේශීය වෛද්‍ය ක්‍රමයන්ද සම්බන්ධ කර ගනිමින් ප්‍රදේශයේ අනන්‍යතාවය නඟා සිටුවීමට ඉඩකඩ පැවතීම.




***රූප සටහන 5.3 :*** *කැලණිය විෂ වෙද රෝහල*
***මූලාශ්‍රය :*** *ගූගල් සිතියම් ඡායාරූප/ චතුරංග රණතුංග, 2018*

### 5. *කැලණි ගඟේ කි.මී 6 ක් පමණ වන ගංගා මුහුණත ප්‍රදේශයක් සැලසුම් ප්‍රදේශයට අයත් වීම.*

කැලණිය ප්‍රදේශයේ ජල මූලාශ්‍ර ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ඇමුණුම 25 හි දැක්වෙන පරිදි කැලණි ගඟ ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස හඳුනාගත හැකි අතර එය කැලණි විහාරයට ඉතා ආසන්නයෙන් සම්බන්ධ වීම විශේෂත්වයකි. එසේම කි.මී. 6 ක් පමණ දුරට විහිදෙන ගං මුහුණත ප්‍රදේශයක් කැලණිය සැලසුම් කලාපයට අයත් වීම නිසාවෙන් එය පූජා භූමිය සමඟ සම්බන්ධ කර ගනිමින් පූජනීය ප්‍රදේශයක් ලෙස ස්ථාපිත කිරීමෙහිලා අවශ්‍ය සංවර්ධන කටයුතු කිරීමේ ඉඩ ප්‍රස්ථාව පවතී. මෙම කැලණි ගං මුහුණත වත්මන් තත්ත්වය රූප සටහන 5.4 හි දැක්වේ.



***රූප සටහන 5.4 :*** *කැලණි ගඟ*
***මූලාශ්‍රය :*** *Google street view,2015/*

### 6. *කැලණි ගඟ උතුරු බැම්ම මඟින් පූජා භූමි ප්‍රදේශයෙහි ගංවතුර පාලනය කිරීම.*

කැලණි ගඟ උතුරු බැම්ම, ගංවතුර වැළැක්වීමේ ව්‍යුහාත්මක පියවරක් ලෙස ක්‍රියාකිරීම හේතුවෙන් පූජා භූමි ප්‍රදේශයට තිබෙන ගංවතුර අවදානම පහළ මට්ටමක පවතී. ඇමුණුම 26 මඟින් දැක්වෙන පරිදි මෙම කලාපය කැලණි ගංගා ද්‍රෝණියට අයත් ප්‍රදේශයක් ලෙස කොළොන්නාව ගංවතුර කලාපයට අයත් වුවද උතුරු බැම්මේ පිහිටීම හේතුවෙන් කැලණි විහාර ප්‍රදේශයට ගංගා ආශ්‍රිත ගංවතුරෙන් බලපෑමක් එල්ල නොවේ. මේ නිසා පූජා භූමියට පැමිණෙන බැතිමතුන්හට ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කරයි.

## දුර්වලතා | අරමුණ 01

### 1. *පූජා භූමි ප්‍රදේශය අවට 10% ක භූමි ප්‍රමාණයක කර්මාන්ත හා ගබඩා ව්‍යාප්ත වී තිබීම.*

පූජනීය පෙදෙස වටා කි.මී. 1 ක වපසරියක් ඇතුළත පවතින භූමි පරිහරණය සලකා බැලූ විට වර්තමානයේ 10% ක ප්‍රමාණයක් කර්මාන්ත හා ගබඩා සඳහා යොදා ගෙන ඇත. මීට අමතරව පළමු කොටස – පරිච්ඡේද 3 හි සඳහන් රූප සටහන 3.3 යටතේ විශ්ලේෂණය කෙරෙන සංයුක්ත සටහනට අනුව අවට පවතින ගොඩනැගිලි වල ව්‍යුහය, හැඩය, වර්ණය හා නාම පුවරු ආදිය පූජනීය ප්‍රදේශයට අනුකූල නොවේ.

### 2. *කැලණි විහාරස්ථානය ඉදිරිපිටින් ගමන් ගන්නා කොළඹ - බියගම මාර්ගය ඔස්සේ බියගම කර්මාන්ත කලාපයේ රථවාහන වලින් 1/3 ටත් වඩා ගමන් කිරීම හේතුවෙන් ඇතිවන තදබදය හා නොසන්සුන් බව.*

බියගම කර්මාන්ත කලාපය හා සම්බන්ධ වන රථවාහන වලින් 1/3 ක්ම බියගම – කොළඹ මාර්ගය හරහා වරාය නගරය සමඟ සම්බන්ධ වේ. පළමු කොටස –පරිච්ඡේද 3 හි සඳහන් රූප සටහන 3. 8 හි විශ්ලේෂණය වන පරිදි කොළඹ – බියගම මාර්ගය තුළ ද සැලකිය යුතු මාර්ග සම්බන්ධතාවයක් (Integration) පවතී. ඒ අනුව මෙම බියගම – කොළඹ මාර්ගය කැලණිය විහාරස්ථානයේ මායිමෙන් සම්බන්ධ වී තිබීම හේතුවෙන් එහි පවතින තදබදය හා ශබ්දය පූජා භූමි ප්‍රදේශයේ නිස්කලංකභාවයට මහත් බාධාවකි.

### 3. කැලණි ගං ඉවුරේ තාවකාලික පැල්පත් නිවාස 1200 ක් පමණ ව්‍යාප්තව තිබීම.

රූප සටහන 5.5 හි දැක්වෙන පරිදි වර්තමානයේ කැලණි ගඟ උතුරු බැම්මෙහි පැල්පත් නිවාස ව්‍යාප්තව පැවතීම නිසා පූජා භූමි ප්‍රදේශය කැලණි ගඟේ සෞන්දර්යාත්මක දර්ශනය සමඟ ඒකාබද්ධ වී ක්‍රියාත්මක වීමට බාධාවක් ව පවතී. මේ වන විට කැලණිය සැලසුම් ප්‍රදේශයට අයත් කැලණි ගං ඉවුරේ පැල්පත් නිවාස 1200 ක් පමණ ව්‍යාප්තව පවතින අතර පහත වගුව 5.4 හි දැක්වෙන සංඛ්‍යා දත්ත අනුව පූජා භූමි ප්‍රදේශය ආසන්නයට වන්නට පැල්පත් නිවාස 62 ක් පමණ ව්‍යාප්තව ඇත.



*රූප සටහන 5.5 : කැලණි ගඟ උතුරු බැම්ම අනවසර නිවාස*
*මූලාශ්‍රය : ගූගල් චන්ද්‍රිකා ඡායාරූප,2017/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

| ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ නම | පේළි නිවාස | පැල්පත් නිවාස | මුළු නිවාස ගණන |
|---|---|---|---|
| කැලණිය | 6 | 11 | 831 |
| මෑ වැල්ල | 72 | 46 | 1064 |
| පිලපිටිය | 5 | 1 | 566 |
| සිංහාරමුල්ල | 85 | 4 | 721 |

*වගුව 5.4 : කැලණි ගඟේ උතුරු බැම්ම අසළ පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශයන්හි පැල්පත් නිවාස*
*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව GIS දත්ත, 2014/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

## අවස්ථා | අරමුණ 01

### 1. පූජා භූමි ප්‍රදේශය සඳහා යෝජිත ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සැලැස්මෙහි කැලණි ගඟ ආශ්‍රිත ව්‍යාපෘති ඇතුළත් කර තිබීම.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද කැලණිය පූජා භූමියේ සැලැස්ම අනුව පූජා භූමි ප්‍රදේශය වටා ඇති නුසුදුසු ගොඩනැගිලි ඉවත් කිරීමටත් එගොඩ කැලණිය හා මෙගොඩ කැලණිය පාලම් පාරු, ජැටි හා එල්ලෙන පාලමක් මඟින් සම්බන්ධ කිරීමටත් යෝජනා කර ඇත. එම සැලසුම්මය මැදිහත්වීම් මඟින් පූජා භූමියේ ස්ථානීය වටිනාකම කැලණි ගඟ සමඟද සම්බන්ධ කරමින් සංවර්ධනය කිරීමට පවතින අවස්ථාව පුළුල් වේ.

මීට අමතරව ඒ යටතේ යෝජිත නව වාහන නැවතුම්පොළවල් සහ විවේකය ගතකිරීමට වෙන්කල ස්ථාන මඟින් බැතිමතුන් සඳහා පහසුකම් සැපයිය හැකිය. මෙම සියලු යෝජනාවන් සහිතව ජා. භෞ.සැ. දෙපාර්තමේන්තුව මඟින් යෝජනා කරන ලද කැලණිය පූජා භූමි සැලැස්ම ඇමුණුම 27 යටතේ දැක්වේ.

### 2. බස්නාහිර කලාපීය සැලසුමට අනුව කැලණිය ආගමික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනයට හඳුනාගෙන තිබීම.

රූප සටහන 5. 6 මඟින් දැක්වෙන බස්නාහිර කලාපීය මහ නගර සැලැස්ම අනුව, කැලණිය පූජා භූමිය ආගමික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර තිබේ. ඒ තුළින් මෙම ප්‍රදේශය නව දුරටත් පූජා භූමි කලාපයක් ලෙස සංවර්ධනය කිරීමෙහිලා කටයුතු යොදා තිබීම වැදගත් වේ.




*රූප සටහන 5.6 : බස්නාහිර කලාපීය මහ නගර සැලැස්ම*
*මූලාශ්‍රය : පෑලියගොඩ නගර සංවර්ධන සැලසුම් කෙටුම්පත - 2017, නා.සං.අ.*

### 3. බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැසුම් කෙටුම්පත - 2030 ට අනුව කැලණි ගං ඉවුර ආශ්‍රිත ප්‍රදේශය පරිසර සංරක්ෂණ කලාපයක් ලෙස හඳුනාගෙන තිබීම.

ඇමුණුම 08 හි දැක්වෙන පරිදි බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්මේ කෙටුම්පතට අනුව කැලණි ගඟේ දෙපසින් මීටර් 100 ක ආරක්ෂක කලාපයක් ලෙස පරිසර සංරක්ෂණයට යෝජනා කර ඇත. මේ අනුව කැලණි ගඟ හා ඒ ආශ්‍රිත භූ දර්ශනය නිර්මාණය වීම මඟින් පූජා භූමිය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා මෙය අවස්ථාවක් වේ.

### 4. කොළඹ මුල්‍ය නගර සංවර්ධන සැලැස්ම 2030 මඟින් කැලණි ගංගාව ආශ්‍රිත ප්‍රදේශය විශේෂ පුනර්ජීවන ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන තිබීම.

කැලණිය සැලසුම් කලාපයට අයත් හුණුපිටිය, වනවාසල සහ නාගේන ප්‍රදේශයන් යෝජිත කොළඹ මුල්‍ය නගර සංවර්ධන සැලසුම් කෙටුම්පතට ඇතුළත් කර ඇත. එය රූප සටහන 5. 7 මඟින් දැක්වේ. මෙම සැලැස්මෙහි සමස්ත දර්ශනය වන්නේ, "Aquarina" - The City in the Water යන්නයි. ඒ අනුව කැලණි ගඟ අවට ප්‍රදේශ පුනර්ජීවන ප්‍රදේශයක් ලෙස යෝජනා කර තිබේ. කැලණි රජමහා විහාරය කැලණි ගඟ සමඟ ද සම්බන්ධ කරමින් පූජා භූමි කලාපයක් ලෙස ස්ථාපිත කිරීමෙහිලා මෙම යෝජනාවන් අවස්ථාවක් කර ගත හැකිය.




*රූප සටහන 5.7 : කොළඹ මුල්‍ය නගර සංවර්ධන සැලසුම – 2030*
*මූලාශ්‍රය : කොළඹ මුල්‍ය නගර සංවර්ධන සැලසුම් කෙටුම්පත – 2030*

5. ***යෝජිත පරිපාලන අගනගර සැලැස්ම 2030 ට අනුව කැලණිය රජමහා විහාරය සහ අගනගරයේ කේන්ද්‍රය සම්බන්ධ වන සිරස් අක්ෂීය රේඛාවක් යෝජනා කර තිබීම.***




***රූප සටහන 5.8 :*** *කොළඹ පරිපාලන නගර සංකල්පිත සැලස්ම, 2019*
***මූලාශ්‍රය :*** *කොළඹ පරිපාලන නගර සැලසුම් කෙටුම්පත, 2019*

ඉහත 5.8 රූප සටහනේ දැක්වෙන යෝජිත පරිපාලන නගර සැලසුම් කෙටුම්පතට අනුව කොළඹ අගනගරය කේන්ද්‍ර කොටගෙන කැලණිය පූජා භූමිය දක්වා සිරස් අක්ෂයක් හරහා සමස්ත ප්‍රදේශයේම දෘෂ්‍ය ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීමට යෝජනා කර තිබේ. කැලණිය පූජා භූමිය කේන්ද්‍රය කොටගත් කේන්ද්‍රස්ථානය ලෙස එහි 'අද්විතීය ආගමික සහ ඓතිහාසික හැඟීම වැඩිදියුණු කිරීම සඳහා මෙය අවස්ථාවක් වනු ඇත.

## **තර්ජන** | අරමුණ 01

1. ***කොළඹ මහා නගර සැලැස්මේ නියෝග වලට අනුව පෑලියගොඩ සිට රාගම දෙසට ප්‍රදේශය ලොජිස්ටික් කොරිඩෝව වශයෙන් හඳුනාගෙන තිබීමේ ප්‍රතිඵලයක් ලෙස පූජා භූමි ප්‍රදේශයට කර්මාන්ත ව්‍යාප්ත වීමේ ඉඩකඩ වැඩි වීම.***

කොළඹ මහානගර සැලැස්ම අනුව රූප සටහන 5. 9 හි දැක්වෙන පරිදි කොළඹ වරායේ සිට කටුනායකට පෑලියගොඩ, කැලණිය ප්‍රදේශය හරහා දුම්රිය මාර්ගය හා අධිවේගී මාර්ගය ජාලය පදනම් කරගනිමින් ලොජිස්ටික් කොරිඩෝව ලෙස ප්‍රවර්ධනය කිරීමට නියමිතය. ඒ අනුව මෙම ප්‍රදේශය බහාලුම් පහසුකම්, ගබඩා, දේශීය මට්ටමේ භාණ්ඩ බෙදා හැරීම යන ආදිය සඳහා විශේෂයෙන් සංවර්ධනය කෙරේ. මෙම උපායමාර්ගික පිහිටීම පදනම් කරගනිමින් ප්‍රදේශය පුරා පහත්බිම් ගොඩ කෙරෙමින් ව්‍යාප්තව පවතින ගබඩා ව්‍යාප්තිය නිසා එය පූජා භූමි ප්‍රදේශය දක්වාම ව්‍යාප්ත වීම නිසා පූජා භූමි කලාපයට සුදුසු නොවන භූමි පරිහරණයන් තවදුරටත් ව්‍යාප්තවීමේ අවදානමක් පවතී.




***රූප සටහන 5.9 :*** *කොළඹ මහානගර සැලැස්මේ බලපෑම*
***මූලාශ්‍රය :*** *පෑලියගොඩ සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම කෙටුම්පත,2017*

## අරමුණ 02

*ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්‍ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීම.*

## ශක්තීන් | අරමුණ 02

ප්‍රදේශය තුළ ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන සංරචකයන් පැවතීම කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහි කිරීම කෙරෙහි පවතින ශක්තීන් වේ.

### 1. *මාර්ග ප්‍රවේශය සහ සම්බන්ධතාවය (Accessibility and connectivity)*

කැලණිය සැලසුම් ප්‍රදේශය, කොළඹ හා නදාසන්න ප්‍රදේශවල රැකියා ස්ථානයන්ට හා අධ්‍යාපන මධ්‍යස්ථානයන්ට පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක පිහිටා ඇත. එය රූප සටහන 5. 10 මඟින් දැක්වේ. ඒ අනුව බොහෝ රැකියා මධ්‍යස්ථාන වෙත ගමන් කිරීමට ගතවන උපරිම කාලය විනාඩි 40 කි. එම නිසා මෙම ප්‍රදේශය ගමනාගමනය පාදක කොට ගෙන කොළඹ ආශ්‍රිතව රැකියාවන්හි නිරත වන ජනතාවට වාසස්ථාන සපයන ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකිය.




- *කැලණිය විශ්ව විද්‍යාලය ප්‍රදේශය තුළ පිහිටා තිබීම*
- *කොළඹ වරාය හා වාණිජ නගරය - 14 km*
- *ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන නගරය – 8 km*
- *බියගම වෙළඳ කලාපය – 13 km*
- *සපුගස්කන්ද තෙල් පිරිපහදුව – 5.5 km*
- *කටුනායක වෙළඳ කලාපය – 30 km (අධිවේගී මාර්ගය හරහා මිනිත්තු 20)*
- *කෙරවළපිටිය කර්මාන්ත කලාපය - 10 Km (අධිවේගී මාර්ගය හරහා මිනිත්තු 7)*

***රූප සටහන 5.10 :*** *මාර්ග සම්බන්ධතා හා ප්‍රවේශ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙම කලාපීය සම්බන්ධතාවය අනුව කිරිබත්ගොඩ 1 වන ගණයේ නගරයක් ලෙසත් හුණුපිටිය සහ කැලණිය නගර දෙවන ගණයේ නගර ලෙසත් කලාපයේ මාර්ගය සම්බන්ධතා පදනම් කොටගෙන වර්ගීකරණය කළ හැකි අතර එය ඇමුණුම 11 මඟින් තවදුරටත් විශ්ලේෂණය කෙරේ. මෙම ස්ථානීය පිහිටීමේ වාසිය මත මෙම ප්‍රදේශය ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන ප්‍රදේශයක් ලෙස සංවර්ධන කිරීමේ හැකියාවක් පවතී.

## 2. *ප්‍රවාහන අතුරුමුහුණත් සහිත ප්‍රධාන ගමනාගමන කොරිඩෝව තුළ පිහිටා තිබෙන ප්‍රදේශයක් වීම (Transit corridors with transportation interfaces)*

ප්‍රධාන වශයෙන් සැලසුම් කලාපය හරහා ගමන් කරන කොළඹ – නුවර (A1) මාර්ගය සමඟ සෘජුවම සම්බන්ධ වන ප්‍රදේශයකි. මේ හරහා ජාතික මාර්ග ජාලයට සම්බන්ධ වීමේ ඉහළ ප්‍රවේශයක් පවතී. එමෙන්ම කලාපය ඔස්සේ ගමන් කරන මහනුවර ප්‍රධාන දුම්රිය මාර්ගය හුණුපිටිය, වනවාසල සහ කැලණිය යන ආසන්න දුම්රිය ස්ථානයන් සහිතව පිහිටා තිබීම හේතු කොට ගෙන අතීතයේ සිටම ජාතික වශයෙන් ලංකාවේ බොහෝ ප්‍රදේශවලට පහසුවෙන් ළඟාවීමේ හැකියාවක් පවතී. එන්මන් සංවර්ධන විභවතාවයන් පිළිබඳව සැලකීමේදී, ඇමුණුම 03 දැක්වෙන පරිදි කැලණිය ප්‍රදේශයට ආසන්නයෙන්ම ඊසාන හා නිරිත දෙසින් පිළිවෙලින් කි.මී. 3 දුරින් කඩවත අන්තර් හුවමාරු මධ්‍යස්ථානයත්, කි.මී.2 දුරින් පැලියගොඩ අන්තර් හුවමාරු මධ්‍යස්ථානයත් පිහිටා තිබීමෙන් විවිධ ප්‍රවාහන ජාලයන්ට පහසු සම්බන්ධතාවයක් පවතී. මේ ආකාරයේ බහු මාධ්‍ය ගමනාගමන අතුරු මුහුණත් සම්බන්ධ වීම මඟින් මෙම ප්‍රදේශයේ ගමනාගමනය පාදක කොටගත් සංවර්ධනයක් සඳහා දායකත්වය ලබා දෙයි.

## 3. *ඝනත්වය - (Density)*

ගමනාගමනය පාදක කොට ගත් සංවර්ධන න්‍යායන්ට (TOD) අනුව සිටිය යුතු අවම ජන ඝනත්වය හෙක්ටයාරයකට අවම පුද්ගලයන් ප්‍රමාණය 40 කි. පරිච්ඡේද 2 හි සඳහන් රූප සටහන 2. 3 හි විශ්ලේෂණය කෙරෙන පරිදි කැලණිය ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පවතින ජනගහන ඝනත්වය හෙක්ටයාරයකට පුද්ගලයින් 61 ක් වේ. එසේම ඇමුණුම 05 ට අනුව ප්‍රදේශයේ භූමි පරිභෝජනය පිළිබඳව සලකා බැලීමේදී මුළු භූමි ප්‍රමාණයෙන් 58% ක් නේවාසික භාවිතය සඳහා යොදා ගෙන ඇත. එබැවින්, සැලසුම් කලාපය ගමනාගමන කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධයන කිරීම සඳහා වර්තමාන ජනගහන ඝනත්වය අවශ්‍ය අවම ප්‍රමාණය ඉක්මවා ඇත. මෙහි ඇමුණුම 28 හි දැක්වෙන ජනාවාස යෝග්‍යතා ප්‍රදේශ විශ්ලේෂණයට අනුව, මුළු භූමි ප්‍රමාණයෙන් 50% ක් පමණ ඉහළ ඝනත්වයෙන් යුත් ජනාවාස බෙදා හැරීම සඳහා සුදුසු වේ. එසේම කලාපයේ උතුරු දෙසට අධි ඝනත්වයක් සහිතව සංවර්ධනය වීමට සුදුසු ප්‍රදේශයක් ලෙස විශ්ලේෂණ මඟින් පැහැදිලි වේ.

## 4. *මිශ්‍ර භාවිත - (Mixed of use)*

සැලසුම් ප්‍රදේශය තුළ සේවා, සාප්පු සංකීර්ණ , අධ්‍යාපන , නිවාස සහ රැකියා ස්ථානයන් වැනි භාවිතයන් වැඩි වශයෙන් පවතී. කිරිබත්ගොඩ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයක් ලෙසත්, කැලණිය විශ්ව විද්‍යාලය පිහිටීම අනුව දළුගම ප්‍රධාන අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙසත්, පැලියගොඩට ආසන්න ප්‍රදේශය කර්මාන්ත හා ප්‍රවාහන කටයුතු සඳහාත්, කැලණිය විහාරස්ථාන ප්‍රදේශය ප්‍රධාන ආගමික මධ්‍යස්ථානයක් ලෙසත්, වැඩි වශයෙන් නේවාසික භාවිතයන් ආදී වශයෙන් මිශ්‍ර භූමි පරිහරණ ව්‍යාප්තියක් පවතී. ප්‍රධාන මාර්ගය දෙපස මී. 500 ක් දෙපසට විහිදෙන භූමි පරිහරණය සලකා බැලූ විට පහත රූප සටහන 5. 11 පරිදි භූමි පරිහරණය හඳුනාගත හැකිය.




**රූප සටහන 5.11 :** *කිරිබත්ගොඩ A1 මාර්ගයේ දෙපස මීටර් 500 ක භූමි පරිහරණය*
**මූලාශ්‍රය :** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙසේ පවතින මිශ්‍ර භාවිතය හේතුවෙන් මෙම ප්‍රදේශයට විවිධ අවශ්‍යතා සපුරා ගැනීමට දෛනිකව පැමිණෙන ජනගහනය ආසන්න වශයෙන් 100,000 ක් පමණ වේ. එය රූප සටහන 5.12 හි දැක්වෙන දෛනික සංසරණ ජනගහනයේ තීව්‍රතාවය අනුව හඳුනාගත හැකිය.




**රූප සටහන 5.12 :** *කිරිබත්ගොඩට ඇදී එන දෛනික ජනගහනය*
**මූලාශ්‍රය :** *පෑලියගොඩ සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම කෙටුම්පත,2017*

මෙසේ මිශ්‍ර භාවිතයක් සහිත ප්‍රදේශයට දෛනික සේවා සපයන ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයක් ලෙස කිරිබත්ගොඩ පැවතීමත් එය ගමනාගමනය පාදක කොට ගත් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් ලෙස සංවර්ධනය කිරීමෙහිලා අවස්ථාවක් වේ.

### 5. *සංයුක්ත සංවර්ධනය - (compact Development)*

ගමනාගමනය පාදක කොට ගත් සංවර්ධනයක් (TOD) සඳහා සංයුක්ත සංවර්ධනයක් පැවතීම අත්‍යාවශ්‍ය වේ. ඇමුණුම 17 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ සංවර්ධන පීඩනය සලකා බැලීමේදී, කිරිබත්ගොඩ කේන්ද්‍රව හුණුපිටිය සහ මාකොළ දෙසට විහිදී යන ඉහළ සංවර්ධන පීඩනයක් දැකිය හැකිය. මෙසේ පවතින සංයුක්ත සංවර්ධනය ගමනාගමන පහසුකම් සහිත මධ්‍යස්ථානයන් ආශ්‍රිතව සංයුක්ත සංවර්ධනයක් ඇති කිරීම කෙරෙහි යෝග්‍ය වේ.

## දුර්වලතා | අරමුණ 02

### 1. *ප්‍රධාන මාර්ගය ඔස්සේ පවතින අධික රථ වාහන තදබදය (උපරිම පැයවලදී උපරිම වේගය පැ.කි.මී. 10- 15).*

කිරිබත්ගොඩ ආසන්නව කොළඹ – නුවර මාර්ගයේ පවතින අධික රථවාහන තදබදය මෙම ප්‍රදේශයේ හා මේ හරහා ගමන් කරන ජනතාවට මහත් අවහිරයක් වී ඇත. තදබදය උපරිම පැයවලදී පෑලිය-ගොඩ සිට මහර දක්වා රථවාහන ගමන් වේගය පැ.කි.මී 15 ක් පමණ වේ. මෙසේ වගුව 5.5 අනුව කිරිබත්ගොඩ හරහා කි.මී. 8 ක් පමණ ගමන් කිරීමට විනාඩි 45 කට වඩා ගත වේ.

| මාර්ගය | දුර | ගමන් වේගය | සාමාන්‍ය ගමන් කාලය |
|---|---|---|---|
| කොළඹ-නුවර මාර්ගය (පෑලියගොඩ සිට මහර දක්වා) | කි. මී. 8 | පැ. කි. මී. 10-20 | විනාඩි 40 |

**වගුව 5.5 :** *කිරිබත්ගොඩ ප්‍රදේශයේ උපරිම පැයක සාමාන්‍ය ගමන් කාලය*
**මූලාශ්‍රය :** *Com-Trans අධ්‍යයන වාර්තාව,2014 සහ ගූගල් සිතියම් / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

### 2. *බහු මාදිලි ප්‍රවාහන ක්‍රම අතර නිසි සම්බන්ධතාවයක් නොමැති වීම හා පදික පහසුකම් නොමැති වීම (pedestrian oriented facilities, multi-model transport interfaces)*

ගමනාගමනය පාදක කොටගත් සංවර්ධයක් සඳහා බහු මාදිලි ප්‍රවාහන ක්‍රම අතර නිසි සබඳතාවයක් තිබිය යුතුය. මේ ප්‍රදේශයේ පවතින බස් නැවතුම්පොළවල් හා දුම්රිය නැවතුම්පොළවල් නිසි පරිදි සම්බන්ධ වී නොමැත. පහත 5.6 වගුව හා 5.13 රූප සටහන මඟින් දැක්වෙන පරිදි මේවා අතර පවතින දුර පුද්ගලයෙකුට ඇවිදී යා හැකි දුරට (500 – 800 m) වඩා වැඩිය.

| | ගුණුපිටිය දුම්රිය නැවතුම්පොළ | වනවාසල දුම්රිය නැවතුම්පොළ | කැලණිය දුම්රිය නැවතුම්පොළ |
|---|---|---|---|
| කිරිබත්ගොඩ බස් නැවතුම්පොළ | 4.6 km | 5 km | 4.8 km |
| කැලණිය බස් නැවතුම්පොළ | 6 km | 5 km | 4 km |

***වගුව 5.6 :*** *කැලණිය බහු මාදිලි ප්‍රවාහන සම්බන්ධතා*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 5.13 :*** *කැලණිය බහු මාදිලි ප්‍රවාහන සම්බන්ධතාවල දුර්වලතාවය*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

රූප සටහන 5. 14 හි දැක්වෙන පරිදි දිනකට 100,000 ක පමණ ජනතාවක් සැරිසරන කිරිබත්ගොඩ නගරය තුළ, කොළඹ- නුවර මාර්ගයේ පදික මංතීරුවල පළල මී. 1ක් පමණ වේ. එසේම කලාපයේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයක් ලෙස නගරය භාවිත කරන ජනතාවගේ සුව පහසුව සඳහා විවේක ස්ථානයන් ද නොමැත. විශාල දෛනික ජනගහනයක් සැරිසරන ප්‍රදේශයක් ලෙස මෙය සලකා බැලිය යුතු කාරණාවකි.



***රූප සටහන 5.14 :** කිරිබත්ගොඩ පටු පදික මං තීරු*
***ඡායාරූපය :** කේ.සී. එල් ජයරත්න පෙරේරා*

එසේම රූප සටහන 5. 15 හි දැක්වෙන පරිදි නගරයට පැමිණෙන රථවාහන ගාල් කිරීම උදෙසා පොදු රථගාල් නොමැති වීම හේතුවෙන් ප්‍රධාන මාර්ගය ඔස්සේ රථවාහන ගාල් කිරීම සුලබව දැකිය හැකිය. මෙය රථවාහන තදබදයට ද හේතු වේ.



***රූප සටහන 5.15 :** කිරිබත්ගොඩ ප්‍රධාන මාර්ග ඔස්සේ රථවාහන ගාල් කිරීම*
***ඡායාරූපය :** කේ.සී. එල් ජයරත්න පෙරේරා*

## අවස්ථා | අරමුණ 02

ගමනාගමනය පාදක කොටගත් සංවර්ධනයක් (TOD) සඳහා අනුබල දෙන ජාතික හා ප්‍රාදේශීය සැලසුම්මය මැදිහත්වීම් තුළින් ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීම කෙරෙහි ඍජු හා වක්‍ර වාසිදායක අවස්ථාවන් පවතී.

### 1. *ජාතික භෞතික සැලැස්ම 2018-2050 ට අනුව සැලසුම් ප්‍රදේශය, නැගෙනහිර-බටහිර ආර්ථික තීරයට අයත් වීම.*

2050 ජාතික භෞතික සැලැස්මෙන් යෝජනා කර ඇති ආකාරයට, කැලණිය ප්‍රාදේශය නැගෙනහිර සහ බටහිර ආර්ථික තීරයට අයත් වේ. මෙම ප්‍රධාන ආර්ථික කොරිඩෝවේ ජනගහනය 20% –30% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ. ඇමුණුම 07 හි දැක්වෙන පරිදි 2050 වසර වන විට කැලණිය ප්‍රා.ලේ. කොට්ඨාශය තුළ ජනගහනය ව.කි.මී. පුද්ගලයන් 6000 – 10000 දක්වා වර්ධනය කිරීමට මේ මඟින් යෝජනා වී ඇත. එබැවින්, මෙම ප්‍රදේශය ගමනාගමනය පාදක කරගත් නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අවස්ථාවක් ලැබී ඇත.

### 2. *යෝජිත පොදු ප්‍රවාහන සේවයන්ගේ බලපෑම ඍජුවම ලබන ප්‍රදේශයක් වීම. (ඉදිවෙමින් පවතින පිටත වටරවුම් අධිවේගී මාර්ගය / මහනුවර අධිවේගී මාර්ගය / සැහැල්ලු දුම්රිය සේවා හා දුම්රිය නවීකරණ)*

කඩවත අධිවේගී මාර්ග අන්තර් හුවමාරු මධ්‍යස්ථානයට කි.මී. 3 ක් පමණ ආසන්නයෙන් පිහිටා තිබෙන ප්‍රදේශයක් ලෙස දැනට ඉදිවෙමින් පවතින කඩවත සිට කෙරවලපිටිය දක්වා දිවෙන පිටත වටරවුම් අධිවේගී මාර්ගයටත්, කඩවත සිට මහනුවර යාකෙරෙන ඉදිවෙමින් පවතින මහනුවර අධිවේගී මාර්ගයටත් පහසුවෙන් ළඟා වීමේ හැකියාවක් පවතින ප්‍රදේශයක් ලෙස ඉදිරි සංවර්ධන ප්‍රවණතාවන්ට ඍජුවම අවස්ථාවක් සැලසේ. යෝජිත දුම්රිය නවීකරණය යටතේ ප්‍රධාන දුම්රිය මාර්ගය පානදුර සිට වේයන්ගොඩ දක්වා නවීකරණය කිරීමට යෝජනා වී ඇත. වහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගෙන ඇති මෙම ව්‍යාපෘතිය මඟින් මෙම ප්‍රදේශයට ඍජු බලපෑමක් එල්ල වේ. සැලසුම් ප්‍රදේශය තුළ පවතින හුණුපිටිය හා වනවාසල දුම්රිය ස්ථානයන් ද ආසන්නයේ පවතින කැලණිය දුම්රිය ස්ථානයද ලෙස දුම්රිය ස්ථානයන් තුනක් පැවතීම නිසා ගමනාගමනය සඳහා ඍජු දායකත්ව-යක් ලබා දේ.

එසේම දීර්ඝ කාලීන ව්‍යාපෘතියක් ලෙස යෝජිත නව බියගම – කොස්ගම දුම්රිය මාර්ගය කැලණිය හරහා සම්බන්ධ කිරීමට යෝජිත වී තිබීමත්, මෙහි ප්‍රවාහන හා ගමනාගමනය සඳහා යෝග්‍ය ඉඩ ප්‍රස්ථාවක් නිර්මාණය කරයි. ඒ අනුව නව දුම්රිය මාර්ගයේ දුම්රිය නැවතුම් පොළක් මෙම ප්‍රදේශය තුළ ද ස්ථාන ගත වීමේ අවශ්‍යතාවයක් පවතී.

දුම්රිය ප්‍රවාහනයට අමතරව යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගයන්ගේද ඍජු බලපෑම ලබන ප්‍රදේශයක් ලෙස මෙය හඳුනාගත හැකිය. ඒ අනුව යෝජිත රාගම – නාරාහේන්පිට සැහැල්ලු දුම්රිය මාර්ගයත්, හුණුපිටිය – කොට්ටාව සැහැල්ලු දුම්රිය මාර්ගයත් මෙම ප්‍රදේශය ඔස්සේ සම්බන්ධ වන අතර හුණුපිටිය, මානෙල්ගම, ටයර් හංදිය, කිරිබත්ගොඩ, හා පොල්හේන යන ස්ථානයන් සැහැල්ලු දුම්රිය නැවතුම් පොළවල් ලෙස සැලසුම් කර ඇත. මීට අමතරව ප්‍රදේශය ආසන්නයේම දකුණු දෙසින් පවතින කැලණිමුල්ලත්, ඊසාන දෙසින් පවතින මහර ප්‍රදේශයත් සැහැල්ලු දුම්රිය නැවතුම් පොළවල් ස්ථාන ගත කිරීම සඳහා යෝජනා වී ඇත. ඉහත සඳහන් යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග, දුම්රිය නවීකරණයන් හා නව දුම්රිය මාර්ගයන්හි ස්ථාන ගත කිරීම් ඇමුණුම 29 මඟින් දැක්වේ. මෙසේ යෝජිත පොදු ප්‍රවාහන සේවයන්ගේ ප්‍රතිඵලයක් ලෙස පහත 5.16 රූපය අනුව කොළඹ නගර සංවර්ධන සැලැස්මට අනුව

පෑලියගොඩ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති අතර සැලසුම් කලාපය තුළ පවතින හුණුපිටිය තෙවන ප්‍රමුඛතා නගරයක් ලෙස හදුනාගෙන ඇත.




***රූප සටහන 5.16 :** යෝජිත කොළඹ මූල්‍ය නගර සැලැස්ම - 2030 ට අනුව නාගරික මධ්‍යස්ථාන ධූරාවලිය*
***මූලාශ්‍රය :** කොළඹ මූල්‍ය නගර සංවර්ධන සැලසුම් කෙටුම්පත – 2030*

මෙම යෝජනා අනුව සැලසුම් ප්‍රදේශයේ පවතින කිරිබත්ගොඩ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයට අමතරව හුණුපිටිය, ටයර් හංදිය යන ප්‍රදේශ උප මධ්‍යස්ථානයන් ලෙස සංවර්ධනය කිරීම සඳහා යෝග්‍ය වේ.

### 3. *පැලියගොඩ සංවර්ධන සැලසුම් කෙටුම්පත- 2030 ට අනුව මාර්ගය තදබදය අවම කිරීම සඳහා සැලසුම් ප්‍රදේශය හරහා පරිපාලන නගර සම්බන්ධ කරමින් සම්බන්ධිත මාර්ගයක් යෝජනා වී තිබීම.*

පහත රූප සටහන 5.17 හි දැක්වෙන පරිදි පැලියගොඩ සංවර්ධන සැලැස්ම තුළින් ධූරාවලිය මාර්ග පද්ධතියක් ස්ථාපිත කරමින් රථවාහන තදබදය අවම කිරීමට යෝජනා වී ඇත. මෙහිදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා පැරණි කැලණි පාලම වැඩි දියුණු කිරීමටත් පැලියගොඩ – කැලණිය හරහා කැලණි ගඟ ඔස්සේ කොළඹට පවතින ප්‍රවේශයන් පුළුල් කිරීමටත් යෝජනා කර ඇත. මෙසේ යෝජිත ධූරාවලිය මාර්ග ජාලයට ටයර් හංදියේ සිට කැලණි විහාරය සම්බන්ධ කෙරෙන මාර්ගයද ඇතුළත් වේ. එසේම යෝජිත නව දුම්රිය මාර්ගය පාදක කරගනිමින් නුන්ගමුගොඩ දුම්රිය පොළක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මේ අනුව මෙම උපායමාර්ග ප්‍රදේශයේ රථවාහන තදබදයට විසඳුමක් විය හැකි අතර ගමනාගමනය පාදක කරගත් ඵලදායී හා කාර්යක්ෂම නගරයක් බිහි කිරීමෙහිලා දායක විය හැකිය.




***රූප සටහන 5.17 :*** *යෝජිත මාර්ගය හා ගමනාගමන සංවර්ධන උපායමාර්ගය (පැලියගොඩ සංවර්ධන සැලසුම් කෙටුම්පත)*
***මූලාශ්‍රය :*** *පැලියගොඩ සංවර්ධන සැලසුම් කෙටුම්පත-2017*

## තර්ජන | අරමුණ 02

### 1. *පුද්ගලයින් 20,000 ට ආසන්න ප්‍රමාණයක් වාර්ෂික ගංවතුරෙන් පීඩාවට පත් වීම.*

කැලණිය ප්‍රදේශයට බලපැවැත්වෙන ගංගා ආශ්‍රිත ගංවතුර මෙන්ම ක්ෂණික ගංවතුර තත්ත්වය පිළිබඳව පරිච්ඡේදය 03 හි 3.2 අනු මාතෘකාව යටතේ දීර්ඝ වශයෙන් විස්තර කෙරේ. එහි රූප සටහන 3. 5. හි දැක්වෙන පරිදි වාර්ෂිකව 20000කට ආසන්න ප්‍රමාණයක් ගංවතුර අවදානමට ලක්වේ. මෙසේ ඇමුණුම 21 හි දැක්වෙන ප්‍රදේශ ආශ්‍රිතව මි.මී. 150 ට වැඩි සුළු වර්ෂාවන්හිදී පවා ජලයෙන් යට වීම හේතුවෙන් ආසන්න රැකියා ස්ථානයන් පාදක කරගෙන මෙහි පදිංචිව සිටින ජනතාව මෙන්ම, පාසල් ළමුන්ද දැඩි ලෙස අපහසුතාවට පත්වේ.

## අරමුණ 03

*නීල හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීම.*

## ශක්තීන් | අරමුණ 03

### 1. *කැලණි ගඟ ප්‍රධාන ජල මූලාශ්‍රය කරගනිමින් ඇළ මාර්ග පද්ධතියක් සමඟ මෙම ප්‍රදේශය පහළ කැලණි ගංගා ආශ්‍රිත උප ද්‍රෝණියකට අයත් වීම.*

ඇමුණුම 30 හි දැක්වෙන පරිදි මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අනුව සමස්ත කැලණි ගංගා ද්‍රෝණිය, උප ද්‍රෝණිය 20 කට බෙදා ඇති අතර සැලසුම් ප්‍රදේශය පහළ කැලණි ගංගා උප ද්‍රෝණියට අයත් වේ. ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 2% ක් පමණ ජලාශ්‍රිත ප්‍රදේශ වන අතර කැලණි ගංගාව ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස පවතී. මීට අමතරව වත්තල කළු ඇළ සමඟ ද සම්බන්ධ කෙරෙන ඇළ මාර්ග පද්ධතියක් ප්‍රදේශය පුරා ව්‍යාප්තව ඇති ආකාරය ඇමුණුම 25 මඟින් දැක්වේ. ඒ අනුව කුඹල් ඔය, නාන ඇළ, ඊරි ඇළ, හපුගහ වේල්ල, මුදුන් ඇළ හා මහර මුදුන් ඇළ යන සෙසු ඇළ මාර්ගයන් නාගරික ප්‍රදේශය තුළ ජලාශ්‍රිත පරිසරයට ඒකාබද්ධ කරගනිමින් හිතකාමී පාරිසරික පද්ධතියක් ගොඩනැඟීමෙහි ලා වැදගත්වේ.

### 2. *මුළු භූමි ප්‍රමාණයෙන් 15 % ක හරිත තෙත්බිම් ප්‍රමාණයක් ඉතිරිව පැවතීම.*

කොළඹට තදාසන්න ප්‍රදේශයක් ලෙස අධි ජනාකීර්ණත්වයක් සමඟ පහත් බිම් ගොඩ කිරීම වැනි තර්ජනයන් හමුවේ ඇමුණුම 15 හි දැක්වෙන පරිදි තව දුරටත් මුළු භූමි ප්‍රමාණයෙන් 15% ක් පමණ හරිත තෙත් බිම් ප්‍රමාණයක් ඉතිරිව පවතී. ගංවතුර උවදුර හා නාගරික තාපය ඉහළ යාමේ අවධානය හමුවේ එම පාරිසරික ගැටළු අවම කිරීමෙහිලා ශක්තියක් ලෙස මෙය හඳුනා ගත හැකිය.

### 3. *හරිත නගරයක් බිහි කිරීම සඳහා මූලාරම්භක ස්ථාන පැවතීම. (උදා: කැලණිය විශ්ව විද්‍යාලය / කැලණිය විහාරය / කැලණි ගඟ උතුරු බැම්ම සංරක්ෂණ කලාපය)*

හරිත නගරයක් බිහි කිරීම සඳහා මූලාරම්භය ලෙස ගත හැකි පොදු ප්‍රදේශයන් ලෙස හෙක්.13ක පමණ විහිදී පවතින කැලණි විහාරයත්, හෙක්. 15ක භූමි ප්‍රමාණයක විසිරී තිබෙන කැලණිය විශ්ව විද්‍යාලයත් මෙන්ම හෙක්. 53 ක භූමි ප්‍රමාණයක් මෙම ප්‍රදේශයට අයත් වන කැලණි ගඟ උතුරු බැම්ම සංරක්ෂණ කලාපයත් හරිත නගරයක් ලෙස ප්‍රවර්ධනය සඳහා යෝග්‍ය වේ.

## දුර්වලතා | අරමුණ 03

### 1. කැලණි ගඟ හා දුම්රිය සංරක්ෂණ අවකාශයන් තුළ පැල්පත් නිවාස විසිරී තිබීම.

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැල්පත් හා පේළි නිවාස ඒකක 743 ක් පැතිරී ඇත. රූප සටහන 5.18 හි දැක්වෙන පරිදි මේවා විශාල වශයෙන් කැලණි ගංගා රක්ෂිතයේ, දුම්රිය රක්ෂිත අවට හා පහත් බිම් ආශ්‍රිතව ව්‍යාප්තව ඇති අතර එය ඇමුණුම 31 මඟින් විශ්ලේෂණය කරයි. ඇමුණුම 32 හි දැක්වෙන පරිදි, පැල්පත් හා මුඩුක්කු නිවාසවලින් 43% ක් ම කැලණි ගඟේ උතුරු බැම්ම යාබද ප්‍රදේශයේ විසිරී ඇත. තවද මුළු නිවාස පැල්පත් වලින් 21% ක් ම හුණුපිටිය උතුර / දකුණ, වනවාසල සහ වෙලේගොඩ වැනි දුම්රිය මාර්ගයට යාබද ප්‍රදේශ වල නිරීක්ෂණය කළ හැක. අනෙකුත් පැල්පත් හා මුඩුක්කු නිවාස පහත්බිම් අවට පිහිටා තිබේ.




*රූප සටහන 5.18 : කැලණි ගඟ උතුරු ඉවුර හා ඊරියවැටිය තෙත්බිම් ආශ්‍රිත පැල්පත් නිවාස*
*මූලාශ්‍රය : googlesteetview, 2015*

### 2. ප්‍රදේශය තුළ පවතින සෑම ඇළ මාර්ගයක්ම මීටර 500 කට වැඩි ප්‍රමාණයක් අවහිර වී පැවතීම.

ඇමුණුම 33 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ ස්වභාවික ජල ගැලීමට අනුව, එක් එක් ඇළ මාර්ගයන් දිගින් මී. 500 කට වඩා වැඩි ප්‍රමාණයක් අවහිර වී තිබේ. එම ඇළ මාර්ග හා අවහිර වී ඇති ප්‍රමාණයන් වගුව 5.7 හි දැක්වෙන අතර ඊට අදාල ඡායාරූප රූප සටහන 5.19 හි දැක්වේ. මෙම තත්ත්වය ක්ෂණික ගංවතුර වැනි පාරිසරික ගැටලු ඇති වීමට හේතු වී ඇත.

| ඇළ මාර්ගයේ නම | අවහිර වී ඇති දිග ප්‍රමාණය |
|---|---|
| නාථ ඇළ (ගෝනාවල සිට කලු ඇළ දක්වා) | කි.මී. 3 |
| ඊරි ඇළ (ඊරියවැටියේ සිට කළු ඇළ දක්වා) | කි.මී. 3.4 |
| හපුගහ වේල්ල (කිරිබත්ගොඩ සිට මහර මුදුන් ඇළ දක්වා) | කි.මී. 1.5 |
| මුදුන් ඇළ | මී. 800 |
| කුඹුල් ඔය (පෙතියාගොඩ සිට කැලණි ගඟ දක්වා) | කි.මී. 6 |

*වගුව 5.7 : කැලණි ප්‍රදේශයේ ඇළ මාර්ගය අවහිර වී ඇති ප්‍රමාණය*
*මූලාශ්‍රය : සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017/ GIS විශ්ලේෂණය - ස්වාභාවික ජල මාර්ගය සැකැස්ම හා පවත්නා ඇළ මාර්ගයන්*

**05 පරිච්ඡේදය**
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT විශ්ලේෂණය







***රූප සටහන 5.19 :** ප්‍රදේශයේ ඇළ මාර්ග අවහිර වී ඇති ආකාරය*
***ඡායාරූපය :** ඒ. එම්. සී. සමන්තිලක*

### 3. *ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිසි ක්‍රියාමාර්ගයන් නොමැති වීම.*

කැලණිය ප්‍රා.සභාවේ තොරතුරු අනුව දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 110 – 120 අතර වේ. මෙයින් 80 % ක් එක් රැස් කිරීම් කළද මුදා හැරීමේ ස්ථානයන් පිළිබඳව නව දුරටත් ගැටලු පවතී. පහත රූප සටහන 5.20 මඟින් දැක්වෙන පරිදි මේ වන විට මානෙල්ගම කුණු අංගනයේ ධාරිතාවද ඉක්මවා ඇත.



***රූප සටහන 5.20 :** මානෙල්ගම කුණු අංගනය හා කොම්පෝස්ට් ව්‍යාපෘතිය*
***ඡායාරූපය :** ඒ. එම්. සී. සමන්තිලක*

1. ***යෝජිත බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්ම - 2030 ට අනුව කැලණි ගඟ ආශ්‍රිතව පරිසර සංරක්ෂණ කලාපයක් ලෙස හඳුනාගෙන තිබීම.***

ඇමුණුම 08 හි දැක්වෙන පරිදි 2030 යෝජිත බස්නාහිර කලාපීය ව්‍යුහ සැලැස්මට අනුව, කැලණි ගඟ දෙපස පරිසර සංරක්ෂණ කලාපයක් ලෙස නම්කොට මී. 100 ක සංරක්ෂණ කලාපයක් ලෙස යෝජනා කර ඇත. එමෙන්ම අනවසර හා අවිධිමත් ජනාවාස නැවත ස්ථානගත කරමින් ජල ආශ්‍රිත විවෘත භූමි ලෙස වෙන්කර ඇති ප්‍රදේශ නිර්මාණය කිරීමට එමඟින් අවස්ථාවක් සැලසේ. මෙය හරිත නගරයක් නිර්මාණය කිරීම කෙරෙහි ඉතා යෝග්‍ය වේ.

2. ***කැලණිය විශ්ව විද්‍යාලය මෙරට ප්‍රථම හරිත සරසවිය ලෙස හඳුනාගෙන තිබීම.***




***රූප සටහන 5.21 :** කැලණිය හරිත සරසවිය*
***මූලාශ්‍රය :** කැලණිය විශ්වවිද්‍යාලය වෙබ් අඩවිය,2014*

2014 වසරේදී කැලණිය විශ්වවිද්‍යාලය මෙරට ප්‍රථම හරිත සරසවිය ලෙස නම්කර තිබේ. ඒ බව ඉහත සඳහන් පුවත්පත් වාර්තා මඟින් තවදුරටත් තහවුරු වේ. මෙය සරසවි භූමියෙන් පිටතට ද විසිරීයන පරිදි හරිත නගරයක් ලෙස නිර්මාණය කිරීමෙහිලා දායක කරගත හැකිය.

3. ***ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පරිසර ආරක්ෂණ රෙගුලාසි***

ඇමුණුම 34 හි දැක්වෙන, 2010 ජූලි මස 14 වන දින – 1662/17 ගැසට් පත්‍රයට අනුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අංක. 1968 අංක 15 දරන පනත මඟින්, (1976 අංක 27 දරණ සංශෝධිත පනත)/ 1982 අංක 52 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (සංශෝධිත) පනත 2006 අංක 35 ට අනුව විවෘත හා ආවෘත ඇළ මාර්ගයන් සඳහා එහි පළල අනුව යෝජිත සංරක්ෂණ කලාපයක් වෙන් කර ඇත. එය වගුව 5. 8 මඟින් දැක්වේ. මෙය ජලාශ්‍රිත පරිසර පද්ධතිය හා ඒ ආශ්‍රිත තෙත්බිම් ආරක්ෂාකර ගැනීම සඳහා නීතිමය පියවරක් ලෙස වැදගත් වේ .

| *ඇළ මාර්ගය* | *මතුපිට පළල (මී.)* | *වෙන් කරන ලද රක්ෂිත ප්‍රමාණය* | |
|---|---|---|---|
| | | *විවෘත ඇළ (මී.)* | *ආවරණය වී ඇති ඇළ (මී.)* |
| | *1.0- 1.2* | *1.0* | *0.3* |
| | *1.3 – 3.0* | *2.0* | *1.0* |
| | *3.1 – 4.5* | *2.75* | *1.0* |
| | *4.6 – 6.0* | *3.5* | *1.5* |
| *හපුගහ වෙල්ල, මහර මුදුන් ඇළ* | *6.1 – 9.0* | *4.5* | *1.5* |
| *ඊරි ඇළ, නාත ඇළ, මුදුන් ඇළ, කුඹල් ඔය, කළු ඇළ* | *9 ට වැඩි* | *6.5* | *2.* |

***වගුව 5.8 :*** *පවත්නා ඇළ රක්ෂිත රෙගුලාසි*
***මූලාශ්‍රය :*** *ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව (සංශෝධිත) පනත 2006 අංක 35 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙමඟින් අනවසර අත්පත්කරගැනීම් අවම කරමින්, දැනට පවතින ඇළ රක්ෂිත රෙගුලාසිවලට අනුව යමින් ප්‍රමාණවත් රක්ෂිතයන් පවත්වාගෙන යාම තුළින් ගංවතුර අවදානම අඩු කිරීම සඳහා අවස්ථාවක් සැලසේ.

## තර්ජන | අරමුණ 03

### 1. *65% ක භූමි ප්‍රමාණයක් අවදානම් නාගරික තාප ව්‍යාප්තිය ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබීම.*

පළමු කොටස –පරිච්ඡේද 3 හි සඳහන් රූප සටහන 3.6 මඟින් විශ්ලේෂණය කෙරෙන පරිදි, රුහුණු විශ්ව විද්‍යාලය මඟින් කරන ලද සමීක්ෂණයකට අනුව 2006 සිට 2014 වසර දක්වා කාලය තුළ කැලණිය ප්‍රා. ලේ.කො. තුළ නාගරික තාප ව්‍යාප්ති ප්‍රදේශ 3% සිට 65% දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව සැලසුම් ප්‍රදේශයේ කිරිබත්ගොඩ, නුන්ගමුගොඩ, දළුගම, හුණුපිටිය හා තලවතු හේන්පිට ආදී ප්‍රදේශ අධි අවදානම් තාප ව්‍යාප්ති ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත.

### 2. *තෙත් බිම් පරිසර පද්ධතිය හායනය වීමේ තර්ජනයක් පැවතීම.*

අනවසර ඉඩම් ගොඩකිරීම් සහ වෙනත් සංවර්ධනය කටයුතු හේතුවෙන් සැලකියයුතු තරම් තෙත්බිම් ප්‍රමාණයක් දිනෙන් දින ගොඩකිරීම සිදුවේ. පහත 5.9 වගුව හා ඇමුණුම 35 හි සඳහන් පරිදි වරාය නගරය ආසන්න ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශයේ පහත් බිම් ආශ්‍රිතව කර්මාන්ත හා ගබඩා ව්‍යාපේතිය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී. ඒ අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සමීක්ෂණයකට අනුව, 2000 වසරේ ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 28% ක් තෙත්බිම් ලෙස පැවතුනි. නමුත් 2017 වසර භූමි පරිහරණයට අනුව තෙත්බිම් ප්‍රමාණය 15% ක් පමණ වේ. මෙසේ හරිත ආවරණයේ හීන වීම පළමු කොටස –පරිච්ඡේද 3 හි සඳහන් රූප සටහන 3.4 NDVI විශ්ලේෂණය මඟින් දැක්වේ. මෙය ගංවතුර හා නාගරික තාපය සඳහා ඇති අවදානම ඉහළ යාමට හේතු වී ඇත.

| අපනයනික බහාලුම් | | ආනයනික බහාලුම් | |
|---|---|---|---|
| ප්‍රදේශය | ප්‍රතිශතය | ප්‍රදේශය | ප්‍රතිශතය |
| කැලණිය | 21.6 | කැලණිය | 24.7 |
| කොළඹ | 17.0 | ත්‍රිකුණාමලය | 14.2 |
| වත්තල | 7.7 | වත්තල | 11.6 |
| දෙහිවල / ගල්කිස්ස | 6.0 | කොළඹ | 9.5 |
| | | ජා - ඇල | 7.4 |
| ජා - ඇල | 5.1 | කොළොන්නාව | 6.6 |
| කුරුණෑගල | 4.2 | කුරුණෑගල | 3.2 |
| බියගම | 3.3 | මීගමුව | 2.9 |
| කඩුවෙල | 3.2 | බියගම | 2.9 |

**වගුව 5.9 :** *කැලණිය ප්‍රදේශය සඳහා පවතින ආනයන හා අපනයන ප්‍රවාහන හා ගබඩා පහසුකම්*
**මූලාශ්‍රය :** *පෑලියගොඩ සංවර්ධන සැලසුම් කෙටුම්පත-2017/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

පෑලියගොඩ ප්‍රදේශය ආශ්‍රිතව කර්මාන්ත සංවර්ධනය වීමත් සමඟ ආසන්න ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශයේ පහත් බිම් ගොඩ කෙරෙමින් කර්මාන්ත ව්‍යාප්තිය ආරම්භ විය. මේ වනවිට ආනයන හා අපනයන ගබඩා පහසුකම් අතින් ඉහළ දායකත්වයක් සපයන ප්‍රදේශයක් ලෙස කැලණිය ප්‍රදේශය හඳුනාගත හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඇමුණුම 20 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ ඉඩම් වටිනාකම් අඩු පහත්බිම් ආශ්‍රිතව කර්මාන්ත හා ගබඩා ව්‍යාප්තවෙමින් පවතී. මෙය සෘජුවම නීල හරිත පරිසර පද්ධතිය සඳහා බලපෑමක් එල්ල කරයි.

# 06

පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්ම

# 6.1. සංකල්පිත සැලැස්ම

සංකල්පිත සැලැස්ම තුළින් කැලණිය සැලසුම් ප්‍රදේශය 2030 වසර වන විට අපේක්ෂිත සමස්ත සුපැහැදිලි සංවර්ධනය සරලව අර්ථ නිරූපණය කරයි. ඒ අනුව පහත 6.1 සංකල්පිත සැලැස්මෙහි සටහන අනුව ප්‍රදේශයේ ප්‍රධාන සංධිස්ථානය ලෙස කැලණිය පූජා නගරයත්, ඒ 1 මාර්ගය ආශ්‍රිතව ප්‍රධාන ආර්ථික හා සේවා වර්ධන තීරය ලෙස කිරිබත්ගොඩ අධි ඝනත්ව වාණිජ නාගරික මධ්‍යස්ථානය, කැලණිය හරිත විශ්ව විද්‍යාල පෙදෙස, පැලියගොඩ දෙසට කර්මාන්ත හා ගබඩා ප්‍රදේශයක් ලෙස ස්ථානගත කිරීමට යෝජිතය. කිරිබත්ගොඩ ප්‍රධාන වාණිජ නාගරික මධ්‍යස්ථානයෙහි තදබදය අවම කිරීම උදෙසා හුණුපිටිය උප නාගරික මධ්‍යස්ථානයක් ලෙසත්, එමෙන්ම මෙම සමස්ත ප්‍රදේශය දැනට කොළඹ හා ඒ ආශ්‍රිත තදාසන්න ප්‍රදේශවල රැකියාවල නියුතු ජනතාව උදෙසා වාසස්ථාන සපයන ප්‍රදේශයක් ලෙසත් යෝජිත සැහැල්ලු දුම්රිය සේවා හා ප්‍රධාන දුම්රිය මාර්ගයේ විද්‍යුත්කරණය අන්තර්ගත කරගනිමින් ගමනාගමනය පාදක කොටගත් වාස භූමියක් ලෙසත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.




***රූප සටහන 6.1 :*** *සංකල්පිත සැලැස්ම*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

බස්නාහිර කලාපයට මෙන්ම මුළු මහත් ශ්‍රී ලංකාවටම ප්‍රධාන සංස්කෘතික, ඓතිහාසික හා පූජනීය ප්‍රදේශයක් වන කැලණිය පූජා භූමි කලාපය තුළ පවතින ඓතිහාසික වටිනාකම නාගරීකරණයත් සමඟ වියැකී යමින් පවතී. දැක්මෙහි සඳහන් පරිදි Urban Locus of Divinity එනම් "දිව්‍යමය නාගරික තලය" යන්න ඉහළ නාගරික ප්‍රදේශයක් තුළ පවතින සංස්කෘතික, ඓතිහාසික හා පූජනීය හැඟීම වැඩිදියුණු කරගත හැකි පරිදි එය කැලණි ගඟ සමඟ ද සම්බන්ධ කරමින් පූජා භූමි ප්‍රදේශය ආශ්‍රිතව සිදුවන විෂම සංවර්ධනය පාලනය කිරීම උදෙසා කැලණිය රජමහා විහාරස්ථානයේ සිට උතුරු ප්‍රදේශය දක්වා දිවෙන විට අවම ඝනත්වයක සිට අධි ඝනත්වයක් දක්වා එහි නාගරික සංරචකයන්ගේ තීව්‍රතාවය ඉහළ යන පරිදි පෙළ ගැස්වීමට සංකල්පනය කර ඇත.

දැනට කොළඹ – බියගම මාර්ගය හරහා පමණක් එක එල්ලේම සම්බන්ධ විය හැකි කැලණිය පූජා භූමි ප්‍රදේශයට, 2030 වන විට කොළඹ – නුවර මාර්ගය හා සම්බන්ධ වන වෘක්ෂ තීර සහිත මාර්ග ජාලයක් ඔස්සේ කිරිබත්ගොඩ වාණිජ නගරය, කැලණිය උසස් අධ්‍යාපන ප්‍රදේශය සහ පැලියගොඩ කර්මාන්ත ප්‍රදේශ යන ප්‍රධාන මධ්‍යස්ථාන හරහා සෘජු ප්‍රවේශයක් ලබා දීම අරමුණු වේ. වර්තමානය වන විට කැලණි විහාර භූමියට පමණක් සීමාවී පවතින පූජනීය, ඓතිහාසික, සංස්කෘතික ආවේණිකත්වය පූජා භූමියෙන් පිටතටද විහිදී යන පරිදි පූජා භූමි කලාපයක් ලෙස ස්ථාපිත කිරීම සංකල්පය වේ.

“නාගරික තලය” යන අදහසට අනුව, දැනට ඒ 1 ප්‍රධාන මාර්ගය ඔස්සේ පවතින කිරිබත්ගොඩ ප්‍රධාන නාගරික වාණිජ හා සේවා මධ්‍යස්ථානය තවදුරටත් කලාපීය මට්ටමේ වෙළෙඳ කටයුතු ප්‍රවර්ධන නගරයක් ලෙස පවත්වාගන යාමට අපේක්ෂා කෙරෙන අතර එහි පවතින ඉහළ සංවර්ධන පීඩනයත් සමඟ පැනනැගෙන ගැටළු මගහරවා ගැනීම උදෙසා දැනට සංවර්ධන පීඩනයේ ප්‍රවණතාවයක් පවතින හුණුපිටිය ප්‍රදේශය උප නගරයක් ලෙස ස්ථාපිත කිරීම අවශ්‍යතාවයකි. කැලණිය විශ්ව විද්‍යාලය කේන්ද්‍ර කොටගෙන දළුගම අවට ප්‍රදේශය හරිත විශ්ව විද්‍යාල සංකල්පය ඔස්සේ පහසුකම් සහිත උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කළ යුතු ය. එසේම මුළු ප්‍රදේශය පුරාම අක්‍රමවත් ලෙස පහත් බිම් ගොඩ කරමින් නේවාසික ප්‍රදේශ ඔස්සේත් පූජා භූමි ප්‍රදේශය දෙසටත් සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කර්මාන්ත හා ගබඩා නිසි ලෙස ස්ථාන ගත කිරීම උදෙසා වෙන් වූ ප්‍රදේශයක් ලෙස හුණුපිටිය හා වනවාසල ප්‍රදේශ සඳහා පහසුකම් සැපයිය යුතුය.

එමෙන්ම වර්තමානය වන විට මුළු භූමි ප්‍රමාණයෙන් 58% ක් පමණ ව්‍යාප්තව පවතින නේවාසික කලාපය තුළ  කොළඹ හා ඒ ආශ්‍රිත තදාසන්න ප්‍රදේශ වල රැකියාවල නියුතු ජනතාව උදෙසා වාසස්ථාන සපයයි. ඒ අනුව පවතින රථවාහන තදබදය ද අවම කරගත හැකි පරිදි දැනට පවතින සහ යෝජිත දුම්රිය නවීකරණ හා සැහැල්ලු දුම්රිය (LRT) මාර්ගයන් ද සහසම්බන්ධ කරගනිමින් හුණුපිටිය, වනවාසල හා නුන්ගමුගොඩ, කිරිබත්ගොඩ, ටයර් හංදිය සහ පොල්හේන යන දුම්රිය හා සැහැල්ලු දුම්රිය ස්ථාන ප්‍රදේශයන් කේන්ද්‍ර කොටගෙන ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන මධ්‍යස්ථානක් (TOD) ලෙස ස්ථාපිත කරමින් නේවාසික ජනතාව උදෙසා පහසුකම් සැපයීමට අදහස් කෙරේ.

ස්වාභාවික පරිසරය පිළිබඳව සැලකීමේදී, තෙත්බිම් හා ජලාශ්‍රිත පරිසර පද්ධතිය නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් පවතින ගංවතුර අවධානමට හා නාගරික උණුසුම් ප්‍රදේශ ඉහළ යාම නිසා පැන නඟින අපහසුතාවයන් අවම කරගනිමින් නීල හරිත නගරයක් නිර්මාණය කිරීමෙහිලා ද මෙහි අරමුණ වේ. ඒ අනුව මහර මුදුන් ඇළ පහත් බිම් පරිසරය, වනවාසල මුදුන් ඇළ ආශ්‍රිත ප්‍රදේශය සහ කැලණිය ගං ඉවුර සංරක්ෂණ කලාපය ගං වතුර පාලනය සඳහාත්, ස්වභාවික පරිසරය ආරක්ෂා කර ගනිමින් නාගරික තාපය ඉහළ යාම අවම කිරීම උදෙසා කැලණිය පූජා භූමි ප්‍රදේශයට දිවෙන මාර්ග ඔස්සේ පුළුල් හරිත මං තීරු සහිතව සංවර්ධනය කිරීමටත්, ඇළ රක්ෂිතයන් හරිත තීරයන් ලෙස සංවර්ධනය කිරීමටත් යෝජනා කෙරේ.

කැලණිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය සඳහා වූ සංක්ෂිප්ත සංකල්පීය සැලැස්ම අනුව,  කැලණිය පූජා නගරය මුළු ප්‍රදේශයටම ආශිර්වාදාත්මක සංධිස්ථානයක් ලෙස පවත්වා ගනිමින්, කොළඹ – නුවර ප්‍රධාන මාර්ගය ඔස්සේ විවිධ වූ නාගරික ක්‍රියාකාරකම් ලෙස වෙන් වෙන් වශයෙන් වාණිජ, උසස් අධ්‍යාපන හා කර්මාන්ත  මධ්‍යස්ථාන ලෙස ස්ථාන ගත කරමින්, සෙසු උප මධ්‍යස්ථානයන් ගමනාගමනය පාදක කොටගත් අසල්වැසි නාගරික සේවා ස්ථානයක් (Naigbourhood Nodes) ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි.

**06 පරිච්ඡේදය**
**සංවර්ධන සැලැස්ම**

යෝජිත භූමි පරිහරණ සැලැස්ම

## 6.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම

කැලණිය ප්‍රදේශය ඉහළ නාගරීකරණයක් පවතින අධි සනත්ව ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. මේ වන විටත් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉහළ ජන සනත්වයක් වාර්තා කෙරෙන ප්‍රා.ලේ.කො. ලෙස කැලණිය පවත්නා අතර යෝජිත ජන සනත්වය ව.කි.මී. පුද්ගලයින් 7878 කි. කොළඹ – නුවර මාර්ගයත් සමඟ අතීතයේ සිටම ජාතික මාර්ග ජාලය හා සම්බන්ධ වූ මෙම ප්‍රදේශය මෑතකදී කටුනායක හා පිටත වටරවුම් අධිවේගී මාර්ග මෙන්ම ඉදිවෙමින් පවතින මධ්‍යම අධිවේගී මාර්ගය වෙත ද පහසුවෙන් සම්බන්ධ විය හැකි පිවිසුම් මධ්‍යස්ථාන පවතී. මෙම තත්ත්වයන් තුළ දිනෙන් දින මෙහි තීව්‍රතාවය හා සංකීර්ණ භාවය උච්ච වීමත් සමඟ මේ වනවිට මෙම ප්‍රදේශය කොළඹ ඇතුළත හර කලාපයට අයත් ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය.

මෙම සියලු තත්ත්වයන් හමුවේ 'ඓතිහාසික කැලණිය' යනුවෙන් අතීතයේ සිට ම පූජා නගරය හා සම්බන්ධව පැවතෙමින් ආ පූජනීය, ඓතිහාසික හා සංස්කෘතික වටිනාකම් ක්‍රමයෙන් වියැකී යන ස්වභාවයක් පෙන්නුම් කරයි. ස්ථානීය පිහිටීමෙහි ප්‍රතිඵලයක් ලෙස කර්මාන්ත හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ව්‍යාප්තිය හේතු කොට ගෙන පූජා නගරය ආසන්නයේ කි.මී 1 ක් පමණ දුරට ආවරණය වන භූමි ප්‍රමාණය තුළ 10% ක් පමණ කර්මාන්ත කටයුතු සඳහා භාවිතා වේ. එමෙන්ම මුළු ප්‍රදේශය පුරාම පහත්බිම් ගොඩ කරමින් අනිසි භාවිතයන් සඳහා යොදා ගන්නා බව විශ්ලේෂණයන් තුළින් පෙන්නුම් කරයි. එමෙන්ම කොළඹ – නුවර මාර්ගය ආශ්‍රිතව පවතින අධික රථවාහන තදබදයන් හේතු කොටගෙන පවතින තත්ත්වය හමුවේ 2030 වර්ෂය සඳහා වූ දැක්ම මුදුන් පමුණුවාලීම උදෙසා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇත.

ඒ අනුව 'ඓතිහාසික කැලණිය' යන හැඟීම ආරක්ෂා කර ගනිමින් පවතින සංවර්ධන විභවතාවන්ගෙන් ප්‍රදේශයට නිසි ප්‍රයෝජනයක් ලබා ගැනීමටනම් සමස්තයක් වශයෙන් මුළු ප්‍රදේශයටම සරිලන ලෙස අනාගත නාගරික අවකාශයේ භෞතික සැකැස්ම ක්‍රමානුකූලව සකස් විය යුතුය. මෙහිදී පහත රූප සටහන 6.2 මඟින් දැක්වෙන පරිදි කැලණිය පූජා නගර ප්‍රදේශයට මූලිකත්වය දෙමින් එහි සිට කලාපයේ උතුරු දෙසට යනවිට ක්‍රමානුකූලව ගොඩනැගිලිවල උස, සනත්වය, හැඩය හා ඒවායේ වර්ණයන් වෙනස් වන ආකාරයට සකස් විය යුතුය.




***රූප සටහන 6.2 :*** *යෝජිත අවකාශමය භෞතික සැකැස්මේ හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙම අවකාශීය සැලැස්ම ක්‍රමානුකූලව ස්ථාපිත කිරීම සඳහා පූජා භූමිය තව දුරටත් පිටතට ප්‍රසාරණය කොට එම ප්‍රදේශයෙහි කලාපීකරණ සැලැස්ම තුළ දක්වා ඇති පරිදි ඒ සඳහා යෝග්‍ය අනුමත භාවිතයන් සඳහා පමණක් අඩු සනත්වයකින් ව්‍යාප්ත වීමට අවසර ලබා දේ.

කිරිබත්ගොඩ නගරය තුළ මෙන්ම කොළඹ– නුවර මාර්ගය පුරාවට පවතින තදබදය හීන කරමින් පවතින හා යෝජිත පොදු ප්‍රවාහන සේවාවන් නිසි අයුරින් භාවිතයට ගැනීම සඳහා පොදු ප්‍රවාහන මධ්‍යස්ථානයන් කේන්ද්‍ර කොට ගෙන අසල්වැසි නගර සංවර්ධනයක් අපේක්ෂා කෙරේ. ඒ අනුව තවදුරටත් කිරිබත්ගොඩ

නගරය කලාපයේ ප්‍රධාන වාණිජ නගරය ලෙස පවත්වා ගනිමින් ඉදිකිරීම් සඳහා බිම් ආවරණ අනුපාතයන් වෙනස් කරමින් බැංකු, කුඩා හා මහා පරිමාණ සාප්පු සහ සියලු මූල්‍ය ක්‍රියාකාරකම් සහිත උස ගොඩනැගිලි ව්‍යාප්තිය සඳහා අනුබල දේ. කිරිබත්ගොඩ සිට හුණුපිටිය – වත්තල මාර්ගය ඔස්සේ හුණුපිටිය දෙසට ඇදී යන සංවර්ධන ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින් හුණුපිටිය දෙවන ගණයේ නගරයක් ලෙස ස්ථාපිත කෙරේ. ඒ අනුව යෝජිත දුම්රිය නවීකරණය හා සැහැල්ලු දුම්රිය සේවාවන් සැලකිල්ලට ගනිමින් හුණුපිටිය නගර මධ්‍යය ගමනාගමනය පාදක කොටගත් මධ්‍යම පරිමාණයේ සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කෙරේ. මීට අමතරව වනවාසල, ටයර් හන්දිය, නුන්ගමුගොඩ හා පොල්හේන යන ප්‍රදේශ වල පවතින හා යෝජිත දුම්රිය ස්ථානයන් කේන්ද්‍ර කොටගෙන කුඩා නගර කේන්ද්‍රස්ථානයන් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මේ තුළින් ප්‍රදේශයේ කිරිබත්ගොඩ නගරයට ඒකරාශී වී තිබෙන වාණිජ හා සේවා කටයුතු නගර අභ්‍යයන්තරයට ගෙනයාමට සැලසුම් කෙරේ. එසේම මෙම කුඩා නගර ආශ්‍රිතව නිවාස යෝජනා ක්‍රම දිරිගැන්වීම තුළින්  නේවාසික කටයුතු ව්‍යාප්තිය සඳහා විවෘත කෙරේ.

මෙසේ ප්‍රදේශයේ උතුරු කොටසට වන්නට භූමි පරිහරණය සංකීර්ණ කරමින් පූජා භූමි ප්‍රදේශය අවට පවතින භූමි පරිහරණයේ විෂමතාවයන් හීන වන අයුරින් ඉඩම් පරිහරණය සංවිධානය කෙරේ. මෙහි දී අධි සනත්ව ප්‍රදේශය ආශ්‍රිතව අපර ව්‍යූහ පහසුකම් සංවර්ධනය කරමින් කොහොල්විල, පොල්හේන, ඊරියවැටිය සහ නාහේන ප්‍රදේශ නේවාසික කලාප ලෙස මහල් නිවාස යෝජනා ක්‍රම දිරි ගන්වමින් භූමි පරිහරණයේ වෙනසක් අපේක්ෂා කෙරේ.

පූජා භූමි ප්‍රදේශය අවට තව දුරටත් කර්මාන්ත  ව්‍යාප්තිය වලක්වමින් ගල්බොරැල්ල ප්‍රදේශයට දර්ශනය වන කැලණිය දාගැබ පරිශ්‍රයේ දෘෂ්‍යභාවය ආරක්ෂා වන පරිදි ගොඩනැගිලි උස පරිමාණයන් සීමා කරමින් අඩු සනත්ව නේවාසික භූමි පරිහරණයක් අපේක්ෂා කෙරේ. ඊට අමතරව පූජා භූමි කලාපය කොළඹ – නුවර මාර්ගය සමඟ වෘක්ෂ තීරයන් සහිත ප්‍රධාන මාර්ග හතරක් ඔස්සේ සෘජු ව සම්බන්ධ කිරීම තුළින් ප්‍රදේශයේ ඓතිහාසික  ආවේණිකත්වය තීව්‍රවන භූමි පරිහරණයක් යෙදවිය යුතුය.

දැනට අනවසර නිවාස හා පැල්පත් ව්‍යාප්තව පවතින නිරන්තර ජල ගැලීම්වලට මුහුණපාන කැලණි ගඟ උතුරු බැම්ම ප්‍රදේශය කැලණි විහාරය හා සම්බන්ධ කරමින් ඒ ආශ්‍රිත පූජනීය සමාජ – සංස්කෘතික අංගයන් සහිතව (Socio-cultural river scape improvement projects) ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කැලණිය පූජා නගර සංවර්ධන ව්‍යාපෘතීන් ද සැලකිල්ලට ගනිමින් ඉදිරිපස පවතින එගොඩ කැලණි විහාරය සමඟ කැලණි ගඟ හරහා සම්බන්ධ කරමින් උතුරු බැම්ම ප්‍රදේශය බැතිමතුන් හා සංචාරකයින් ආකර්ෂණය කරගන්නා ආධ්‍යාත්මික විවේක උද්‍යානයක් ලෙස සංවර්ධනය කෙරේ.

කලාපය තුළ  හීන වෙමින් පවතින නීල හරිත පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගනිමින් බල පැවත්වෙන අධි උෂ්ණ කලාප බිහි වීම වලක්වාලීමටත් ක්ෂණික ගංවතුර තත්ත්වයන් නිසි ලෙස කළමනාකරණය කිරීම උදෙසා පවතින තෙත්බිම් පරිසර පද්ධතිය නිසි අයුරින් දායක කරගැනීමට යෝජනා කෙරේ. කැලණිය විශ්ව විද්‍යාලය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් හරිත නගර සංකල්පය අනුව යමින් අධි සනත්ව උසස් අධ්‍යාපන භූමි පරිහරණයන් සඳහා අනුබල දෙන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කෙරේ.

මෙසේ යෝජිත භූමි පරිහරණය තුළින් 2030 වසර වන විට අපේක්ෂිත දැක්ම “දිව්‍යමය නාගරික තලය” (The Urban Locus of Divinity) යන්න මුදුන් පමුණුවා ගැනීම උදෙසා යෝජිත භූමි පරිහරණය අනුව යමින් පූජා භූමි ප්‍රදේශයේ සිට ක්‍රමයෙන් විකාශනය වන සනත්ව හා භූමි පරිහරණ සීමාවන් නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් කැලණිය පූජා නගරය ප්‍රදේශයේ ප්‍රධාන ඓතිහාසික හා ආධ්‍යාත්මික මධ්‍යස්ථානය ලෙස පිහිටුවාලීම අපේක්ෂා කෙරේ. එසේම යෝජිත හා පවතින පොදු ප්‍රවාහන සේවයන්ගේ විභවතාවයන් නිසි පරිදි දායක කර ගැනීම සඳහා සකස් වූ භූමි පරිහරණ දිරි ගැන්වීමක් තුළින්  නගර මධ්‍යයේ පවතින අධික තදබදය ව්‍යාප්ත කරමින් අභ්‍යන්තර නගර සංවර්ධනය සඳහා අනුබල දෙන භූමි පරිහරණයක් අපේක්ෂා කෙරේ.



*සිතියම 6.1 : යෝජිත ඉඩම් පරිහරණ සැලසුම*

# 6.3. අපරවයූහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

## 6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම

යෝජිත සේවා සැපයුම් සැලැස්ම යටතේ නේවාසික, නේවාසිකාගාර, නාගරික සේවා මධ්‍යස්ථාන, අධ්‍යාපන, සෞඛ්‍ය, වෙළඳ හා පොදු විවේක හා විනෝද අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කෙරේ. 2030 වසර වන විට කැලණිය 'දිව්‍යමය නාගරික තලයක්' බවට පත් කරලීමෙහිලා ප්‍රධාන අරමුණක් වන ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහි කිරීම යන අරමුණ පෙරදැරිව කෙරෙන භෞතික හා සමාජීය අපරවයූහ පහසුකම් සැලැස්ම යටතේ ඉහත සඳහන් අංශයන් ආවරණය වන පරිදි යෝජිත සේවා සැපයුම් සැලැස්ම ඉදිරිපත් කෙරේ. ඒ යටතේ දැනට එම පහසුකම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය විශ්ලේෂණය කිරීම තුළින් පුරෝකථනය කරන ලද 141000 ක් වන නේවාසික ජනගහනයට මෙන්ම 500,000 කට අධික සංක්‍රමණික ජනගහනයට අවශ්‍ය පහසුකම් හා සේවා සැපයිය හැකි පරිදි ඉඩකඩ සැලසීමට යෝජනා කර ඇත.

### 6.3.1.1. යෝජිත නිවාස ඝනත්වය හා ව්‍යාප්තිය

2050 වන විට ජාතික භෞතික සැලැස්මෙහි සඳහන් පරිදි, කැලණිය ප්‍රා. සභා බල ප්‍රදේශය ප්‍රධාන ආර්ථික නීරයක් ලෙස හඳුනා ගෙන ඇති නැගෙනහිර – බටහිර ආර්ථික නීරයට අයත්වේ. ඒ අනුව 2050 වසර වන විට මෙම ආර්ථික නීරය තුළ ජනගහනය 20% – 25% න් ඉහළ නැංවීමට යෝජනා වී ඇති අතර එහි අපේක්ෂිත ජන ඝනත්වය අනුව කැලණිය ප්‍රා.ලේ.කො. තුළ ව.කි. මී ට පුද්ගලයින් 6001– 10000 අතර ජන ඝනත්වයක් පැවතිය යුතුය. ඒ අනුව පහත වගුව 6.1 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල පවතින ජනගහන වර්ධන වේගයන් පාදක කොටගෙන ඒ අතරින් 1% ට වැඩි ජනගහන වර්ධන වේගයන්හි මධ්‍යස්ථ වර්ධන අනුපාතය 1.41% සැලකිල්ලට ගනිමින් 2030 වසර වනවිට පැවතිය හැකි ජනගහනය 141,020 ක් ලෙස පුරෝකථනය කර ඇති අතර යෝජිත ජන ඝනත්වය ව.කි.මී. පුද්ගලයින් 7878 කි. මෙසේ 2017 වන විට කැලණිය ප්‍රා. ස. බල ප්‍රදේශය තුළ 111,300 ක් වන ජන ගහනය 2030 වසර වන විට 30,000 න් වැඩි වී 141,000 ක් පමණ විය හැකි බවට පුරෝකථනය කර ඇත. මෙහි දී ප්‍රදේශයේ පවතින 15% ක් පමණ වන වගුරු බිම් හැර ඉතිරි භූමි ප්‍රමාණය තුළ පැවතිය හැකි ශුද්ධ ජන ඝනත්වය ව.කි.මී. පුද්ගලයින් 9271 කි.

| ජනගහන වර්ධන උපකල්පනයන් | වර්ධනය | වර්ෂය | | | 2030 වන විට අපේක්ෂිත ජන ඝනත්වය | 2050 අපේක්ෂිත ජන ඝනත්වය |
|---|---|---|---|---|---|---|
| | | 2011 | 2017 | 2030 | | |
| සාමාන්‍ය ස්වභාවික වර්ධනය | 0.45 | 107,853 | 111,300 | 117,463 | 6,562 | ජාතික භෞතික සැලැස්මෙහි සඳහන් පරිදි 6001 - 10,000 |
| ග්‍රා.නි වසම් අතුරින් ධනාත්මක ජනගහන වර්ධන අනුපාතවල මධ්‍යස්ථ වර්ධනය | 0.71 | 107,853 | 111,300 | 123,519 | 6,900 | |
| ජනගහන වර්ධන වේගය 1% ට වඩා වැඩි ජනගහන වර්ධන අනුපාතවල මධ්‍යස්ථ වර්ධන අනුපාතය | 1.41 | 107,853 | 111,300 | 141,020 | 7,878 | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාශ අතුරින් උපරිම වර්ධන වේගය | 2.22 | 107,853 | 111,300 | 157,522 | 8,800 | |

**වගුව 6.1 :** *ජන ඝනත්වය පුරෝකථනය*
**මූලාශ්‍රය :** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙසේ පුරෝකථනය කරන ලද ජනගහන සංකල්පිත සැලැස්ම, සංවර්ධන පීඩනය හා විභවතා, පාරිසරික විශ්ලේෂණයන් මත පදනම්ව පහත වගුව 6.2 පරිදි කලාප වලට බෙදා වෙන් කර ඇත.

| කලාපය | යෝජිත නාමය | ප්‍රමාණය (හෙක්.) | 2030 සඳහා යෝජිත ජනගහනය | යෝජිත ජන ඝනත්වය (හෙක්.) | යෝජිත නිවාස ඒකක ප්‍රමාණය | යෝජිත නිවාස ඝනත්වය (හෙක්.) |
|---|---|---|---|---|---|---|
| කලාපය I | අධි ඝනත්ව වාණිජ කටයුතු ප්‍රවර්ධන කලාපය | 264.2 | 15778 | 60 | 3945 | 15 |
| කලාපය II | අධි ඝනත්ව උසස් අධ්‍යාපන ප්‍රවර්ධන කලාපය | 209.36 | 15170 | 72 | 3793 | 18 |
| කලාපය III | අධි ඝනත්ව කර්මාන්ත හා බඟාලුම් ප්‍රවර්ධන කලාපය | 460.22 | 15170 | 87 | 10055 | 22 |
| කලාපය IV | අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය | 141.02 | 19633 | 139 | 4908 | 35 |
| කලාපය V | මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය | 335.57 | 26229 | 78 | 6557 | 20 |
| කලාපය VI | අඩු ඝනත්ව නේවාසික කලාපය | 177.08 | 12639 | 71 | 3160 | 18 |
| කලාපය VII | පූජා භූමි හා පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය | 148.59 | 11353 | 76 | 2838 | 19 |
| කලාපය VIII | විශේෂ පාරිසරික සංරක්ෂණ කලාපය | 53.49 | 0 | 0 | 0 | 0 |
| **එකතුව** | | **1789.53** | **141020** | **79** | **35255** | **20** |

**වගුව 6.2 :** කලාප අනුව යෝජිත ජන ඝනත්වය
**මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017

ප්‍රදේශයේ දැනට පවතින නිවාස ඒකක ප්‍රමාණය 26,855 කි. 2030 වන විට වැඩි වන ජනගහනයත් සමඟ අවශ්‍ය මුළු නිවාස ඒකක ප්‍රමාණය 35,255 කි. දැනට පවතින පේළි නිවාස හා පැල්පත් නිවාස 904 ද ඇතුළත්ව වැඩි විය යුතු නිවාස ඒකක ප්‍රමාණය 9,304 කි. මෙසේ බෙදා දක්වන ලද ජනගහනය සඳහා අනාගත නිවාස අවශ්‍යතාවයන්ටද ඉඩකඩ සැලසෙන පරිදි ජනතාවට සෞඛ්‍ය සම්පන්නව සහ ස්වභාවික ආපදාවලින් වැළකී ජීවත්වීමට සුදුසු, උස්බිම් සහිත ප්‍රදේශ සඳහා වැඩි නිවාස ඝනත්වයක්ද, නේවාසික පරිසරයට යෝග්‍ය නොවන පහත් බිම්, ඇළ මාර්ග, පුරාවිද්‍යාත්මක ස්ථානයන් ආශ්‍රිත ප්‍රදේශ අඩු නිවාස ඝනත්වයක්ද යෝජිත නිවාස ඝනත්ව සැලැස්මෙන් යෝජනා කෙරේ. 2030 වසර සඳහා වූ දැක්ම සාක්ෂාත් කරගැනීමේ ඉලක්කයන් සැලකිල්ලට ගනිමින් යෝජිත දුම්රිය නවීකරණයන් හා සැහැල්ලු දුම්රිය සේවා කේන්ද්‍ර කොටගෙන ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන මධ්‍යස්ථාන 6ක් ඇතිකිරීමත් මුළු ජනගහනයෙන් 60% ක් සඳහා ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන මධ්‍යස්ථාන තුළ පහසුකම් සැපයීමත් යන කරුණු වලට අනුව පොල්හේන, ගල්බොරල්ල, නුන්ගමුගොඩ, වෙදමුල්ල, ඊරියවැටිය, කොහොල්විල, වෙලේගොඩ හා දික්පිටිගොඩ ආශ්‍රිත ප්‍රදේශයන් නේවාසික ප්‍රවර්ධනය සඳහා යොමු කිරීමට යෝජිතයි. මෙසේ යෝජිත ජන හා නිවාස ව්‍යාප්තිය සිතියම් 6.2 හා 6.3 මඟින් දැක්වේ.




**සිතියම 6.2 :** *කලාප අනුව 2030 වසර සඳහා යෝජිත ජන ඝනත්වය*




**සිතියම 6.3 :** *කලාප අනුව 2030 වසර සඳහා යෝජිත නිවාස ඝනත්වය*

## 6.3.1.2. සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතාකරණ සැලැස්ම

වර්තමානයේ කැලණිය ප්‍රා. ස. බල ප්‍රදේශය තුළ නාගරික සේවා සපයන නගර මධ්‍යස්ථාන අතරින් ප්‍රමුඛස්ථානය ලෙස කිරිබත්ගොඩ නගරය හඳුනා ගත හැකිය. මීට අමතරව කැලණිය හා හුණුපිටිය යන කුඩා නගර පැවතිය ද ඒවායේ සේවාවන් ප්‍රශස්ත මට්ටමක නොවන හෙයින් නේවාසික හා සංක්‍රමණික ජනතාවගේ පහසුව තකා අභ්‍යන්තර නගර සංවර්ධනය සඳහා අවධානය යොමු කෙරේ. මෙහිදී කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය තුළ පවතින සංවර්ධන පීඩනය, ජනාවස ව්‍යාප්තිය සඳහා සුදුසු ප්‍රදේශ විශ්ලේෂණය, සංවර්ධන විභවතාවය, දුම්රිය ස්ථාන හා යෝජිත සැහැල්ලු දුම්රිය ස්ථානයන් මෙන්ම සංවේදී දර්ශකය ද සැලකිල්ලට ගනිමින් ඇමුණුම 36 හි විශ්ලේෂණය කර ඇති පරිදි ප්‍රදේශයේ පවතින හා යෝජිත නගර මධ්‍යස්ථානයන්ගේ අපේක්ෂිත මට්ටම ප්‍රමුඛතාකරණය කර ඇත. එහි සංක්ෂිප්ත සටහන පහත වගුව මඟින් දැක්වේ.

| ප්‍රමුඛතා අනුපිළිවෙල | නගර මධ්‍යස්ථානය |
|---|---|
| පළමු ප්‍රමුඛතා නගර | කිරිබත්ගොඩ |
| දෙවන ප්‍රමුඛතා නගර | හුණුපිටිය |
| | ටයර් හන්දිය |
| තෙවන ප්‍රමුඛතා නගර | නුන්ගමුගොඩ |
| සිව් වන ප්‍රමුඛතා නගර | තොරණ හන්දිය |
| | දළුගම |
| | පොල්හේන |
| | වනවාසල |
| | ගල්බොරැල්ල |
| පස් වන ප්‍රමුඛතා නගර | සිංහාරමුල්ල |
| | කැලණිය |
| | වේවැල්දූව |
| | දිප්පිටිගොඩ |
| | දළුගම්ගොඩ |

**වගුව 6.3 :** *නාගරික සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතා අනුපිළිවෙළ*
**මූලාශ්‍රය :** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

ඒ අනුව දැනට බස්නාහිර කලාපය තුළ සිව්වන ගණයේ නගරයක් ලෙස පවතින කිරිබත්ගොඩ නගරය, රාගම නාරහේන්පිට යා කරන යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගයේ නැවතුම් මංසන්ධියක් ලෙස පැවතීමත්, පවතින සේවාවන් අනුව ප්‍රධාන වාණිජ නගරය ලෙස මූලික රෝහලත්, පොදු වෙළඳ පොළත්, ප්‍රධාන බස්නැවතුම් පොළත් ඇතුලුව පොදු සේවාවන් රැසක් කේන්ද්‍රව, 2030 වසර වන විට 220000 ක පමණ සංක්‍රමණික ජනගහනයට පහසුකම් සැපයිය හැකි පරිදි නව දුරටත් සංවර්ධනය කිරීමට යෝජිත, කිරිබත්ගොඩ නගරය ප්‍රදේශයේ පළමු ප්‍රමුඛතා නගරය වේ.

වර්තමානයේ කිරිබත්ගොඩ නගරයට ඒකරාශී වී තිබෙන සංවර්ධන පීඩනය හුණුපිටිය දෙසට ඇදීයාම විභවතාවයක් ලෙස සලකා යෝජිත දුම්රිය නවීකරණය හා සැහැල්ලු දුම්රිය සේවා පදනම් කරගෙන යෝජිත නගර මධ්‍ය ව්‍යාපෘති හරහා හුණුපිටිය ගමනාගමන සේවා සපයන නගර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය සඳහා යෝජනා කෙරේ. මීට අමතරව යෝජිත සැහැල්ලු දුම්රිය මංසන්ධියක් වන ටයර් හන්දිය ද ප්‍රදේශයේ දෙවන ප්‍රමුඛතා නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි. මෙසේ 2030 වසර

සඳහා යෝජිත සනත්ව කලාප අනුව අපේක්ෂිත සංක්‍රමණික ජනගහනය 80000 – 150000 අතර පැවතිය හැකි කලාප සඳහා හඳුනාගත් නගර දෙවන ප්‍රමුඛතා නගර ලෙස පවතින දුම්රිය නැවතුම් මංසන්ධියක් යෝජිත සැහැල්ලු දුම්රිය නැවතුම් මංසන්ධියක් හෝ මෙම දෙකෙහිම සංකලනයක් සහිතව ගමනාගමනය පාදක කරගත් පහසුකම් මෙන්ම නේවාසික ජනගහනයටත්, සංක්‍රමණික ජනගහනයට පහසුකම් සපයන හඳුනාගත් නගර ප්‍රදේශයේ දෙවන ප්‍රමුඛතා නගර ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කෙරේ.

සංක්‍රමණික ජනගහනය 50,000 කට අඩු ප්‍රමාණයක් සඳහා පහසුකම් සැපයිය හැකි පරිදි අඩු සනත්ව කලාපය හා මධ්‍ය සනත්ව කලාපය ආවරණය වන පරිදි නුන්ගමුගොඩ තෙවන ප්‍රමුඛතා නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂිතයි. එහි යෝජිත බියගම–කොස්ගම දුම්රිය මාර්ගයේ දුම්රිය නැවතුමක්, ඊට සමගාමී ගමනාගමන පහසුකම් ඇති කිරීමත් අපේක්ෂා කෙරේ.

තොරණ හන්දිය, දළුගම, පොල්හේන, වනවාසල, ගල්බොරැල්ල යන මංසන්ධි සිව්වන ප්‍රමුඛතා නගරය ලෙස සංවර්ධනය කිරීමට යෝජිතයි. මෙම නගර 20000 කට අඩු නේවාසික හා සංක්‍රමණික ජනතාවට පහසුකම් සැපයිය හැකි පරිදි සංවර්ධනය විය යුතු නගර වේ. ඒ අනුව ගමනාගමන පහසුකම් එදිනෙදා අවශ්‍යතා උදෙසා වන සේවාවන් ඒකරාශී කරලීම අපේක්ෂා කෙරේ.

යෝජිත අඩු සනත්ව කලාපයක් ආවරණය කෙරෙන සිංහාරමුල්ල, කැලණිය මෙන්ම අධි සනත්ව කලාපය තුළ පවතින තොරණ හන්දිය, දළුගම්ගොඩ, දිප්පිටිගොඩ හා වේවැල්දුව යන මංසන්ධි පස්වන ප්‍රමුඛතා නගර ලෙස සංවර්ධනය කිරීමට යෝජිතයි. ඒ අනුව නේවාසික ජනගහනය 5000කට අඩු ප්‍රමාණයකට පහසුකම් සැපයිය හැකි පරිදි සෞඛ්‍ය පහසුකම්, සිල්ලර වෙළඳ පහසුකම් ඒකරාශී කෙරෙන කුඩා නගර ලෙස මේවා සංවර්ධනය කිරීමට යෝජිතය.

මෙසේ කිරිබත්ගොඩ නගරය ප්‍රදේශයේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය වන අතර හුණුපිටිය හා ටයර් හන්දිය උප නගරයන් ලෙස සංවර්ධනය විය යුතුය. එසේම නුන්ගමුගොඩ, ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන පර්ෂදයන් තුළ සේවා සපයන තෙවන ප්‍රමුඛතා නගරයක් ලෙසත්, හඳුනාගත් සිව්වන ප්‍රමුඛතා නගර ලෙස තොරණ හන්දිය, දළුගම, පොල්හේන, වනවාසල සහ ගල්බොරැල්ල යන නගර සංවර්ධනය කිරීමට යෝජනා වී ඇති අතර ගල්බොරැල්ල මැටි කර්මාන්තයද පාදක කරගනිමින් පූජා භූමි වන්දනාකරුවන් සඳහා සේවා සපයන සෙසු නගර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. පස්වන ප්‍රමුඛතා නගර ලෙස සිංහාරමුල්ල, කැලණිය, වේවැල්දුව, දික්පිටිගොඩ සහ දළුගම්ගොඩ යන කුඩා නගර ප්‍රදේශයේ ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සපුරාලීමට මෙන්ම කැලණිය හා සිංහාරමුල්ල යන කුඩා නගර මධ්‍යස්ථානයන් පූජා භූමි වන්දනාකරුවන් සඳහා සේවා සපයන වාණිජ මංසන්ධි ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

මෙසේ යෝජිත නගර ධූරාවලියේ ස්ථානගත කිරීම සිතියම 6.4 මගින් දැක්වේ.




සිතියම 6.4 : යෝජිත නාගරික සේවා මධ්‍යස්ථාන ධූරාවලිය

## 6.3.1.3. අධ්‍යාපනික පහසුකම් සැලැස්ම

විශේෂයෙන්ම නේවාසික කලාපයක් ලෙස හඳුනාගත හැකි කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අධ්‍යාපන පහසුකම් පිළිබඳව සලකා බැලීමේදී ප්‍රධාන වශයෙන් මෙම ප්‍රදේශය කැලණිය අධ්‍යාපන කලාපයට අයත් වේ. පහත වගුවේ දැක්වෙන පරිදි ජාතික පාසල් 3ක් ඇතුළුව පාසල් 25 ක් කැලණිය ප්‍රා. ලේ.කො. තුළ පවතී. මෙම පාසල් 25 තුළ මේවන විට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 29,169ක් පමණ අධ්‍යාපනය ලබයි.

| | ජාතික පාසල් | 1 AB පාසල් | 1 C පාසල් | 2 වන ශ්‍රේණියේ පාසල් | 3 වන ශ්‍රේණියේ පාසල් | එකතුව |
|---|---|---|---|---|---|---|
| කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 3 | 2 | 9 | 5 | 6 | 25 |

**වගුව 6.4 :** කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පාසල්
**මූලාශ්‍රය :** සංඛ්‍යා අත්පොත - 2016, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මේ අතරින් මධ්‍ය මහා විද්‍යාල දෙකක් හා මහා විද්‍යාල 11 ක් ඇතුළත්ව පාසල් 21 ක් කැලණිය ප්‍රා.ස. සැලසුම් බල ප්‍රදේශය තුළ පවතී. කැලණිය ප්‍රා. ලේ. කොට්ඨාශයේ 2016 වසරේ ජන සංඛ්‍යා දත්තවලට අනුව ඇමුණුම 37 මඟින් දැක්වෙන පරිදි 2017 වසර වන විට කැලණිය ප්‍රදේශයේ ජීවත්වන ජනගහනයෙන් 22% ක ප්‍රතිශතයක් පාසල් යන වයසේ පසුවන ජනගහනය ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව පාසල් යන වයසේ ජනගහනය 24,300 ක් වන අතර කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශයට පිටින් පැමිණෙන ශිෂ්‍ය සංඛ්‍යාව ද සමඟ ප්‍රදේශය තුළ පවතින පාසල් 21 තුළ 24,902 ක ශිෂ්‍ය පිරිසක් ඉගෙනුම ලබයි. පුරෝකථනය කරන ලද ජනගහනය අනුව 2030 වසර වන විට ප්‍රදේශයේ පාසල් යන වයස් ඛාණ්ඩයේ පසුවන ජනගහනය 27,192 ක් පමණ වේ.

ප්‍රදේශය තුළ ප්‍රාථමික පාසල් 7 ක් පවතින අතර කි.මී. 1 ක වට ප්‍රමාණයක විහිදෙන සේවා ආවරණ කලාප සලකා බැලූ විට මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි ප්‍රාථමික අධ්‍යාපන ආයතන විසිරී ඇත. ප්‍රදේශයේ පවතින පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් පිළිබඳව සලකා බැලීමේදී කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පෙර පාසල් 84 ක් පමණ පවතින අතර පෙර පාසල් අධ්‍යාපනය ලබන ළමුන් 1500ක් වේ. මීට අමතරව ප්‍රදේශය පුරාම ජාත්‍යන්තර පාසල්වල විශාල ප්‍රවර්ධනයක් පවතින බව හඳුනාගත හැකිය. ප්‍රදේශයේ පවතින ද්විතික අධ්‍යාපන ආයතන පිළිබඳව සලකා බැලීමේදී මධ්‍ය මහා විද්‍යාල 2 ක් හා මහා විද්‍යාල 11ක් ඇත. කි.මී. 3 ක වට ප්‍රමාණයක් ආවරණය කරන එහි සම්මත ක්‍රියාකාරී සීමාව සලකා බැලූවිට මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි ද්විතික අධ්‍යාපන ආයතන විසිරී ඇත. මේ අනුව සිතියම 6.5 හි දැක්වෙන පරිදි 2030 සඳහා පුරෝකථනය කරන ලද අධ්‍යාපනය ලබන වයසේ ජනගහනයට සේවා සැපයිය හැකි තරමේ ප්‍රමාණවත් ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපන ආයතන ප්‍රදේශය පුරා ව්‍යාප්තව ඇති අතර යෝජිත අධි ඝනත්ව කලාපයන් තුළ පවතින හුණුපිටිය සභිරා විද්‍යාලය, හුණුපිටිය ප්‍රාථමික විද්‍යාලය, හුණුපිටිය බණ්ඩාරනායක විද්‍යාලය, ශ්‍රී සුමංගල ප්‍රාථමික විද්‍යාලය, නාගසේන විද්‍යාලය, දික්පිටිගොඩ ප්‍රාථමික විද්‍යාලය, යශෝධරා විද්‍යාලය, ශ්‍රී සුමංගල විද්‍යාලය යන පාසල් තවදුරටත් සංවර්ධනය කළ යුතුය.

විශේෂයෙන්ම උසස් අධ්‍යාපන අංශය පිළිබඳව සලකා බැලීමේදී ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් කැලණිය විශ්ව විද්‍යාලය කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශයේ පිහිටා ඇත. 1875 වසර ආරම්භ කල පීඨයන් 6කින් සමන්විත කැලණිය විශ්ව විද්‍යාලයේ 2014/2015 වාර්ෂික වාර්තාවට අනුව විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව 16,000 ක් පමණ වේ. එසේම 2015 වසරේ සිසුන් ලියාපදිංචි කිරීමේ වාර්තාවට අනුව බාහිර ශිෂ්‍ය සංඛ්‍යාව 41,100 කි. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් කැලණිය විශ්ව විද්‍යාලය මේ වන විට පීඨයන් 6කින් සමන්විත වුවද ඉංජිනේරු පීඨයක අවශ්‍යතාවය පවතී.




**සිතියම 6.5 :** *අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය*

ඒ අනුව 2030 වන විට පුරෝකථනය කළ 20,000 ක පමණ අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාවට පහසුකම් සැපයිය හැකි පරිදි නව ඉංජිනේරු පීඨයක අවශ්‍යතාවයක් පවතින බව කැලණිය විශ්ව විද්‍යාලය විසින්ද හඳුනාගෙන ඇති අතර යෝජිත අධි සනත්ව උසස් අධ්‍යාපන ප්‍රවර්ධන කලාපය තුළම හරිත විශ්ව විද්‍යාල නියමයන් අනුව එම පීඨය ස්ථාපිත විය යුතුය.

## 6.3.1.4. සෞඛ්‍ය පහසුකම් සැලැස්ම

ව.කි. මී. 17.9 ක වපසරියකින් හා 2017 වසර වන විට ජනගහනය 111,300 ක් පමණ ජීවත් වන කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින සෞඛ්‍ය පහසුකම් පිළිබඳ සැලකීමේදී කිරිබත්ගොඩ මූලික රෝහල වැදගත් වේ. වර්තමානයේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ පිහිටි “ඒ” ගණයේ වතුපිටිවල මූලික රෝහල, “බී” ගණයේ මීරිගම මූලික රෝහල හා කිරිබත්ගොඩ මූලික රෝහල යන මූලික රෝහල් 3 අතරින් කිරිබත්ගොඩ මූලික රෝහල කැලණිය ප්‍රා.ස.බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. වාට්ටු 5කින් හා ගිලන් ඇඳන් 81කින් මෙම රෝහල සමන්විත වන අතර 2016 වසර තුළ බාහිර රෝගීන් 149,423 ක් හා අභ්‍යන්තර රෝගීන් 16,508 ක් ප්‍රතිකාර ලබන බව 2016 – දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන වාර්තාවෙහි සඳහන් වේ. මෙම “බී” ගණයේ මූලික රෝහලෙහි සේවා වපසරිය කි.මී. 5 ක් දුරට ව්‍යාප්ත වේ යැයි සලකා බැලීමේදී මුලු ප්‍රදේශයම ආවරණය වන පරිදි සේවා ජාලයක් පවතී. එසේම කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය පුරා පිහිටා ඇති මධ්‍යම බෙහෙත් ශාලා පිළිබඳ සැලකීමේදී, කැලණිය සිංහාරමුල්ල මධ්‍යම බෙහෙත් ශාලාව මඟින් ප්‍රදේශයේ පැතිරී සිටින ජනතාව සඳහා සේවය සපයනු ලබන අතර මීට පෞද්ගලික බෙහෙත් ශාලා මඟින් මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි සේවා සපයන සෞඛ්‍ය ජාලයක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

එසේම ආයුර්වේද වෙද සේවාවන් පිළිබඳ සැලකීමේදී කිරිබත්ගොඩ ආයුර්වේද පංච කර්ම මධ්‍යස්ථානය හා කැලණිය ආයුර්වේද බෙහෙත් ශාලාව යන ප්‍රාදේශීය මට්ටමේ ආයුර්වේද බෙහෙත් ශාලා ඉතා වැදගත් වේ. ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන විෂ වෙද රෝහලද මෙම ප්‍රදේශය තුළ පිහිටා තිබීම විශේෂ වන අතර දේශීය වෙද උරුමයන් අභාවයට යා නොදී රැකගනීමේ අරමුණෙන් 1964 වසරේදී ආරම්භ කල විෂ වෙද රෝහල මේ වන විට කැලණිය පොල්හේන ප්‍රදේශයේ පිහිටා ඇත. මෙය දැනට ලංකාවේ පවතින එකම විෂ වෛද්‍ය රෝහල වන අතර විෂ වෛද්‍ය විද්‍යාලයකින්ද සමන්විත වේ. මේ සඳහා වසරකට සිසුන් 200–250 ක ප්‍රමාණයක් ඉල්ලුම් කළද ඇතුළත් කරගනු ලබනේ සිසුන් 20–25 අතර ප්‍රමාණයකි. එමනිසා අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම විෂ වෙද රෝහලද නවීකරණය කිරීමට සංවර්ධන සැලසුම මඟින් යෝජනා කෙරේ.

මෙසේ ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය පහසුකම්වල වත්මන් තත්ත්වය තරමක ප්‍රශස්ත මට්ටමක පැවතියද 2030 සඳහා පුරෝකථනය කළ ජනගහනය 141,000 ක් සහ වර්ධනය වන සංක්‍රමණික ජනතාවට සේවා සැපයීම සඳහා දැනට ‘බී’ කාණ්ඩයේ රෝහලක් ලෙස පවතින කිරිබත්ගොඩ මූලික රෝහල “ඒ” කාණ්ඩයේ රෝහලක් ලෙස ඇඳන් 200 ක් සහිතව හෙක්. 2.7 ක පමණ භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි පුළුල් කිරීමට යෝජනා කෙරේ. ප්‍රදේශය තුළ පවතින මාතෘ නිවාස ව්‍යාප්තිය සලකා බැලීමේදී මුළු ප්‍රදේශයම ආවරණය කෙරෙන එක් මාතෘ නිවාසයක් කැලණිය ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටා ඇති අතර 2030 වසර සඳහා වන පුරෝකථනවලට අනුව ඒවා තවදුරටත් සංවර්ධනය විය යුතුය. මීට අමතරව පොල්හේන ප්‍රදේශයේ පවතින පාරම්පරික විෂවෙද රෝහල හා රට සමඟාමී විෂ වෛද්‍ය විද්‍යාලයද නවීන පහසුකම් සහිතව නවීකරණය විය යුතුය. මෙසේ 2030 වසර සඳහා වන සෞඛ්‍ය පහසුකම් නඟා සිටුවීමේ යෝජනාවන් සිතියම 6.6 මඟින් දැක්වේ.



**සිතියම 6.6 :** සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්තිය

## 6.3.1.5. පොදු වෙළඳ සේවා පහසුකම් සැපයීම

කැලණිය ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පවතින දෛනික වෙළඳ සේවා පහසුකම් පිළිබඳ සැලකීමේදී නේවාසික ප්‍රදේශයක් මෙන්ම වාණිජ හා සේවා අවශ්‍යතා උදෙසා අති විශාල සංක්‍රමණික ජනගහනයක් සහිත ප්‍රදේශයක් ලෙස වෙළඳ අවශ්‍යතා පිළිබඳව සලකා බැලීම අත්‍යාවශ්‍ය වේ.

2017 වනවිට 111,300 ක් වූ නේවාසික ජනගහනයට මෙන්ම දෛනික සේවා අවශ්‍යතා උදෙසා සංක්‍රමණය වන ලක්ෂ 2කට ආසන්න ජනගහනය උදෙසා සේවා සැපයීමට ප්‍රදේශය තුළ කිරිබත්ගොඩ පොදු වෙළඳසැල හා කිරිබත්ගොඩ සතිපොළ යන පොදු වෙළඳ ස්ථාන පවතී. මේවායේ කි.මී.3 ක් විහිදෙන සේවා වපසරිය සලකා බැලුවිට ප්‍රදේශයේ දකුණු දිගින් මැවැල්ල, සිංහාරමුල්ල හා පිලපිටිය ප්‍රදේශ හැර ඉතිරි සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි සේවා වපසරිය විහිදී යයි. එමෙන්ම හුණුපිටිය ප්‍රදේශයේ ජනතාව වත්තල පොදු වෙළඳසැල් මඟින් ද සේවා ලබා ගනී. මීට අමතරව පවතින පෞද්ගලික වෙළඳ සංකීර්ණ හරහා මුළු ප්‍රදේශයම ආවරණය වන සේවා වපසරියක් විහිදී ඇති බව හඳුනාගත හැකිය. නමුත් දැනට කිරිබත්ගොඩ පොදු වෙළඳ සංකීර්ණයත්, සති පොළත් මුළු ප්‍රදේශයටම සේවා සපයන පොදු වෙළඳ මධ්‍යස්ථාන ලෙස පැවතියද 2030 වසර සඳහා පුරෝකථනය කරන ලද 141,000 ක පමණ ජනගහනයට සේවා අවශ්‍යතා සැලසීම සඳහා මේවායේ පහසුකම් ප්‍රමාණවත් නොවේ. කිරිබත්ගොඩ පොදු වෙළඳ සංකීර්ණයේ උඩු මහලේ කඩකාමර නිසි ආකාරයෙන් ක්‍රියාකාරී නොවීමත් එය ඉතා පැරණි ඉදිකිරීමක් බැවින් ගරාවැටී යන තත්ත්වයක පැවතීමත් හේතු කොටගෙන අධි ඝනත්ව වාණිජ කලාපයක් ලෙස සංවර්ධනය කිරීමෙහිලා මෙම පොදු වෙළඳ සංකීර්ණය නවීන පහසුකම් සහිතව නැවත ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂා කෙරේ.

එසේම අධි ඝනත්ව කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත හුණුපිටිය ප්‍රදේශය උදෙසාද පොදු වෙළඳ පහසුකම් දිරිගැන්වීම අපේක්ෂා කෙරේ. දැනට හුණුපිටියේ ප්‍රධාන මාර්ගය ඔස්සේ ක්‍රියාත්මක අවිධිමත් වෙළඳ ස්ථාන සඳහා යෝග්‍ය ඉඩකඩ සකස් කර දීමත් නව පොදු වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීම උදෙසාත් දැඩි අවශ්‍යතාවයක් පවතී. ගමනාගමනය පාදක කරගත් ජනාවාස උදෙසා පහසුකම් සැපයීම ඔස්සේ මෙම පොදු වෙළඳ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ව්‍යාපෘති තුළින් කටයුතු කෙරේ. මෙම යෝජනාවන් සිතියම 6.7 මඟින් දැක්වේ.



**සිතියම 6.7 :** පොදු වෛද්‍ය සේවා පහසුකම් ව්‍යාප්තිය

## 6.3.1.6. තාවකාලික නේවාසික අවශ්‍යතා සපුරාලීම

2017 වසර වන විට කැලණිය විශ්ව විද්‍යාලය තුළ අධ්‍යාපනය ලබන 16,120 පමණ වන අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා මේ වනවිට ප්‍රදේශය තුළ සපයා තිබෙන නේවාසික පහසුකම් සැලකිල්ලට ගැනීමේදී වගුව 6.5 අනුව 3,958ක ගැහැණු/ පිරිමි ශිෂ්‍ය සංඛ්‍යාවක් සඳහා නේවාසික පහසුකම් සපයයි.

| නම | ස්ථාපිත වර්ෂය | ධාරිතාවය | ගැහැණු / පිරිමි |
|---|---|---|---|
| බණ්ඩාරනායක | 1965 | 538 | ගැහැණු |
| විහාරමහාදේවී | 1997 | 212 | ගැහැණු |
| හේමචන්ද්‍ර රායි | 2000 | 200 | ගැහැණු |
| එදිරිවීර සරච්චන්ද්‍ර | 1993 | 108 | ගැහැණු |
| ඊ. ඩබ්. අදිකාරම් | 2000 | 140 | ගැහැණු |
| සංඝමිත්තා | 1997 | 212 | ගැහැණු |
| ගුණපාල මලලසේකර | 1996 | 153 | ගැහැණු |
| සර් ඩී.බී.ජයතිලක | 2015 | 495 | ගැහැණු |
| යක්කඩුව පරන්ගනාරාම | 2009 | 295 | පිරිමි |
| සී.ඩබ්.ඩබ්. කන්නන්ගර | 2005 | 738 | ගැහැණු |
| සෝමා ගුණමහල් | | 315 | ගැහැණු |
| බුලුගහ හන්දිය | | 200 | ගැහැණු |
| සීවලී මාවත | | 100 | ගැහැණු |
| මහර හන්දිය | | 100 | ගැහැණු |
| සීවලී මාවත- පිරිමි | | 80 | පිරිමි |
| කේතගේ වත්ත | | 72 | ගැහැණු / පිරිමි |
| | | 3958 | |

**වගුව 6.5 :** *ස්ථිර නේවාසිකාගාර - කැලණිය විශ්ව විද්‍යාලය*
**මූලාශ්‍රය :** *වාර්ෂික ලේඛනය - 2014/2015- කැලණිය විශ්ව විද්‍යාලය/ සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

දැනට අභ්‍යන්තර ශිෂ්‍යයන් ලෙස සිටින 16,120 න් සියයට 80% ක් වන දුර බැහැර සිසුන් සඳහා නේවාසික පහසුකම් සැපයිය යුතු යැයි පුරෝකථනය කළ විට 12,896 ක් සඳහා නේවාසික පහසුකම් සැපයිය යුතුය. නමුත් දැනට ශිෂ්‍ය නේවාසිකාගාර ධාරිතාව ශිෂ්‍ය ශිෂ්‍යාවන් 3,958 ක් සඳහා ප්‍රමාණවත් වේ. ඒ අනුව මේ වනවිටත් 8,900 ක් පමණ ශිෂ්‍ය සංඛ්‍යාවක් ප්‍රදේශය අවට පවතින ශිෂ්‍ය නේවාසිකාගර නොවන අනෙකුත් නවාතැන්වල පහසුකම් සපයාගෙන ඇත. මේ අනුව 2030 වසර සඳහා යෝජිත නව ඉංජිනේරු පීඨයද ඇතුළත්ව පුරෝකථනය කරන ලද මුළු අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව 20,000 ක් වන අතර ඉන් 80%කට නේවාසික අවශ්‍යතා සැපයිය යුතු බව පුරෝකථනය කළ විට 16,000 සඳහා නේවාසික අවශ්‍යතා සැපයිය යුතුය. ඒ අනුව පවතින නේවාසිකාගරවලට අමතරව ආසන්න වශයෙන් 12,000කට පමණ නව නේවාසිකාගාර පහසුකම් උසස් අධ්‍යාපන ප්‍රවර්ධන කලාපය තුළම සැපයීමට යෝජනා කෙරේ. මෙම යෝජනාවන් සිතියම 6.8 මඟින් දැක්වේ.



***සිතියම 6.8 :*** *තාවකාලික නේවාසික පහසුකම් ව්‍යාප්තිය*

## 6.3.2. මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම

ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර සහ මධ්‍යම ප්‍රදේශයන් අගනගරය හා සම්බන්ධ කෙරෙන ඒ 1 මාර්ගය එනම් කොළඹ – නුවර ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව ව්‍යාප්ත වී තිබෙන නගර අතුරින් අගනගරයට ආසන්නයෙන් ම එනම් කි.මී. 12 ක් පමණ දුරින් තිබෙන ප්‍රදේශයක් ලෙස කිරිබත්ගොඩ නගරය හඳුනා ගත හැකිය. මේ වන විට අධික රථවාහන තදබදයක් පවතින කොළඹ – නුවර මාර්ගය ඔස්සේ දෛනිකව කොළඹ නගරයට සේන්දු වන රථවාහන ප්‍රමාණය 150,000 ඉක්මවයි. කොළඹ නගරයට ආසන්නයේ ම තිබෙන වාණිජ හා සේවා මධ්‍යස්ථානයක් ලෙස ප්‍රසිද්ධියක් උසුලන කිරිබත්ගොඩ එමෙන්ම කැලණිය විශ්ව විද්‍යාලය අසල, දළුගම, ටයර් හන්දිය යන ප්‍රදේශ වලට මෙම රථවාහන ධාරිතාවය දැඩි බලපෑමක් එල්ල කරයි.

මෙම නාගරික ගැටළු මගහරවා ගනිමින් 2030 සඳහා වූ දැක්ම හා අරමුණු ළඟාකර ගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහි කිරීමෙහිලා පවත්නා වූ පරමාර්ථයන් බොහොමයක් ප්‍රවාහන හා ගමනාගමනය පාදක කර ගනිමින් නිර්මාණය වී ඇත. ඒ අනුව 2030 වසර වනවිට කැලණිය පූජා භූමි ප්‍රදේශය ඍජු ප්‍රවේශයන් සහිත කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමටත්, 2030 වසර වනවිට නව මාර්ග ධූරාවලියක් හරහා කාර්යක්ෂම ගමනාගමන සංසරණයක් ස්ථාපිත කිරීමටත්, 2030 වසර වනවිට නව දුම්රිය නවීකරණයන් හා සැහැල්ලු දුම්රිය සේවා කේන්ද්‍ර කොටගෙන ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන පර්ෂදයන් 6 ක් ඇති කිරීමත් යන පරමාර්ථයන් යෝජිත මාර්ග හා ප්‍රවාහන සැලසුම හරහා සාක්ෂාත් කර ගැනීමට සැලසුම් කෙරෙන අතර ඒ සඳහා විශේෂ වූ උපායමාර්ගයන් 3 ක් පවතී.

### 6.3.2.1. කොළඹ - නුවර ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන ධූරාවලීය මාර්ග ජාලයක් ස්ථාපිත කරමින් පවතින තදබදය විකල්ප මාර්ගයන් ඔස්සේ බෙදා හැරීම.

කොළඹ–නුවර ප්‍රධාන මාර්ගය තවදුරටත් ප්‍රදේශයේ පළමු ගණයේ මාර්ගය ලෙස පවත්වා ගනිමින් ඒ හා සම්බන්ධ වන අතුරු මාර්ගයන් පුළුල් කිරීම හා මාර්ග සම්බන්ධතා අඩු ප්‍රදේශයන් තවදුරටත් ධූරාවලිය මාර්ග ජාලය හා සම්බන්ධ කර ගැනීමත් නව විකල්ප මාර්ගයන් ස්ථාපිත කිරීමත් අපේක්ෂා කෙරේ.

ඒ අනුව කොළඹ– නුවර මාර්ගයට විකල්ප මාර්ගයක් ලෙස කිරිබත්ගොඩ නගරය මඟහැර යා හැකි මංතීරු හතරක මාර්ගයක් ඉදි කිරීමට යෝජනා කර ඇත. මෙය පෑලියගොඩ සිට මහර දක්වා දිප්පිටිගොඩ, වේවැල්දූව හා ඊරියවැටිය හරහා කිරිබත්ගොඩ මඟ හැර යා හැකි විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය වේ. මේ සඳහා ප්‍රවේශ මාර්ගයන් ලෙස කොළඹ– නුවර ප්‍රධාන මාර්ගයේ සිට නව විකල්ප මාර්ගයට ප්‍රවේශ විය හැකි කිරිබත්ගොඩ රෝහල මාර්ගය, ඊරියවැටිය මාර්ගය, වේවැල්දූව මාර්ගය, දිප්පිටිගොඩ මාර්ගය හා මානෙල්ගම යන මාර්ගයන් කලාපයේ තෙවන ගණයේ මාර්ග ලෙස සංවර්ධනය වේ.

එසේම කිරිබත්ගොඩ – වත්තල නගර සම්බන්ධ කෙරෙන හුණුපිටිය මාර්ගය ද සේවා මං තීර සහිතව මං තීර හතරක් දක්වා පුළුල් කිරීමට යෝජනා කර ඇත. 2030 දී අපේක්ෂිත සංවර්ධනයට අනුව හුණුපිටිය නගර මධ්‍ය යෝජිත දුම්රිය නවීකරණය හා සැහැල්ලු දුම්රිය සේවා කේන්ද්‍ර කොට ගෙන ප්‍රවාහන සේවා සහිත උප නගරයක් ලෙස සංවර්ධනය වේ. එසේම යෝජිත කලාපීකරණ සැලැස්ම අනුව යමින් හුණුපිටිය, වනවාසල ප්‍රදේශය කර්මාන්ත හා බහාලුම් ප්‍රවර්ධනය සඳහා අනුබල දෙන කලාපයක් ලෙස හඳුනා ගෙන ඇත. මේ නිසා මෙම ප්‍රදේශය හා සම්බන්ධවන තෝරාගත් අතුරු මාර්ග තෙවන ගණයේ මාර්ග ලෙස සේවා මංතීරු සහිතව මංතීරු දෙකක් දක්වා පුළුල් කිරීමට යෝජිතයි.

කැලණි විහාරය හා කොළඹ – නුවර මාර්ගය සම්බන්ධ වන ප්‍රවේශයන් ඉහළ දැමීම උදෙසා තවදුරටත් කොළඹ – බියගම මාර්ගය ප්‍රදේශයේ දෙවන ගණයේ මාර්ගයක් ලෙස පවතින අතර මීට අමතරව තොරණ හංදියේ සිට කැලණි විහාරය දෙසටත්, ටයර් හංදියේ සිට කැලණි විහාරය දෙසටත් හා කිරිබත්ගොඩ සිට කැලණි විහාරය දෙසටත් තෙවන ගණයේ ප්‍රමුඛතා මාර්ග පද්ධතියක් ලෙස ස්ථාපිත කෙරේ. මෙසේ

පවතින මාර්ග පුළුල් කිරීම අරමුණු දෙකක් පාදක කොටගෙන සිදුවේ. එනම් කැලණිය පූජා භූමිය හා කොළඹ නුවර ප්‍රධාන මාර්ගය අතර ඉහළ සම්බන්ධතාවයක් ඇතිකිරීමත්, ඒ හරහා කොලොන්නාවට සම්බන්ධවී බත්තරමුල්ල, කොළඹ හා සම්බන්ධවීමේ ඉඩ ප්‍රස්තාව පුළුල් කිරීමත් වේ.

මෙහි දී කැලණි විහාරය අසලට මෙම මාර්ග සියල්ල ඒකරාශී වී ඇතිවිය හැකි තදබදය දුරලීමටත්, දැනට කැලණි විහාරය අසලින් දිවෙන කොළඹ – බියගම මාර්ගය ඔස්සේ බියගම කර්මාන්ත කලාපයට ඇතුලුවන හා පිටවන වාහන වලින් 1/3 ටත් වඩා ගමන් කිරීම හේතුවෙන් පූජා භූමි ප්‍රදේශයට ඇතිවන බාධකය දුරලීමත් අරමුණු කරගෙන කැලණි විහාරය අසලින් දිවෙන ප්‍රධාන මාර්ගයට වෙන් වූ මංතීරු 4න් යුතු මාර්ගයක් ලෙස කැලණි නිම්න චන්ද්‍රවංක මාර්ගයක් පිලපිටිය, ගල්බොරැල්ල, කොහොල්විල හරහා නැවත බියගම–කොළඹ මාර්ගයට සම්බන්ධ වන නව මාර්ගයක් ලෙස ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මෙම මාර්ග ධූරාවලිය වගුව 6.6. හා සිතියම 6.9 මඟින් පෙන්නුම් කෙරේ. මෙසේ යෝජිත මාර්ග ධූරාවලියේ දැක්වෙන ප්‍රමුඛතා මට්ටම් වලට අඳාළ එක් එක් හරස්කඩ ව්‍යුහ පහත රූප සටහන් 6.3 සිට 6.8 දක්වා සඳහන් කෙරේ.

| මාර්ග ධූරාවලිය | | මාර්ගය | පවතින පළල (මී.) | යෝජිත පළල (මී.) | දුර (කි.මී) |
|---|---|---|---|---|---|
| පළමු ගණයේ මාර්ග | | කොළඹ- නුවර මාර්ගය<br>(පැලියගොඩ සිට මහර දක්වා කි.මී. 6) | | මී. 30 (මංතීරු 4 යි / මධ්‍ය සැහැල්ලු දුම්රිය මං තීරය/ සේවා මාර්ගය)<br><br>රථ වාහන මංතීර - මී. 14<br>රථ වාහන නැවතුම් මං තීර - 5<br>මධ්‍ය තීරය/ සැහැල්ලු දුම්රිය සේවා මාර්ගය - මී. 6 | |
| දෙවන ගණයේ මාර්ග | A වර්ගය | කොළඹ- බියගම මාර්ගය (පැලියගොඩ සිට කැලණිය රතු පල්ලිය අසලට කි.මී. 5) | | මී. 26 (මංතීරු 4 යි / සේවා මාර්ගය සමඟ) | |
| | | යෝජිත නව කැලණි විහාරය චන්ද්‍රවංක මාර්ගය | නව | | |
| | | හුණුපිටිය - වත්තල මාර්ගය | 9 | | 4.1 |
| | | කිරිබත්ගොඩ - මාකොල මාර්ගය | | | |
| | B වර්ගය | යෝජිත නව විකල්ප මාර්ගය (පැලියගොඩ සිට මහර දක්වා වේවැල්දූව - ඊරියවැටිය හරහා) | නව | මී.22 (මංතීරු 4 යි / සේවා මාර්ගය සමඟ) | 4.75 |
| තෙවන ගණයේ මාර්ග | A වර්ගය | කිරිබත්ගොඩ රෝහල් මාවත | 6.6 | මී. 13 (මංතීරු 2 යි / සේවා මාර්ගය සමඟ)<br>• රථවාහන මංතීර - මී. 7<br>• පදික මංතීර, භූ දර්ශන හා කාණු - මී. 6 | |
| | | ඊරියවැටිය පාර | 6 | | |
| | | වේවැල්දූව පාර | 7 | | |
| | | දිප්පිටිගොඩ පාර | 6 | | |
| | | වනවාසල - වත්තල පාර | 6 | | |
| | | මානෙල්ගම මාර්ගය | 6 | | |
| | B වර්ගය | තොරන හන්දිය -කැලණි විහාරය පාර | 9 | මී. 14 (මංතීරු 2 යි / සේවා මාර්ගය සමඟ)<br>• රථවාහන මංතීර - මී. 7<br>• පදික මංතීර, භූ දර්ශන හා කාණු - මී. 6<br>• මධ්‍ය තීරය - මී. 1 | |
| | | ටයර් හන්දිය කැලණි විහාරය පාර | 9 | | |
| | | කිරිබත්ගොඩ කොහොල්විල හරහා කැලණි විහාරය පාර | 6.6 | | |
| සිව්වන ගණයේ මාර්ග | යෝජිත 1-3 ගණයේ මාර්ග හැර ප්‍රා. ස මාර්ග ඇතුළු අනෙක් සියලුම මාර්ගවල පළල අවම මී.7න් යුක්ත විය යුතුය. | | | | |

**වගුව 6.6 :** යෝජිත මාර්ග ධූරාවලිය
**මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017

## 06 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්ම

### අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

#### මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම




***රූප සටහන 6.3 :*** *පළමු ශ්‍රේණියේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 6.4 :*** *දෙවන ශ්‍රේණියේ A වර්ගයේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 6.5 :*** *දෙවන ශ්‍රේණියේ B වර්ගයේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 6.6 :*** *තෙවන ගණයේ A වර්ගයේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 6.7 :*** *තෙවන ගණයේ B වර්ගයේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




***රූප සටහන 6.8 :*** *සිව්වන ගණයේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

## 6.3.2.2. කැලණි ගඟ හරහා පහළ හංවැල්ල මාර්ගය සම්බන්ධ කෙරෙන ප්‍රවේශයන් ඉහළ නැංවීම.

දැනට පහළ හංවැල්ල මාර්ගය හා සම්බන්ධ කෙරෙන සිරිමෙවන් කැලණි පාලමෙහි ද උදෑසන හා සවස් කාලය තුළ අධික වාහන තදබදයක් පවතී. නමුත් මෙම ප්‍රදේශය ඔස්සේ කැලණි ගඟෙන් එගොඩව කොටිකාවත්ත – මුල්ලේරියාව ප්‍රදේශයට සම්බන්ධ වීමට පවතින අවස්ථාවන් ඉහළ දැමීම තුළින් කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ හා බේස්ලයින් මාර්ගයේ පවතින අධික තදබදයට පිළියම් වේ. මේ නිසා කැලණි ගඟ හරහා කොලොන්නාව දෙසට සම්බන්ධ වන නව ප්‍රවේශයන් ඉහළ නැංවීම සඳහා පිලපිටිය, සිංහාරමුල්ල ප්‍රදේශයෙන් කැලණි ගඟ හරහා නව පාලමක් යෝජනා කර තිබේ. මේ සඳහා ඉහත වන ධූරාවලීය මාර්ග ජාලයක් ස්ථාපිත කරලීමේ උපායමාර්ගයට අනුව කොළඹ – නුවර මාර්ගයේ සිට කැලණි විහාරය සම්බන්ධ කෙරෙන මාර්ග ජාලය හරහා ගොස් පහළ හංවැල්ල මාර්ගයට සම්බන්ධ වන ප්‍රවේශයන් පුළුල් කිරීම සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසේ.

## 6.3.2.3. යෝජිත දුම්රිය නවීකරණය හා සැහැල්ලු දුම්රිය සේවාවන් අන්තර්ගත කරගනිමින් පොදු ප්‍රවාහන සේවය දිරිමත් කිරීම.

තෙවන උපායමාර්ගය ලෙස පොදු ප්‍රවාහන සේවය දිරිමත් කිරීම යටතේ යෝජිත දුම්රිය නවීකරණයන් හා සැහැල්ලු දුම්රිය සේවාවන් අන්තර්ගත කරගැනීමට යෝජනා කර ඇත. ඒ අනුව යෝජිත දුම්රිය නවීකරණය යටතේ පානදුර සිට වේයන්ගොඩ දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගයේ විද්‍යුත් නවීකරණය පාදක කොටගෙන සැලසුම් කලාපයට අයත් වනවාසල හා හුණුපිටිය දුම්රිය ස්ථානයන් නවීකරණය කෙරෙන අතර ගමනාගමනය පාදක කොට ගත් කුඩා නගර ලෙස අවශ්‍ය පහසුකම් සැපයේ. එසේම 2020 වසර සඳහා යෝජිත නව දුම්රිය නවීකරණ සැලැස්ම යටතේ කැලණිය සිට කොස්ගම දක්වා බියගම දොම්පෙ හරහා යෝජිත දුම්රිය මාර්ගය සම්බන්ධ කර ගනිමින් නුන්ගමුගොඩ නව දුම්රිය ස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ.

මෙම දුම්රිය නවීකරණයන්ට අමතරව යෝජිත සැහැල්ලු දුම්රිය සේවාවන්ද පාදක කරගැනීම සඳහා අවදානය යොමු කර ඇත. ඒ යටතේ යෝජිත රාගම– කොළඹ සැහැල්ලු දුම්රිය මාර්ගය සැලකිල්ලට ගනිමින් කිරිබත්ගොඩ හා ටයර් හංදිය යන නැවතුම් මධ්‍යස්ථාන මෙන්ම යෝජිත හුණුපිටිය – කොට්ටාව නව දුම්රිය මාර්ගය ද සැලකිල්ලට ගනිමින් ඒ හා සම්බන්ධ වන හුණුපිටිය, ටයර් හංදිය හා පොල්හේන යන සැහැල්ලු දුම්රිය නැවතුම් ස්ථානයන් ගමනාගමන පහසුකම් සපයන කුඩා නගර ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී හුණුපිටිය දුම්රිය නවීකරණය මෙන්ම සැහැල්ලු දුම්රිය මධ්‍යස්ථානය යන සියල්ල සැලකිල්ලට ගනිමින් ගමනාගමන පහසුකම් සැපයේ.

යෝජිත මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම මගින් 2030 වසර වන විට පවතින වර්තමාන රථවාහන තදබදයට වන බලපෑම ඇමුණුම 38 Spatial Integration – (පවතින මාර්ග හා යෝජිත මාර්ග ධූරාවලිය යටතේ) විශ්ලේෂණය මඟින් විදහා දක්වයි.




**සිතියම 6.9 :** *යෝජිත මාර්ග හා ප්‍රවාහන සැලැස්ම*

## 6.3.3. ජල සැපයුම් සැලැස්ම

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල සැපයුම පිළිබඳව සලකා බැලීමේදී, ඒ සඳහා විවිධ ජල සැපයුම් මූලාශ්‍රයන් පාදක වේ. 2012 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව ප්‍රදේශයේ නිවාස ඒකකවලින් 72% ක් ම නළ ජලය භාවිතය සඳහා යොමු ව ඇති බව පහත වගුව යටතේ හඳුනාගත හැකිය.

| කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය | පානීය ජල මූලාශ්‍ර | | | | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රදේශය තුළ ආරක්ෂිත ළිං | ප්‍රදේශය අවට ආරක්ෂිත ළිං | ඒකකය තුළ නළ ජලය | නළ ජලය භාවිතය ප්‍රදේශය තුළ නමුත් ඒකකයෙන් පිටත | නළ ජලය භාවිතය ප්‍රදේශයෙන් පිටත | නළ ජලය |
| | 13% | 1% | 72% | 11% | 2% | 1% |

**වගුව 6.7 :** *කැලණිය ප්‍රදේශයේ පානීය ජල මූලාශ්‍ර*
**මූලාශ්‍රය :** *සම්පත් පැතිකඩ - කැලණිය ප්‍රා.ලේ.කො. – 2015*

2018 වසර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වෙබ් අඩවි වාර්තාවලට අනුව වත්තල හා කැලණිය ප්‍රදේශ ඇතුළත් වන කැලණිය ජල සම්පාදන පරිපාලන කලාපයෙන් 77.37% ක ප්‍රමාණයක් නළ ජල සැපයුම මඟින් ආවරණය කර ඇත.

2017 වසර වනවිට කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශයේ නේවාසික, වාණිජ, කර්මාන්ත, රෝහල් හා දෛනික සංසරණ ජනගහනයට අවශ්‍ය ජල ඉල්ලුම විශ්ලේෂණය කර බැලීමේදී වගුව 6.8 හි සඳහන් පරිදි දිනකට ස.මී. 17,785 ක අවශ්‍යතාවයක් පවතී.

| වර්තමාන ජල ඉල්ලුම - කැලණිය ප්‍රා. ස (2017) | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | ඒකක 1 ක් සඳහා ඉල්ලුම (Lpcd) | දෛනික ජල ඉල්ලුම ($m^3$/day) | සැපයුම |
| නේවාසික | 111,300 | 135 | 15,026 | දිනකට කැලණිය, වත්තල ප්‍රදේශ සඳහා මුදා හරින ධාරිතාවය ස.මී. 71,000 |
| කැලණිය විශ්ව විද්‍යාල නේවාසික සිසුන් | 3,958 | 135 | 534 | |
| කිරිබත්ගොඩ මූලික රෝහල | 81 | 350 | 28 | |
| වාණිජ හා සේවා ආයතන සේවකයන් | 44,687 | 20 | 894 | |
| කර්මාන්ත සේවකයන් | 11,164 | 50 | 558 | |
| සේවා ලාභීන් | 133,900 | 5 | 670 | |
| කැලණි විහාරයේ බැතිමතුන් | 15000 | 5 | 670 | |
| **එකතුව** | | | **17,785** | |

**වගුව 6.8 :** *කැලණිය ප්‍රදේශයේ වර්තමාන ජල ඉල්ලුම (2017)*
**මූලාශ්‍රය :** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

කැලණිය දකුණු ඉවුර ජල පවිත්‍රාගාරය මඟින් කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශය සඳහා ජලය සපයනු ලැබේ. මෙහි ධාරිතාවය දිනකට ඝන මීටර 180,000ක් වේ. එමඟින් බියගම, චර්ච්හිල්, රාගම, කඩවත, වැලිසර, ජා–ඇල, කඳාන හා ඒකල යන ජල ටැංකි වෙත ජලය බෙදා හරින අතර කැලණිය හා වත්තල ප්‍රදේශ සඳහා චර්ච්හිල් හූ ගත ජල ටැංකිය මඟින් දිනකට ස.මී. 71000 ක ප්‍රමාණයක් මුදාහරිනු ලබයි. ඒ අනුව වත්මන් ජල ඉල්ලුමට සරිලන සැපයුමක් පවතී.

2030 වසර සඳහා පුරෝකථනය කරන ලද නේවාසික, සේවා හා අනෙකුත් අංශයන් සඳහා ඉල්ලුම් කෙරෙන ජල පරිමාව විශ්ලේෂණය කර බැලීමේදී, වගුව 6.9 හි සඳහන් පරිදි දිනකට ස.මී. 27,552 ක ඉල්ලුමක් පැවතිය හැකි බව ගණනය කර ඇත.

| 2030 වසර සඳහා පුරෝකථනය කරන ලද ජල ඉල්ලුම | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය | ඒකක 1 ක් සඳහා ඉල්ලුම (Lpcd) | දෛනික ජල ඉල්ලුම ($m^3$/day) | සැපයුම |
| නේවාසික | 141,020 | 135 | 19,038 | දිනකට කැලණිය, වත්තල ප්‍රදේශ සඳහා මුදා හැරීමට යෝජිත ජල ධාරිතාවය ස.මී. 108,000 |
| කැලණිය විශ්වවිද්‍යාල නේවාසික සිසුන් | 16,000 | 135 | 2,160 | |
| කිරිබත්ගොඩ මූලික රෝහල | 200 | 450 | 90 | |
| වාණිජ හා සේවා ආයතන සේවකයන් | 144,112 | 20 | 2,882 | |
| කර්මාන්ත සේවකයන් | 32,019 | 50 | 1,601 | |
| සේවා ලාභීන් | 336,262 | 5 | 1,681 | |
| කැලණි විහාරයේ බැතිමතුන් | 20,000 | 5 | 100 | |
| **එකතුව** | | | **27,552** | |

**වගුව 6.9 :** කැලණිය ප්‍රදේශයේ 2030 සඳහා පුරෝකථනය කළ ජනගහනය සඳහා ජල ඉල්ලුම
**මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017

2030 වසර සඳහා වූ පුරෝකථනය කරන ලද මුළු ජල ඉල්ලුම සපුරා ගැනීම සඳහා, වගුව 6.10, රූප සටහන 6.9 හා 6.10 හි සඳහන් පරිදි ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් 2020 සඳහා යෝජිත කැලණි ගඟ දකුණු ඉවුර ජල පිරිපහදු ඒකකයේ ධාරිතාවය දිනකට ස. මී. 360,000 දක්වා වැඩි කිරීමේ ව්‍යාපෘතිය යටතේ, 2020 වන විට කැලණිය හා වත්තල ප්‍රදේශ සඳහා දිනකට ස.මී. 93,000 ක ජල ධාරිතාවක් මුදා හැරීමට යෝජනා වී ඇත. එසේම 2030 වසර වනවිට යෝජනා වී ඇති නව මාබිම ජල පවිත්‍රාගාර ව්‍යාපෘතියත් සමඟ බියගම ප්‍රදේශයට කැලණි ගඟ දකුණු ඉවුර ජල පවිත්‍රාගාරයෙන් ජලය බෙදා හැරීම සිදුනොකෙරෙන අතර කැලණිය හා වත්තල ප්‍රදේශ සඳහා දිනකට ස. මී 108000 ක ජල ධාරිතාවයක් මුදා හැරීමට යෝජනා කර ඇත.

එසේම ජල පිරිපහදු ධාරිතාවය ඉහළ නැංවීමේ ව්‍යාපෘතියට පෙර දැනට ජලය බෙදා හරින නළ මාර්ගයේ පවතින කාන්දුවීම් වැලැක්වීම සඳහා 100% ක්ම පවතින නළ මාර්ගය නවීකරණය සඳහා ව්‍යාපෘතියක් යෝජනා වී ඇත. ඒ අනුව 2030 වන විට පුරෝකථනය කරන ලද ජනගහනයට සරිලන ජල ඉල්ලුම සපුරා ගැනීමට ප්‍රමාණවත් ජල සැපයුමක් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් මේ වනවිටත් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් සැලසුම් කර තිබේ.

| වර්ෂය | කැලණි ගඟ දකුණු ඉවුර ජල පවිත්‍රාගාරයේ ධාරිතාවය | කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශයේ දෛනික ජල ඉල්ලුම | වත්තල / කැලණිය ප්‍රදේශවලට මුදාහරින ධාරිතාවය |
|---|---|---|---|
| 2017 | 180,000 | 17,785 | 71,000 |
| 2020 | 360,000 | | 93,000 |
| 2030 | 360,000 | 27,552 | 108,000 |
| 2040 | 360,000 | | 129,000 |

**වගුව 6.10 :** යෝජිත ව්‍යාපෘති අනුව ජල ධාරිතාවයන් හා පුරෝකථනය කරන ලද ජල ඉල්ලුම
**මූලාශ්‍රය :** Western Province Water Supply Master Plan – Volume I-2013 /සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017




***රූප සටහන 6.9 :*** *යෝජිත ව්‍යාපෘති අනුව ධාරිතාවයන් ඉහළ නැංවීම*
***මූලාශ්‍රය :*** *Western Province Water Supply Master Plan – Volume I-2013*




***රූප සටහන 6.10 :*** *යෝජිත ව්‍යාපෘති අනුව ජල ධාරිතාවයන් ඉහළ නැංවීම*
***මූලාශ්‍රය :*** *Western Province Water Supply Master Plan – Volume I-2013*

## 6.3.4. විදුලි සැපයුම් සැලැස්ම

භෞතික අපරව්‍යුහ පහසුකම් යටතේ සාකච්ඡා කෙරෙන විදුලිබල සහ දත්ත රැහැන් සැලැස්ම මඟින් කැලණිය නාගරික බල ප්‍රදේශයේ පවතින විදුලි බල සැපයුම පිළිබඳව මෙන්ම පුරෝකථනය කරන ලද නේවාසික, සේවා, කර්මාන්ත අවශ්‍යතා සඳහා අනාගත විදුලි ඉල්ලුම සම්බන්ධ යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කෙරේ. මෙහිදී කැලණිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ ඉදිරි දැක්ම සාක්ෂාත් කර ගැනීමේදී අරමුණු වන ගමනාගමනය පාදක කොටගත් ජනාවාස සඳහා කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහි කිරීම යටතේ සියලු අංශයන් සඳහා ප්‍රශස්ත විදුලි බල සැපයුමක් ලබා දීම අත්‍යාවශ්‍ය වේ. බස්නාහිර පළාත තුළ විදුලිය බෙදාහැරීමේ කලාපීකරණය අනුව ගම්පහ දිස්ත්‍රික්කය බස්නාහිර පළාත – උතුරු කලාපය යටතට අයත්වන අතර එයින් කැලණිය නාගරික සංවර්ධන බල ප්‍රදේශය කැලණිය උප කලාපය යටතට අයත් වේ. 2016 වසර සඳහා කැලණිය ප්‍රා.ලේ. කාර්යාලයෙන් ලබාගත් දත්තයන් අනුව නිවාස ඒකක ආලෝකකරණය සඳහා යොදා ගන්නා ප්‍රධාන මාධ්‍යයන් අනුව වර්ගීකරණය කළ විට ප්‍රදේශයෙන් 98% ක් පමණ ජාතික විදුලි බල සැපයුම් පද්ධතිය මඟින් විදුලිය ලබා ගනී. පවතින විදුලි රැහැන් ව්‍යාප්තිය රූප සටහන 6.11න් දැක්වේ.




***රූප සටහන 6.11 :*** *2017 වසර කැලණිය නාගරික බල ප්‍රදේශයේ විදුලි රැහැන් ව්‍යාප්තිය*
***මූලාශ්‍රය :*** *ලංකා විදුලි බල මණ්ඩලය, 2016*

ඒ අනුව කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශය තුළ කැලණිය විදුලි උප පොළක් ලෙසත්, කිරිබත්ගොඩ ප්‍රාථමික උප පොළක් ලෙසත් ටයර් සමාගම අසල ග්‍රාන්ට් (Gantry) එකක් ලෙසත් පවතී.

2030 වසර සඳහා වන අනාගත විදුලි බල අවශ්‍යතා සපුරාලීම සඳහා මේ වනවිටත් ව්‍යාපෘති රාශියක් යෝජනා වී ඇත. 2030 මෙගා පොලිස් සැලැස්මට අනුව කෙරවලපිටිය විදුලි සැපයුම් ඒකකයේ ඊළඟ පියවර ලෙස මෙගා වොට් 600 ක ප්‍රමාණයක් ජාතික විදුලි රැහැන් පද්ධතියට එකතු කිරීමට යෝජනා වී ඇත. එමඟින් බස්නාහිර කලාපය තුළ විදුලි බල ඉල්ලුමට අතිරේක විදුලි බලයක් එකතු වීමට නියමිතයි.

මීට අමතරව, පහත රූප සටහන 6.12 හි දැක්වෙන පරිදි ලංකා විදුලි බල මණ්ඩලය මගින් 2016 – 2025 දක්වා යෝජිත නව ව්‍යාපෘති අනුව කෙටි කාලීන හා දීර්ඝකාලීන ව්‍යාපෘති හරහා මෙම ප්‍රදේශයට ප්‍රශස්ත විදුලි සැපයුමක් ලබා දීමට අවශ්‍ය පියවර ගෙන ඇත.




***රූප සටහන 6.12 :*** *යෝජිත විදුලි දත්ත රැහැන් ව්‍යාප්තිය 2016 - 2025*
***මූලාශ්‍රය :*** *ලංකා විදුලි බල මණ්ඩලය, 2016*

| ව්‍යාපෘති | ව්‍යාපෘති අංකය | විස්තර |
|---|---|---|
| විදුලි රැහැන් පද්ධති | ST/WPN/01 | කැලණිය විදුලි උප පොළ සිට කිරිබත්ගොඩ ප්‍රා. උප පොළ දක්වා (New 0.5km 33kV DC Lynx Tower line) |
| | ST/WPN/02 | කිරිබත්ගොඩ ප්‍රා. උප පොළ සිට කොළඹ - නුවර මාර්ගය දක්වා (New 0.8km 33kV SC Lynx Pole line) |
| | LT/L/WPN/07 | කැලණිය විදුලි උප පොළ සිට කිරිබත්ගොඩ ප්‍රා. උප පොළ දක්වා (33kV SC Lynx Pole, දුර - කි.මී. 0.2) |
| | LT/CV/WPN/07 | පැරණි නුවර මාර්ගය (ටයර් කර්මාන්තය ගුන්ටි අසල) සිට ගෝනවල දක්වා (33kV DC Raccoon Pole / 33kV DC Lynx Pole, දුර කි.මී. 3) |

***වගුව 6.11 :*** *කැලණිය ප්‍රදේශය සඳහා යෝජිත නව විදුලි දත්ත රැහැන් ව්‍යාපෘති 2016 - 2025*
***මූලාශ්‍රය :*** *ලංකා විදුලි බල මණ්ඩලය, 2016*

මේ අනුව 2030 වසර වන විට පැවතිය හැකි විදුලි බල ඉල්ලුම සපුරාලීම සඳහා වන නවීකරණ ක්‍රියාමාර්ගයන් විදුලි බල මණ්ඩලය මගින් යෝජනා වී ඇත.

## 6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම



ගම්පහ දිස්ත්‍රික්කයේ ජන සනත්වය අධිකම ප්‍රදේශය ලෙස පවතින කැලණිය ප්‍රදේශයේ අපද්‍රව්‍ය හා මළාපවහන කළමනාකරණය භෞතික අපරව්‍යුහ පහසුකම් සැලැස්ම යටතේ සලකා බැලිය යුතු ඉතා වැදගත් අංගයකි.

2017 වසර නේවාසික ජනගහනය හා දෛනිකව සංසරණය වන ජනගහනය සලකා බැලීමේදී දෛනිකව ප්‍රදේශය තුළ ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය පරිභෝජනය කෙරෙන ජල පරිමාවෙන් 80% ක් යන සම්මතයෙහි පිහිටා විශ්ලේෂණය කිරීමේදී දෛනිකව ඝන මීටර් 14,228 ක් ජනනය වේ.

මෙසේ වර්තමානයේ ජනනය වන අපජලය බැහැර කිරීම සඳහා නිශ්චිත ක්‍රමෝපායක් මේ වන විට කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නොමැත. මෙම තත්ත්වය යටතේ 2030 වසර සඳහා නව සංවර්ධන විභවතාවයක් අනුව ප්‍රදේශය තුළ සිටින උපකල්පිත නේවාසික ජනගහනය 141,000 ක් හා උපකල්පිත දෛනික සංසරණ ජනගහනය 532,000 ක් ලෙස උපකල්පනය කර ඇති ජනගහනය මඟින් දෛනිකව ජනනය වන අපද්‍රව්‍ය ප්‍රමාණය සලකා බැලීමේදී එය ඝන මීටර් 22,045 ක් වේ. මෙසේ ගණනය කරන ලද පවතින අපජල ජනනය හා 2030 වසර සඳහා යෝජිත ජන ගහනය යටතේ පැවතිය හැකි අපජල ජනනය පහත වගුව 6.12 මඟින් දැක්වේ.

| | ප්‍රමාණය | ඒකක 1 ක් සඳහා ඉල්ලුම (Lpcd) / (L/m²) | දෛනික ජල ඉල්ලුම ($m^3$/day)) | අපජලය ජනනය (ජල භාවිතයෙන් 80% - $m^3$/d) |
|---|---|---|---|---|
| **2017** | | | | |
| නේවාසික | 111,300 | 135 | 15,026 | 12,020.40 |
| ශිෂ්‍ය නේවාසික | 3,958 | 135 | 534 | 427.46 |
| කිරිබත්ගොඩ රෝහල | 81 | 350 | 28 | 22.68 |
| වාණිජ සේවකයන් | 44,687 | 20 | 894 | 714.99 |
| කර්මාන්ත සේවකයන් | 11,164 | 50 | 558 | 446.56 |
| සේවා ලාභීන් | 133,900 | 5 | 670 | 535.60 |
| කැලණි විහාරය | 15,000 | 5 | 75 | 60.00 |
| **එකතුව** | | | **17,785** | **14,227.70** |
| **2030** | | | | |
| නේවාසික | 141,020 | 135 | 19,038 | 15,230.16 |
| ශිෂ්‍ය නේවාසික | 16,000 | 135 | 2,160 | 1,728.00 |
| කිරිබත්ගොඩ රෝහල | 200 | 450 | 90 | 72.00 |
| වාණිජ සේවකයන් | 144,112 | 20 | 2,882 | 2,305.80 |
| කර්මාන්ත සේවකයන් | 32,019 | 50 | 1,601 | 1,280.76 |
| සේවා ලාභීන් | 336,262 | 5 | 1,681 | 1,345.05 |
| කැලණි විහාරය | 20,000 | 5 | 100 | 80.00 |
| **එකතුව** | | | **27,552** | **22,041.77** |

**වගුව 6.12 :** කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනික අපජලය ජනනය (2017 සහ 2030)
**මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017

**06 පරිච්ඡේදය**
**සංවර්ධන සැලැස්ම**

අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

මළ හා අපජල කළමනාකරණ සැලැස්ම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

වර්තමානයේ මළ අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ක්‍රමවත් මළාපවාහන පද්ධතියක් කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නොමැති වීම හේතුවෙන් එම ක්‍රියාවලිය පෑලියගොඩ නගර සභාවේ මළාපවාහන ගලි බවුසර් මඟින් සිදු කරනු ලැබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් යෝජිත Sanitation and Hygiene Initiative for Towns (SHIFT) යන ව්‍යාපෘතිය මඟින් ප්‍රදේශයේ පවතින මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලුව සඳහා විසදුමක් පවතී. මෙය පෑලියගොඩ කැලණිය යෝජිත කාර්මික ප්‍රදේශය සඳහා විශාල වශයෙන් දායකවන අතර ප්‍රදේශයේ පවතින පහළ උන්නතාංශය සමඟ අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිවල පවතින අක්‍රියභාවයට තාක්ෂණික විසඳුමක් ලබාගත හැකිය. මෙම ව්‍යාපෘතිය මඟින් අපජලය එකතු කිරීම, ජල දූෂණය වලක්වාලීම, සෞඛ්‍ය සුඛසාධනය ආර්ථික තත්ත්වය නංවාලීම හා සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම අරමුණු වේ. 2016 – 2019 වසර තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය යටතේ කි.මී. 12.5 ක ජලාපවහන පද්ධතියක් නිර්මාණය, ජලාපවහන පොම්පාගාර 7ක් ඉදිකිරීමත්, දෛනිකව ඝන මීටර් 12000 ක අපද්‍රව්‍ය පිරිපහදු ඒකකයක්ද, කාර්යාල ගොඩනැගිලි, නිල නිවාස ඉදිකිරීම හා ගෘහස්ථ සම්බන්ධතා 3000 ක් ලබා දීමට යෝජනා වී ඇත.

මීට අමතරව යෝජිත අධි ඝනත්ව වාණිජ කලාපයත්, අධි ඝනත්ව උසස් අධ්‍යාපන කලාපයත් සහ අධි ඝනත්ව නේවාසික කලාපයත් සඳහා යෝජිත නේවාසික හා සංක්‍රමණික ජනගහනයට අවශ්‍ය පහසුකම් සැපයීමේ දී යෝග්‍ය ලෙස මළාපවාහන පද්ධති ස්ථාන ගත කිරීමේ අවශ්‍යතාවයක් පවතී.

## 6.3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

භෞතික අපර ව්‍යුහ පහසුකම් සැලැස්ම යටතේ සාකච්ඡා කෙරෙන ප්‍රධාන අංශයක් ලෙස ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හඳුනාගත හැකිය. 2017 වසර වන විට කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශය තුළ සිටින නේවාසික හා දෛනික සංසරණ ජනගහනයට අනුව, දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 133.36 ක් වේ. එය පහත වගුව 6.13 හි දැක්වේ.

| කලාපය | නේවාසික ජනගහනය | දෛනික සංසරණ ජනගහනය | නේවාසික ජනගහනය + දෛනික සංසරණ ජනගහනය | දෛනික ඒක පුද්ගල අපද්‍රව්‍ය ජනනය (0.4 Kg/d/person) | දෛනිකව ජනනය වන මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය (ටොන්) |
|---|---|---|---|---|---|
| පූජා භූමි සහ පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය | 10708 | 17500 | 28208 | 0.4 | 11.28 |
| අඩු ඝනත්ව නේවාසික කලාපය | 10565 | 5126 | 15691 | 0.4 | 6.28 |
| මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය | 20528 | 15387 | 35915 | 0.4 | 14.37 |
| අධි ඝනත්ව වාණිජ කටයුතු ප්‍රවර්ධන කලාපය | 11838 | 67859 | 79697 | 0.4 | 31.88 |
| අධි ඝනත්ව උසස් අධ්‍යාපන ප්‍රවර්ධන කලාපය | 12627 | 66152 | 78779 | 0.4 | 31.51 |
| අධි ඝනත්ව කර්මාන්ත හා බහාලුම් ප්‍රවර්ධන කලාපය | 30174 | 46778 | 76952 | 0.4 | 30.78 |
| අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය | 14730 | 3019 | 17749 | 0.4 | 7.10 |
| විශේෂ පාරිසරික සංරක්ෂණ කලාපය | 0 | 418 | 418 | 0.4 | 0.17 |
| **දෛනිකව ජනනය වන මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය** | | | | | **133.36** |

**වගුව 6.13 :** *දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය - කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය (2017)*
**මූලාශ්‍රය :** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




**සිතියම 6.10 :** *අපජල කළමනාකරණ සැලැස්ම*

## 06 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්ම

අපරවියුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

කැලණිය ප්‍රා. ස මඟින් ලබා ගත් තොරතුරු අනුව, මෙසේ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයෙන් දෛනිකව ටොන් 75 – 80 අතර ප්‍රමාණයක් ප්‍රා. ස මඟින් එකතු කරනු ලැබේ. එයින් 60% ක ප්‍රමාණයක් දිරන ඝන අපද්‍රව්‍ය වන අතර 40% ක ප්‍රමාණයක් නොදිරන අපද්‍රව්‍ය වේ. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සතියකට දින තුනක් දිරන කසල එකතු කරනු ලබන අතර දින දෙකක් නොදිරන කසල එකතු කරනු ලබයි. මීට අමතරව කැලණිය විශ්ව විද්‍යාලයෙන් ජනනය වන කසල ටෙන්ඩර් කැඳවීම මඟින් එකතු කෙරේ. කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය සභාව සතුව ට්‍රැක්ටර් 14 ක්, කම්පැක්ටර් 03 ක්, අත් කරත්ත 06 ක්, අත්ට්‍රැක්ටරයක් යොදාගනු ලබයි. කසල කළමනාකරණය සඳහා පවතින මිනිස් ශ්‍රමය ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්, සෞඛ්‍ය පරිපාලකවරු දෙදෙනෙක්, වැඩ පරිපාලකවරු දෙදෙනෙක්, රියදුරු 18, කම්කරුවන් 88 සේවය කරනු ලබයි. මීට අමතරව නුපුහුණු සේවකයන් 21 ක් සිටී. කොම්පෝසට් ව්‍යාපෘතිය සඳහා 09 දෙනෙකුගේ සේවය ලබාගනී.

පහත වගුව 6.14හි දැක්වෙන පරිදි 2030 වසර සඳහා යෝජිත නේවාසික හා සංසරණ ජනගහනය අනුව, දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 269.36 ක් වේ.

| කලාපය | නේවාසික ජනගහනය | දෛනික සංසරණ ජනගහනය | නේවාසික ජනගහනය + දෛනික සංසරණ ජනගහනය | දෛනික ඒක පුද්ගල අපද්‍රව්‍ය ජනනය (0.4 Kg/d/person) | දෛනිකව ජනනය වන මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය (ටොන්) |
|---|---|---|---|---|---|
| පූජා භූමි සහ පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය | 11353 | 22962 | 34315 | 0.4 | 13.73 |
| අඩු ඝනත්ව නේවාසික කලාපය | 12635 | 6361 | 18996 | 0.4 | 7.60 |
| මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය | 26229 | 26718 | 52947 | 0.4 | 21.18 |
| අධි ඝනත්ව වාණිජ කටයුතු ප්‍රවර්ධන කලාපය | 15778 | 221126 | 236904 | 0.4 | 94.76 |
| අධි ඝනත්ව උසස් අධ්‍යාපන ප්‍රවර්ධන කලාපය | 15170 | 148304 | 163474 | 0.4 | 65.39 |
| අධි ඝනත්ව කර්මාන්ත හා බහාලුම් ප්‍රවර්ධන කලාපය | 40218 | 91837 | 132055 | 0.4 | 52.82 |
| අධි ඝනත්ව නේවාසික ප්‍රවර්ධන කලාපය | 19633 | 14346 | 33979 | 0.4 | 13.59 |
| විශේෂ පාරිසරික සංරක්ෂණ කලාපය | 0 | 739 | 739 | 0.4 | 0.30 |
| **දෛනිකව ජනනය වන මුළු අපද්‍රව්‍ය ප්‍රමාණය** | | | | | **269.36** |

**වගුව 6.14 :** පුරෝකථනය කරන ලද දෛනික ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය - කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය (2030)
**මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017

මෙම අපද්‍රව්‍ය බැහැරකිරීම පිළිබඳව සැලකීමේදී, වර්තමානයේ එකතු කෙරෙන ටොන් 75 – 80 වන අපද්‍රව්‍ය කැලණිය ප්‍රා. ස බල ප්‍රදේශය තුළම පවතින මානෙල්ගම කසල අංගනය වෙත බැහැර කරනු ලැබේ. නමුත් මේ වනවිට මෙම කසල අංගනයේ ධාරිතාවය ඉක්මවා ගොස් ඇති අතර කෙරවලපිටිය නව කසල ව්‍යාපෘතිය වෙත මුදා හරිනු ලැබුව ද ඒ සඳහා පවතින පිරිවැය වැඩිවීම හේතුවෙන් එම ක්‍රියාවලිය ඇණ හිට ඇත. මේ නිසා වර්තමානයේ කසල බැහැර කිරීම මෙම ප්‍රදේශයට ගැටලුවක් බවට පත්ව ඇත.

මීට අමතරව, මේ වනවිට රජය මඟින් දියත් කර තිබෙන පිලිසරු ව්‍යාපෘතිය යටතේ මානෙල්ගම කසල අංගනයේ කොටසක කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරන අතර මසකට ටොන් 15 ක පමණ කාබනික පොහොර නිපදවනු ලබයි.

මෙසේ 2017 වසර වන විට පවතින තත්ත්වය අනුව 2030 සඳහා පුරෝකථනය කළ ජනගහනය අනුව දෛනිකව නිපදවෙන කසල බැහැර කිරීම සඳහා නව වැඩ පිළිවෙලක අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව 2030 වසර වන විට දෛනිකව ජනනය වන ටොන් 269.36 ක කසල ප්‍රමාණය, ශ්‍රී ලංකාවේ ප්‍රා. ස වල ජනනය වන ඝන අපද්‍රව්‍යවල සංයුතිය අනුව පහත 6.15 වගුවෙහි දැක්වෙන පරිදි වර්ග කළ හැකිය.

| වර්ගය | ප්‍රමාණය (%) | ප්‍රමාණය 2017 (ටොන්) | ප්‍රමාණය 2030 (ටොන්) |
|---|---|---|---|
| දිරන ඝන අපද්‍රව්‍ය (කෙටි කාලීන) | 39.53 | 52.72 | 106.48 |
| දිරන ඝන අපද්‍රව්‍ය (දිගු කාලීන) | 11.06 | 14.75 | 39.73 |
| පොලිතින් සහ ප්ලාස්ටික් | 7.37 | 9.83 | 19.85 |
| රෙදි ආශ්‍රිත කර්මාන්ත අපද්‍රව්‍ය | 6.45 | 8.60 | 17.37 |
| මස් කඩ / මාලු කඩ | 4.77 | 6.36 | 12.85 |
| ගොඩනැගිලි අපද්‍රව්‍ය | 6.88 | 9.18 | 18.53 |
| කඩදාසි | 6.44 | 8.59 | 17.35 |
| වීදුරු | 3.41 | 4.55 | 9.19 |
| ලී | 8 | 10.67 | 21.55 |
| යකඩ | 3.56 | 4.75 | 9.59 |
| වෙනත් | 2.53 | 3.37 | 6.81 |
| **එකතුව** | **100** | **133.36** | **269.36** |

*වගුව 6.15 : සංයුතිය අනුව ජනනය වන කසල ප්‍රමාණය*
*මූලාශ්‍රය : සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මේ අනුව 2030 වසර සඳහා කසල කළමනාකරණයේදී, යෝජිත ජනගහනය අනුව දෛනිකව ජනනය වන ටොන් 106 ක් පමණ වන කෙටි කාලීන දිරන අපද්‍රව්‍ය යොදාගනිමින් කොම්පොස්ට් නිෂ්පාදනය සඳහා දැනට පවතින කොම්පොස්ට් නිෂ්පාදන අංගනය නවීන කොම්පොස්ට් පොහොර නිෂ්පාදන අංගනයක් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමට යෝජනා කෙරේ.

එසේම දෛනිකව ජනනය විය හැකි නොදිරන කසල බැහැර කිරීම සඳහා පහත රූප සටහන 6.13 මඟින් දැක්වෙන පරිදි යෝජිත අරුවක්කාරු සනීපාරක්ෂක බිම් පිරවුම් ව්‍යාපෘතිය හරහා ඉඩකඩ සලසා ගත හැකිය. මෙහිදී කැලණිය ප්‍රා. ස තුළ අක්කර 45 ක් වන වනවාසල මුදුන් ඇළ ප්‍රදේශය කසල බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති අතර මෙම ස්ථානයේ සිට වනවාසල දුම්රිය මධ්‍යස්ථානය හරහා යෝජිත අරුවක්කාරු සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථානය වෙත මුදා හැරීමේ අවකාශයක් ඇත. මානෙල්ගම පවතින කසල අංගනය හා යෝජිත නවීන කොම්පොස්ට් අංගනය ද මේ ආසන්නව පිහිටා ඇත.




***රූප සටහන 6.13 :*** *යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය*
***මූලාශ්‍රය :*** *Sri Lanka Emergency Solid Waste Management Project Report – Ministry of Megapolis and Western Development and Ministry of Local Government – 2017 December*

# 6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

## 6.4.1. යෝජිත ආර්ථික සැලැස්ම

2030 කැලණිය නාගරික බල ප්‍රදේශය සඳහා "දිව්‍යමය නාගරික තලය" යනුවෙන් ඉදිරි දැක්මක් අනුව ගොඩනැඟුණු සංවර්ධන සැලැස්මට අනුව වාණිජ අංශය හා පූජා භූමි ප්‍රදේශයට සමඟාමීව දේශීය කර්මාන්ත අංශය නඟා සිටුවීම තුළින් කලාපීය මෙන්ම ජාතික ආර්ථිකය ශක්තිමත් කරලීමට අපේක්ෂා කෙරේ.

මෙම ඉදිරි දැක්ම යටතේ ගොඩනැඟුණු අරමුණු අනුව පවතින අධි ඝනත්ව නාගරික තලය දිව්‍යමය නාගරික තලයක් කර ගැනීම උදෙසා "කැලණිය පූජා භූමිය" යන හැඟීම ස්ථාපිත කිරීම තුළින් ප්‍රදේශයේ සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කර ඒ ආශ්‍රිතව මැටි කර්මාන්තය නඟා සිටුවීම තුළින් දේශීය ආර්ථිකය දිරිගැන්වීමටත්, ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහි කිරීම යන අරමුණුවලට අනුව යෝජිත පොදු ප්‍රවාහන සේවාවන් පාදක කොට ගෙන ඒ ආශ්‍රිතව ප්‍රධාන සංවර්ධන පර්ෂදයන් 5ක් බිහි කිරීමත්, කිරිබත්ගොඩ නගරය පදික පහසුකම් සැලසීම තුළින් වීථි වෙළඳසැල් සහිත වාණිජ නගරයක් බවට පත් කිරීමත් යන පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම තුළින් කලාපීය ආර්ථිකය නඟා සිටුවීමට යෝජනා කෙරේ. මෙම සියලු යෝජනාවන් සිතියම 6.11 මඟින් විශ්ලේෂණය කෙරේ.

### 6.4.1.1 කැලණිය පූජා භූමිය ආශ්‍රිතව වන්දනා සංචාරක ව්‍යාපාරය පදනම් කරගත් ආර්ථික සංවර්ධනය දිරිමත් කිරීම. (Pilgrim Tourism based Development)

කැලණිය පූජා භූමිය ආශ්‍රිතව වන්දනා සංචාරක ව්‍යාපාරය දිරිගැන්වීම තුළින් කැලණිය ප්‍රදේශයේ ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කරලීම මේ තුළින් අපේක්ෂා කෙරේ. දෛනිකව, වාර්ෂිකව හා මාසිකව ඓතිහාසික කැලණි විහාරය වන්දනාමාන කර ගැනීම උදෙසා බැතිමතුන් විශාල සංඛ්‍යාවක් සහභාගි වේ. 2030 වසර සඳහා වූ දැක්ම සාක්ෂාත් කර ගැනීමෙහිලා කැලණිය පූජා භූමිය යන පූජනීය හැඟීම ස්ථාපිත කරලීම යන අරමුණ යටතේ, 2030 වසර වන විට කැලණිය ප්‍රාදේශයේ පවතින පැරණි මැටි කර්මාන්තය පූජා භූමිය හා සම්බන්ධ කරමින් දේශීය ආර්ථිකය නඟා සිටුවීමෙහිලා දායක කරගැනීම කෙරෙහි අවධානය යොමු වී ඇත.

මෙහි දී ගල්බොරැල්ල හංදියේ පවතින 1925 ආරම්භ කරන ලද මැටි කර්මාන්තය නඟා සිටුවීම තුළින් ගෘහස්ත වශයෙන් මැටි කර්මාන්තය කරගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීමටත් එය පූජා භූමිය හා සම්බන්ධ කරගනිමින් වෙළඳ අවස්ථා පුළුල් කිරීමත් තුළින් ආර්ථිකය නඟා සිටුවීමටත් යෝජනා කෙරේ. කැලණි විහාරය අසලින් ගමන් කරන කොළඹ – බියගම මාර්ගය වෙනුවට වෙන් වූ කැලණි නිම්න චන්ද්‍රවංක මාර්ගයත් ටයර් හන්දිය හරහා පූජා භූමිය සම්බන්ධ කෙරෙන මාර්ගයත් හරහා මැටි කර්මාන්තය අසලට ඍජු ප්‍රවේශයක් ලබා දීම තුළින් කැලණියට පැමිණෙන බැතිමතුන් ඉලක්ක කර ගනිමින් සාම්ප්‍රදායික භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය සඳහා විවෘත කිරීමට යෝජනා කෙරේ. මේ වන විට ඉතා අබලන් තත්ත්වයේ පවතින කර්මාන්ත ශාලාව ගෘහස්ත වශයෙන් මැටි භාණ්ඩ නිෂ්පාදනයේ යෙදෙන ප්‍රදේශ වාසී පවුල් 35කට පමණ පහසුකම් සපයයි. එසේම විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් මෙන්ම පුහුණුකරුවන් 15 ක් පමණ ද මෙහි පුහුණුව ලබයි. පූජා භූමි ප්‍රදේශය තුළ මෙම නිෂ්පාදන අලෙවිය සඳහා විභවතාවයක් පැවතියද මේ වන විට ගල්බොරැල්ල පවතින විසිතුරු මැටි භාණ්ඩ වෙළෙඳ සැල් 3ක් 4ක පමණ මෙම භාණ්ඩ අලෙවි වේ. මේ නිසා එය නැවත ප්‍රතිස්ථාපනය කර කැලණිය, ගල්බොරැල්ල, සිංහාරමුල්ල, සිංහාරමුල්ල උතුර හා පිලපිටිය යන ප්‍රාදේශ වල විරැකියාවෙන් පෙලෙන 450 ක් පමණ ජනතාවට රැකියා උත්පාදනය කිරීමත් පූජා භූමිය ආශ්‍රිතව මෙම නිෂ්පාදන අලෙවිය සඳහා අවස්ථාව ලබා දීම තුළින් ආර්ථිකය ශක්තිමත් කරලීමත් අපේක්ෂා කෙරේ.

මීට සමගාමීව කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය පුරා පැතිර පවතින කැලණි විහාරයද ඇතුළු පුරා විද්‍යාත්මක හා වන්දනාකරුවන් සඳහා නැරඹීමට හැකි ස්ථානය යා කරමින් නැරඹුම් ස්ථාන වන්දනාකරුවන් සඳහා විවෘත කිරීම තුළින් ආර්ථිකය ශක්තිමත් කරලීම අපේක්ෂා කෙරේ. පූජා භූමි ප්‍රදේශය ආශ්‍රිත කරගනිමින් යෝජිත චන්ද්‍රවංක මාර්ගයට යාබදව පිලපිටිය, ගල්බොරැල්ල (මැටි කර්මාන්තය අසල), හා කැලණිය – කොහොල්විල යන ප්‍රදේශ පාදක කරගනිමින් පූජා භූමි කලාපයට අනුගත වන පරිදි වාණිජ මංසන්ධි තුනක් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ. මෙමගින් දෛනිකව පූජා භූමි කලාපයට පැමිණෙන බැතිමතුන් සඳහා සේවා සැපයීමට යෝජිතයි.

## 6.4.1.2 කිරිබත්ගොඩ ආරුක්කු සහිත වෙළඳ ආයෝජන තීර සංවර්ධනය (Middle End Retail and Shopping Street)

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානයක් වන කිරිබත්ගොඩ නගරය කැලණිය නාගරික බල ප්‍රදේශය තුළ පිහිටා ඇති වාණිජ නගරයක් ලෙස හැඳින්විය හැකිය. මෙය කැලණිය, පෑලියගොඩ, හුණුපිටිය, මහර හා බියගම යනාදී ප්‍රදේශවලට වැදගත් සේවා මධ්‍යස්ථානයක් වනවා පමණක් නොව කොළඹ – නුවර කොරිඩෝව තුළ පවතින රෙදිපිළි සඳහා වූ ප්‍රසිද්ධ නවාතැන්පොළක් ලෙස ලංකාවේ නන්දෙසින් පාරිභෝගිකයින් ඇදී එන ස්ථානයකි. එමෙන්ම 2016 වසරේදී මෙය බටහිර කලාපය තුළ පවතින නැගී එන වෙළඳ නගරයක් ලෙසද හඳුනාගෙන තිබීමත් සමගම මෙම ප්‍රදේශයට පවතින වෙළඳ අවස්ථාවන් ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ප්‍රදේශයට උපරිම ආර්ථික සංවර්ධනයක් කරා ළඟා විය හැකිය.

යෝජිත මාර්ග හා ප්‍රවාහන සැලැස්මේ සඳහන් පරිදි කොළඹ නුවර කොරිඩෝව තුළ පෑලියගොඩ සිට මහර දක්වා පවතින අධික රථවාහන තදබදයට පිළියමක් ලෙස කිරිබත්ගොඩ මඟ හැර යා හැකි විකල්ප මාර්ගයක් ඉදිකිරීම තුළින් මෙම කිරිබත්ගොඩ නගරය පදික පහසුකම් සහිත වීථි වෙළඳසැල් ස්ථාපිත කිරීම හරහා පවතින වෙළඳ ආයෝජන දිරි ගැන්වීමට කටයුතු කෙරේ. මේ වනවිට ව.කි. මී 2 ක පමණ වපසරියක ව්‍යාප්ත වී ඇති කිරිබත්ගොඩ නගරය අවට පවතින පහත් බිම් පරිසර පද්ධතියත් සමඟ නව දුරටත් ව්‍යාප්ත වීමට අවකාශය නොමැත. මේ නිසා කලාපීකරණ රෙගුලාසි තුළින් සිරස් ගොඩනැගිලි ව්‍යාප්තිය සඳහා අනුබල දේ.

මේ වන විට මෙම ප්‍රදේශයේ කොළඹ – නුවර මාර්ගය දෙපස මී. 500 ක අවකාශය තුළ භූමි පරිහරණයෙන් 12% ක්ම වාණිජ කටයුතු ව්‍යාප්තව ඇති අතර එයින් 40% ක්ම රෙදිපිළි හා නිමි ඇඳුම් වෙළඳසැල්ය. මෙම විභවතාවය ප්‍රයෝජනයට ගනිමින් කිරිබත්ගොඩ මාර්ගය දෙපස ආරුක්කු සහිත වෙළඳ තීර සංවර්ධනයක් අපේක්ෂා කෙරේ. මේ අනුව ප්‍රධාන මාර්ගය දෙපස YMBA මංසන්ධියේ සිට හුණුපිටිය වත්තල මාර්ගය ආරම්භය දක්වා මී. 800ක් දිගින් හා මී. 2.5ක් පළලින් යුතුව ප්‍රධාන මාර්ගය දෙපස පවතින වාණිජ ගොඩනැගිලි හිමියන් සමඟ ඇතිකර ගන්නා සහයෝගී ක්‍රියා පිළිවෙතක් මඟින් සෑම වාණිජ ගොඩනැගිල්ලක්ම ඉදිරිපස බිම් මහල් කොටසක් ආරුක්කු වෙළඳ තීර සංවර්ධනය උදෙසා කැප කිරීම තුළින් වාණිජ ආකර්ෂණය ඉහළ නැංවීමට යෝජනා කෙරේ. මේ සඳහා පවතින ප්‍රධාන මාර්ගය දෙපස පමණක් නොව කිරිබත්ගොඩ – මාකොළ මාර්ගයේ දී මී. 500ක් පමණ දුරට විහිදෙන ආරුක්කු මාර්ග සංවර්ධනයක් අපේක්ෂා කෙරේ. මෙසේ යෝජිත ආරුක්කු මාර්ගයන්හි සංකල්පිත දැක්ම පහත රූප සටහන 6.14 හි දැක්වේ.



***රූප සටහන 6.14 :*** *යෝජිත වෙළඳ මංතීරු සංවර්ධනය*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙහිදී නගර මධ්‍යයෙහි පවතින පොදු වෙළඳසැල සහ ඒ ඉදිරිපස ඉඩම  වැනි ඌණ භාවිතයේ පවතින ඉඩම් හා ගොඩනැගිලි ප්‍රශස්ත භාවිතයට යොදාගනිමින් වාණිජ කටයුතු සඳහා පවතින ආයෝජන අවස්ථා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. එසේම කිරිබත්ගොඩ නගරාසන්නව පවතින තෙත්බිම් හා ඇළ මාර්ග නිසි ලෙස කළමනාකරණය කරමින් දෛනික සංසරණ ජනගහනය සඳහා අවශ්‍ය විවේක හා විනෝද පහසුකම් සැපයීම හරහා නගරයට පවතින ආකර්ෂණය ඉහළ නැංවීම තුළින් පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීමටත් වාණිජ අවස්ථා ඉහළ නැංවීමටත් කටයුතු කෙරේ. යෝජිත රාගම – නාරාහේන්පිට සැහැල්ලු දුම්රිය මාර්ගය කිරිබත්ගොඩ හරහා යෝජනා වී තිබීමත්, කිරිබත්ගොඩ සැහැල්ලු දුම්රිය නැවතුම් ස්ථානයක් ලෙස හඳුනාගෙන තිබීමත් තුළින් එම විභවතාවයන් නිසි ලෙස උපයෝගී කර ගනිමින් කිරිබත්ගොඩ ප්‍රධාන වාණිජ දිස්ත්‍රික්කයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙහි දී නගර මධ්‍ය ගමනාගමනය පාදක කොටගත් සංවර්ධන මධ්‍යස්ථානයක් (TOD) ලෙස ස්ථානගත කරමින් වාණිජ සංවර්ධනය ප්‍රමුඛව මිශ්‍ර සංවර්ධනයක් සහිත නගර මධ්‍යයක් ලෙස සංවර්ධනය විය යුතුය.

## 6.4.1.3 ගමනාගමනය පාදක කොටගත් අභ්‍යන්තර කුඩා නගර සංවර්ධනය (TOD Neighbourhood Centers)

ගමනාගමනය පාදක කොටගත් අභ්‍යන්තර කුඩා නගර හෙවත් TOD Centers යන්න, නගරය හරහා සිදුවන ප්‍රවාහන, වාණිජ, කර්මාන්ත, නේවාසික, ආයතනික යන මිශ්‍ර ඉඩම් පරිහරණයන් සහ සංවර්ධනයන් ඒකාබද්ධ කරගනිමින් උසස් තත්ත්වයේ ගමනාගමන හා සේවා පහසුකම් සපයන නගර මධ්‍යස්ථානයන්ය. ඒ හරහා කෙටි කාලයක් ඇතුළත විවිධ ප්‍රවාහන මාධ්‍යන් හරහා රැකියා, සාප්පු සවාරි, සේවා ස්ථාන සහ නිවාස වෙත පහසුවෙන් ළඟා විය හැකි අතර අසල්වැසි ප්‍රදේශ සංවර්ධනයට උපකාරී වේ.

ඒ අනුව යෝජිත රාගම – නාරාහේන්පිට සැහැල්ලු දුම්රිය මාර්ගයන්, හුණුපිටිය – කොට්ටාව සැහැල්ලු දුම්රිය මාර්ගයන් ප්‍රධාන දුම්රිය මාර්ගය නවීකරණ හා නව බියගම කොස්ගම දුම්රිය මාර්ගය මෙම කලාපය ඔස්සේ වැටී තිබීම හේතුකොට ගෙන ඒවායේ දුම්රිය මංසන්ධි කේන්ද්‍ර කර ගනිමින් ගමනාගමනය පාදක කොටගත් නගර සෙසු නගර මධ්‍යයන් ලෙස සංවර්ධනය කිරීම තුළින් ප්‍රදේශයේ වෙළඳ හා කාර්යාල ස්ථාපනය වීම කෙරෙහි පවතින ආයෝජන අවස්ථා ඉහළ නැංවීමට යෝජනා කෙරේ.

ඒ අනුව පහත සිතියම 6.11 මඟින් දැක්වෙන පරිදි හුණුපිටිය, වනවාසල, ටයර් හන්දිය, නුන්ගමුගොඩ හා පොල්හේන යන යෝජිත හා පවතින දුම්රිය ස්ථානයන් කේන්ද්‍ර කොට ගෙන කිරිබත්ගොඩ නගරයට අමතරව කුඩා නගර මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම තුළින් වාණිජ හා මිශ්‍ර සංවර්ධනය සඳහා භූමිය විවෘත කර ආයෝජන අවස්ථා ඉහළ නැංවීමට පියවර ගැනේ.

කැලණිය නාගරික ප්‍රදේශය උදෙසා කරන ලද සංවර්ධන පීඩන දර්ශකය, සංවේදිතා දර්ශකය, සංවර්ධන විභවතා දර්ශකය මෙන්ම වාසස්ථාන සඳහා යෝග්‍ය භූමි හඳුනාගැනීමේ විශ්ලේෂණය යන දීර්ඝ විශ්ලේෂණයන් මත පදනම්ව හුණුපිටිය නගරය ප්‍රදේශයේ ප්‍රධාන උප නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා වී ඇත. එහිදී කිරිබත්ගොඩ නගරයට කේන්ද්‍ර වී ඇති සංවර්ධන පීඩනය මාකොළ හා හුණුපිටිය මාර්ග ඔස්සේ ඇදී යාම විභවතාවයක් ලෙස සලකමින් වත්තල – හුණුපිටිය මාර්ගය මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම තුළින් එම ප්‍රදේශයට පවතින ප්‍රවේශය වැඩි කිරීම හා නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘති හරහා මධ්‍ය ප්‍රදේශ වාණිජ හා ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සඳහා විවෘත කිරීම තුළින් ප්‍රාදේශීය වෙළඳ ආර්ථිකය සවිබල ගැන්වීමට අපේක්ෂිතයි. එසේම පහත් බිම්වල අවධිමත් ලෙස කර්මාන්ත ව්‍යාප්තිය වළක්වමින් හුණුපිටිය වනවාසල ප්‍රදේශය ආශ්‍රිතව කර්මාන්ත හා බහාලුම් ප්‍රවර්ධන කලාපය ලෙස ස්ථාපිත කර ඒ ආශ්‍රිතව පවතින දිප්පිටිගොඩ මාර්ගයත්, වනවාසල – වත්තල මාර්ගයත් යන අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීම තුළින් කර්මාන්ත හා ගබඩා ව්‍යාප්තිය උදෙසාද අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධන සිදු කෙරේ.

කැලණිය ටයර් හන්දියද යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගයේ දුම්රිය නැවතුමක් ලෙස හඳුනාගෙන තිබීම ප්‍රයෝජනයට ගනිමින් එම ප්‍රදේශයද ගමනාගමනය පාදක කරගත් නාගරික සේවා මංසන්ධියක් ලෙස ස්ථාපිත කිරීම තුළින් කැලණිය විශ්ව විද්‍යාලයද පාදක කොට ගෙන වාණිජ කටයුතු ප්‍රමුඛ මිශ්‍ර සේවා සපයන කුඩා නගරයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් වෙළඳ ආර්ථිකය ශක්තිමත් කරලීමට යෝජනා කෙරේ. ටයර් හන්දියට උතුරු දෙසින් හුණුපිටිය හා සම්බන්ධවන වේවැල්දූව මාර්ගයත්, දකුණු දෙසින් (කැලණි විහාරය හා සම්බන්ධවන ) ටයර් සංස්ථා මාර්ගයත් පුළුල් කිරීම තුළින් මෙම ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය ඉහළ නැංවීම ඔස්සේ මිශ්‍ර සංවර්ධනයක් සඳහා අනුබල දේ.

තවද යෝජිත නව බියගම – කොස්ගම දුම්රිය මාර්ගයේ කැලණිය නාගරික ප්‍රදේශය තුළ යෝජනා වී තිබෙන නුන්ගමුගොඩ දුම්රිය මංසන්ධියත් පොල්හේන සැහැල්ලු දුම්රිය මංසන්ධියත් කේන්ද්‍ර කොට ගෙන නව කුඩා නගර මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය සඳහා යෝජනා කෙරේ. මෙහිදී පූජා භූමි කලාපයට සෘජුවම සම්බන්ධ වීමට පවතින හැකියාවත් පදනම් කරගෙන මෙය නව වාණිජ මධ්‍යස්ථානයක් ලෙස මෙන්ම ගමනාගමනය පාදක කොට ගත් සංවර්ධන පර්ෂදයන් උදෙසා වාණිජ අවශ්‍යතා සපුරාලන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය ආර්ථිකය සවිබල ගැන්වීමට යෝජනා කෙරේ.



***සිතියම 6.11 :*** *යෝජිත ආර්ථික සැලැස්ම*

# 6.5. තිරසර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම හරහා දැනට පවතින 15% ක හරිත තෙත්බිම් ප්‍රමාණයත්, පවතින ඇළ මාර්ග පද්ධතියත් නිසි ලෙස කලමනාකරණය තුළින් ගංවතුර පාලනයටත්, පවතින නාගරික තාප අවදානම පාලනය කිරීමටත් 2030 වසර සඳහා වූ දැක්ම සාක්ෂාත් කරගැනීමෙහිලා ප්‍රධාන අරමුණක් වන නිල-හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීම යන අරමුණ ළඟා කරගැනීම උදෙසා සැලසුම් කෙරේ.

මේ යටතේ යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම, ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම මෙන්ම විවෘත භූමි සැලැස්ම යන සැලසුම් තුළින් 2030 වසර වන විට හෙක්ටයාර 300 ක තෙත්බිම් කලාප ක්‍රමවත්ව යොදා ගනිමින් ගංවතුර බලපෑම අවම කිරීමටත්, 2030 වසර වන විට හෙක්ටයාර 140 ක තෙත්බිම් සංරක්ෂණ කලාපය එහි අනුබල දෙන භාවිතයන් සඳහා ක්‍රමවත්ව යොදා ගනිමින් පවතින හරිත ආවරණය ආරක්ෂා කිරීමටත් අපේක්ෂා කෙරේ. මීට අමතරව, 2030 වසර වන විට 100% ක් අඛණ්ඩ ඇළ මාර්ග ජාලයක් නිසි ලෙස කළමනාකරණය කිරීමත්, 2030 වසර වන විට හරිත විශ්ව විද්‍යාල පරමාදර්ශය පෙරදැරිව එම ප්‍රදේශය ආශ්‍රිත කොටගෙන හරිත නගරයක් කරා යොමු වීමත් පරමාර්ථයන් වේ.

## 6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම

ගංවතුර අවදානම් ප්‍රදේශ, පවතින තෙත්බිම් ප්‍රදේශ, ජල මාර්ග පද්ධතිය හා භූමියේ උස මෙන්ම සංවේදී ප්‍රදේශ හා ප්‍රදේශයේ සංවර්ධන පීඩනය යන පාරිසරික විශ්ලේෂණයන් කිහිපයක් මත පදනම්ව ඇමුණුම 39 මඟින් දැක්වෙන පරිදි තෙත්බිම් කලාපීකරණ සැලැස්මක් සකස් කර ඇත. ඒ අනුව ප්‍රදේශයේ පවතින තෙත්බිම් පහත පරිදි වර්ගීකරණය කර ඇති අතර සිතියම 6.12 හි එහි පිහිටීම දැක්වේ.

| *තෙත්බිම් කලාපය* | | *ප්‍රමාණය (හෙක්ටයාර)* |
|---|---|---|
| | *නියත තෙත්බිම් සංරක්ෂක කලාපය* | *141.03* |
| | *ජල රැඳවුම් පරිසර සංරක්ෂක කලාපය* | *93* |
| | *තෙත්බිම් පරිසර සංරක්ෂක කලාපය* | *43* |
| | *විශේෂ කුඹුරු කලාපය* | *15.34* |

***වගුව 6.16 :** යෝජිත තෙත්බිම් කලාපීකරණය*
***මූලාශ්‍රය :** සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

මෙසේ තෙත්බිම් වර්ගීකරණය කර තිබුනද නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සමස්ත බස්නාහිර කලාපයම ආවරණය වන පරිදි තෙත්බිම් කලපීකරණය කොට ඒ සඳහා රෙගුලාසි සම්පාදනය කර ඇත. ඒ අනුව කැලණිය සැලසුම් බල ප්‍රදේශය තුළ පවත්නා තෙත්බිම් පහත පරිදි කොටස් දෙකකින් යුක්ත වේ.

1. තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය
2. විශේෂ කුඹුරු කලාපය

කැලණිය සංවර්ධන සැලැස්ම මඟින් හඳුනාගෙන වර්ගීකරණය කරන ලද නියත තෙත්බිම් සංරක්ෂක කලාපය, ජල රැඳවුම් පරිසර සංරක්ෂක කලාපය සහ තෙත්බිම් පරිසර සංරක්ෂක කලාපය යන නම් වලින් හැඳින්වෙන තෙත්බිම් කලාප තෙත්බිම් ස්වභාවික සංරක්ෂක කලාපය යටතට ගැනෙන අතර විශේෂ කුඹුරු කලාපය බස්නාහිර පළාත් තෙත්බිම් කලාපීකරණයේ සඳහන් පරිදි නම් කර ඇත. එම කලාපයන් සඳහා බල පැවැත්වෙන රෙගුලාසි, මාර්ගෝපදේශ හා නියෝග දෙවන වෙළුමෙහි දීර්ඝව සාකච්ඡා කෙරේ.



**සිතියම 6.12 :** *යෝජිත තෙත්බිම් කලාපීකරණ සැලැස්ම*

## 6.5.2. භූ දර්ශන සැලැස්ම

මේ වන විටත් මෙම ප්‍රදේශය තුළ අධි ඝනත්ව සංවර්ධනයත් සමඟ ඇති වන නාගරික උෂ්ණත්වය ඉහළ යාම හා වායු දූෂණය වැනි පාරිසරික ගැටළු උද්ගතව පැවතීම සංවර්ධන සැලසුමක් සකස් කිරීම කෙරේ බලපෑ එක් කාරණාවකි. ඒ අනුව ගොඩනැගුණු 2030 සඳහා වූ දැක්ම සාක්ෂාත් කර ගැනීමෙහිලා අරමුණක් වූ නිල-හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීම යන අරමුණ ළඟා කරගැනීම භූ දර්ශන සැලැස්ම මඟින් අපේක්ෂා කෙරේ. මෙම භූ දර්ශන සැලැස්ම ප්‍රධාන උපායමාර්ගයන් දෙකක් ඔස්සේ ගොඩනඟා ඇත.

### 6.5.2.1 අභ්‍යන්තර මාර්ග සඳහා පුළුල් හරිත මංතීර ස්ථාපිත කිරීම

මෙහි දී කැලණිය පූජා භූමි ප්‍රදේශය හා කොළඹ- නුවර ප්‍රධාන මාර්ගයන් සම්බන්ධ කෙරෙන සෘජු ප්‍රවේශයන් පුළුල් හරිත මංතීර ලෙස ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ. මේ සඳහා මාර්ග හා ප්‍රවාහන සැලැස්ම යටතේ පුළුල් කිරීමට යෝජිත මෙම මාර්ගයන් සේවා මංතීරු සහිතව රුක් රෝපණය සඳහා ද ඉඩ සැලසෙන පරිදි පුළුල් කිරීමට යෝජනා කර ඇත. එසේම හරිත විශ්ව විද්‍යාල සංකල්පය අනුව ගොඩනැගෙන උසස් අධ්‍යාපන ප්‍රවර්ධන කලාපය තුළ ද සියලු අභ්‍යන්තර මාර්ග සඳහා වෘක්ෂ තීරයන් යෝජනා කෙරේ.

### 6.5.2.2. කර්මාන්ත ආරක්ෂක තීරයන් හා ගංගා, ඇළ රක්ෂිතයන් සඳහා හරිත තීර ව්‍යාප්තිය

ප්‍රදේශය පුරා අවිධිමත්ව කර්මාන්ත ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස මේ වන විටත් පාරිසරික සමතුලිතතාවය බිඳ වැටී ඇත. මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා සෑම කර්මාන්තයක් වටාම මී. 10 ක රක්ෂිත ප්‍රදේශයක් ලෙස පවත්වා ගනිමින් හරිත ව්‍යාප්ති කලාපයක් ලෙස පවත්වා ගැනීමට යෝජනා කෙරේ.

ප්‍රදේශයේ ප්‍රධාන ජල ප්‍රභවය ලෙස පවතින කැලණි ගඟ රක්ෂිත ප්‍රදේශය, පාරිසරික සංරක්ෂණ කලාපය ලෙස කලාපීකරණ සැලැස්ම මඟින් හඳුනාගෙන තිබෙන උතුරු බැම්ම රක්ෂිත ප්‍රදේශය සඳහාද හරිත තීර ව්‍යාප්තියක් අපේක්ෂා කෙරේ. එසේම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ, 2010 ජූලි 14 අංක 1662/17 ගැසට් නිවේදනය අනුව යමින් පහත වගුව 6.17 හි දැක්වෙන පරිදි ඇළ මාර්ගවල පලල අනුව නිර්දේශිත සංරක්ෂණ කලාපයන් වෙන් කරමින් ඒවා හරිත රක්ෂිතයන් ලෙස ප්‍රතිස්ථාපනය කිරීමට අපේක්ෂිතයි. අදාළ සැලැස්ම සිතියම 6.13 හි දැක්වෙන අතර මේ තුළින් කලාපයට දෘෂ්‍යමය වටිනාකමක් එක්කිරීමත් ප්‍රදේශයේ පාරිසරික සමතුලිතතාවය ආරක්ෂා කරගැනීමත් අරමුණ වේ.

| ඇළ මාර්ගය | ඇළ මාර්ගයේ පළල (මී.) | ඇළ රක්ෂිත පළල (මීටර්) | |
|---|---|---|---|
| | | විවෘත ඇළ මාර්ග (මී.) | මතුපිට වැසූ ඇළ මාර්ග (මී.) |
| හපුගහවෙල්ල , මහර මුදුන් ඇළ | 6.1 – 9.0 | 4.5 | 1.5 |
| ඊරිය ඇළ, නාථ ඇළ, මුදුන් ඇළ, කුඹල් ඔය, කළු ඇළ | 9 ට වැඩි | 6.5 | 2.0 |

***රූප සටහන 6.17 :** ඇළ රක්ෂිත ප්‍රමාණ - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව*
***මූලාශ්‍රය :** ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (සංශෝධිත) පනත 2006 අංක 35 / සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*




**සිතියම 6.13 :** *යෝජිත භූ දර්ශන කළමනාකරණ සැලැස්ම*

## 6.5.3. ආපදා අවදානම් අවම කිරීමේ සැලැස්ම

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්වභාවික විපත්වලින් වැඩිම විපත් ගෙන එනුයේ වර්ෂා කාලයේදී ජලයෙන් යටවීමෙනි. ප්‍රදේශයේ වැසි ජලය ගලා යන ඇළ මාර්ග පැවතියද, එම ඇළ මාර්ග ගොඩවීමත්, නිසි කලට පිළිසකර නොකිරීමත්, එහි සිදු කර ඇති අනවසර ඉදිකිරීම් නිසා ඇළ මාර්ග අවහිර වීමත් මීට ප්‍රධාන හේතු සාධක වී ඇත. ඇමුණුම 33 මඟින් දැක්වෙන GIS විශ්ලේෂණය මඟින් හඳුනාගත් ස්වභාවික ඇළ මාර්ග ජාලය පැවතිය යුතු ආකාරය අනුව දැනට පවතින ඇළ මාර්ගයන් අවහිර වී ඇති ආකාරයන් දැක්වේ. හුණුපිටිය උතුර, හුණුපිටිය දකුණ, හුණුපිටිය නැගෙනහිර, වෙලේගොඩ, නාහේන, වනවාසල, හිඹුටුවැල්ගොඩ, වේවැල්දූව, දළුගම්ගොඩ, වරාකනත්ත, දිග්පිටිගොඩ, පෙතියාගෙඩ, සිංහාරමුල්ල උතුර, පොල්හේන, කිරිබත්ගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශ ගංවතුර ආපදාව බහුලව බලපාන කොට්ඨාශ වේ.

මෙසේ වාර්ෂිකව සිදුවන ජල ගැලීම්වලින් වන හානිය අවම කර ගැනීම සඳහා මෙම ආපදා අවදානම් අවම කිරීම යටතේ ඇළ මාර්ග සංවර්ධන සැලැස්මක් සහ කලාපීකරණ සැලැස්මක් අඅඅඅඅසකස් කෙරේ.

### 6.5.3.1. පවතින ඇළ මාර්ග සංවර්ධනය

ඇමුණුම 33 GIS විශ්ලේෂණය මඟින් හඳුනාගත් පරිදි පවතින ඇළ මාර්ග සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ඒ අනුව සංවර්ධනය සඳහා හඳුනාගත් ඇළ මාර්ගයන් පහත පරිදි වේ.

| *ඇළ මාර්ගය* | *දිග ප්‍රමාණය* |
|---|---|
| *1. නාට ඇළ ප්‍රතිස්ථාපනය කිරීම (ගෝනවල සිට කළු ඇළ දක්වා)* | *3 (කි .මී)* |
| *2. ර්රිය ඇළ ප්‍රතිස්ථාපනය කිරීම (ර්රියවැටියේ සිට කළු ඇළ දක්වා)* | *3.4 (කි.මී)* |
| *3. හපුගහවෙල්ල ප්‍රතිස්ථාපනය කිරීම (කිරිබත්ගොඩ සිට මහර මුදුන් ඇළ දක්වා)* | *7.3 (කි.මී)* |
| *4. මුදුන් ඇළ ප්‍රතිස්ථාපනය කිරීම* | *800 (මීටර්)* |
| *5. කුඹල් ඔය ප්‍රතිස්ථාපනය කිරීම (ගෝනවල සිට කැලණි ගඟ දක්වා - පෙතියාගොඩ)* | *6 (කි .මී)* |

***වගුව 6.18 :*** *ඇළ මාර්ග ප්‍රතිස්ථාපනය*
***මූලාශ්‍රය :*** *සැලසුම් කණ්ඩායම - ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, 2017*

ඇළ මාර්ග සංවර්ධනය කිරීමේ උපායමාර්ගයට අමතරව නිරන්තරයෙන් ජල ගැලීම්වලට මුහුණපාන කැලණි ගඟ උතුරු බැම්ම රක්ෂිත ප්‍රදේශයෙහි ව්‍යාප්තව පවතින අනවසර පැල්පත් නිවාස ප්‍රතිස්ථාපනය සඳහා යෝජිත දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP) යන වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා සම්බන්ධව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිය අන්තර්ගත කරගනිමින් කැලණි ගඟ උතුරු බැම්මෙහි පවතින 1200ක් පමණ වන අනවසර පැල්පත් නිවාස ප්‍රතිස්ථාපනයට යෝජනා කෙරේ.

මීට අමතරව වාරි මාර්ග දෙපාර්තමේන්තුව විසින් යෝජිත පෙතියාගොඩ ජල පොම්පාගාරය ස්ථාපිත කිරීම මඟින් හෙක්ටයාර 33 ක ප්‍රමාණයකට ඇතිවන ගංවතුර තත්ත්වය අවම කිරීමට බලාපොරොත්තුවේ. තවද එමඟින් මිලියන 5 ක් පමණ වාර්ෂිකව අහිමි වන වටිනා පුද්ගල දේපළ ආරක්ෂාකර ගැනීමේ හැකියාවක්ද පවතී. මෙම ව්‍යාපෘතිවල බලපෑම හා පහත සිතියම 6.14 මඟින් දැක්වෙන පරිදි යෝජිත ඇළ මාර්ග සංවර්ධන සැලැස්ම මඟින් ගංවතුර අවධානම අවම කිරීමට අපේක්ෂා කෙරේ.



**සිතියම 6.14 :** *යෝජිත ඇළ මාර්ග සංවර්ධන සැලැස්ම*

## 6.5.3.2 ගංවතුර බලපෑම් ප්‍රදේශ කලාපීකරණය

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය අනුව නාගරික ප්‍රදේශය ප්‍රධාන වශයෙන් යෝජිත කලාප 2 කට වර්ගීකරණය කළ හැකිය. අදාළ සැලැස්ම සිතියම 6.15 මඟින් දැක්වේ.

- හරිත තීර කලාපය
- ගංවතුර රඳවා තැබීමේ සහ බැසයාමේ කලාපය

### I. *හරිත තීර කලාපය*

කැලණි ගඟ රක්ෂිතය මීටර් 60 ක් ගංවතුර රඳවා තැබීමේ ධාරිතාවය සපුරාලීමට සහ විවේක විනෝද කටයුතු පහසුකම් සැපයීමට විවෘත තීරයක් ලෙස තබාගත හැකිය.

### II. *ගංවතුර රඳවා තැබීමේ සහ ජලය බැසයාමේ කලාපය*

ගංවතුර උවදුර අවම කිරීම සඳහා මෙම කලාපයට අයත් සියලු වගුරු බිම්, කුඹුරු සහ පහත් බිම් ප්‍රදේශ ආරක්ෂා යුතුය.

### *කලාප සඳහා අනුමත භාවිතයන්*

### I. *හරිත තීර කලාපය*

අ. උද්‍යාන සහ වියළි කාලගුණ තත්ත්වයන්හිදී ක්‍රීඩා කළ හැකි ක්‍රීඩා පිටි
ආ. අවිධිමත් විනෝද පහසුකම්
ඇ. වනාන්තර
ඈ. රේඛීය උද්‍යාන ආදිය

II. ගංවතුර රඳවා තැබීමේ සහ ජලය බැසයාමේ කලාපය

අ. මලල ක්‍රීඩා පිටි /ක්‍රීඩා පිටි
ආ. ළමා ක්‍රීඩාංගන
ඇ. රේඛීය උද්‍යාන
ඈ. ගංවතුර රඳවා ගැනීම සහ බැසයාමේ ප්‍රදේශ
ඉ. අවිධිමත් විනෝද කටයුතු
ඊ. කෘෂිකාර්මික මූලික ක්‍රියාකාරකම්
උ. විනෝද කටයුතු සඳහා ඉතා අඩු ප්‍රමාණයෙන් කණු මත ඉදිකෙරෙන ගොඩනැගිලි



***සිතියම 6.15 :*** *යෝජිත ගංවතුර කලාපීකරණ සැලැස්ම*

## 6.5.3.3 ගංවතුර අවම කිරීම සඳහා ක්‍රමෝපායන්

1. *පහත්බිම් ප්‍රදේශ වල ඉදි කිරීම් (අඩු ඝනත්වය සහිත ජනාවාස ප්‍රදේශ පවත්වාගෙන යාම) කටයුතු අවම කල යුතු අතර වැසි ජලය බැසයාමේ ක්‍රමවේදයන් සකස් කල යුතුය.*
2. *ගංවතුර බාධක බැම් ඉදිකිරීම.*

    අ. *පවතින වේලි හා ඇල මාර්ගවල පවතින ජල ගේට්ටු ප්‍රතිසංස්කරණය*

    ආ. *හඳුනාගත් ඇළ මාර්ගවල නව ජල ගේට්ටු ඉදිකර ගඟේ ජලය වැඩි වූ විට ඇළ මාර්ග ඔස්සේ ගමන් කිරීමට අවශ්‍ය පියවර ගැනීම මඟින් දෙපස සිටින ජනතාවට සහ දේපල වලට සිදුවන හානිය වලක්වා ගැනීම.*

    ඇ. *ගංවතුර බාධක ඉදි කිරීම නිසා වැසි කාලයන්හිදී ස්වභාවිකව ගඟට ජලය එකතු වන මාර්ග ඇසිරීමෙන් එකතු වන ජලය ඒ ඒ ප්‍රදේශවල සකස් කල ස්ථානයකට එකතු වන්නට ඉඩ සලසා එම ජලය මෝටර් මඟින් ගඟට පොම්ප කිරීම සඳහා පොම්පාගාර ඉදිකිරීම.*

3. *ගංවතුරට ගැලපෙන අනුමත භාවිතයන් සඳහා අවදානම් ප්‍රදේශ භාවිතා කිරීම.*
4. *ගංවතුර රැඳවුම් ජලාශ ඉදිකිරීම.*
5. *ජල පෝෂක ප්‍රදේශයන්හි වන වගා කිරීම*
6. *ගංවතුර අවදානම අඩු කිරීම සඳහා ජලය රඳවා ගැනීමේ ලක්ෂණ වැඩි කිරීම.*

    අ. *ගංගා ඉවුරු දිගේ ශක්තිමත් වූ මුල් බැස යන ශාක වගා කිරීම.*

    ආ. *ජනාවාස වටවන පරිදි ශක්තිමත් ගස් වර්ග රෝපණය කිරීම මඟින් ගංවතුර අවස්ථාවේදී ජල පහරේ වේගය අඩුකර ගත හැක.*

## 6.5.4 පොදු එළිමහන් සහ විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන බල ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සැකසීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිති මට්ටම්වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1 ක් අවම වශයෙන් සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස වෙන්කළ යුතුය. කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2017 වසර වන විට ජනගහනය 111,300 ලෙස හඳුනාගෙන ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2030 වන විට ජනගහනය 141,000 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ඉඩම් හෙක්ටයාර් 141 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය.

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වර්තමානයේ පවතින විනෝද පහසුකම් සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක දෙකක් යටතේ සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී වියහැකි ඉඩකඩ ප්‍රමාණයක් අවශ්‍යය. එනම්,

- *ක්‍රීඩා කිරීම*
- *පිහිනීම*
- *දිවීම*
- *ඇවිදීම*
- *බෝට්ටු පැදීම*
- *සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම     නිදසුන් ලෙස දැක්විය හැක.*

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරාගත හැකි ස්ථාන ඉතා සීමිත තත්ත්වයේ පවතී. මෙසේ පවතින සෑජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන ඇමුණුම 40 යටතේ දැක්වෙන අතර එහි සංක්ෂිප්ත සටහන වගුව 6.19හි දැක්වේ.

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (ha) |
|---|---|---|
| 1 | ඉතා කුඩා උද්‍යාන – Pocket Parks (EPP) | 0.52 |
| 2 | කුඩා උද්‍යාන – Mini Park (EMP) | 4.34 |
| 3 | මධ්‍යම උද්‍යාන පහළ මට්ටම – Local Parks (ELP) | 4.27 |
| 4 | ඇවිදින මංතීරුව – Linear Park (ELiP) | 0.56 |
| **එකතුව** | | **9.69** |

**වගුව 6.19 :** කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන
**මූලාශ්‍රය :** පරිසර හා භූ දර්ශන අංශය

ඉහත තොරතුරුවලට අනුව කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැනට හෙක්ටයාර් 10ක් විවෘත භූමි ලෙස ඇත. වර්තමාන ජනගහනය මත 111,300 ක් සඳහා සෑජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස අවම වශයෙන් හෙක්ටයාර් 111 ක් වෙන්ව තිබිය යුතුය. නමුත් වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොමැති අතර දැනට පවතින ස්ථානවලද පහසුකම් ප්‍රමාණවත් නොවේ.

කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි දැක්විය හැකිය.

| පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව | සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| 1. කිරිබත්ගොඩ මහජන පුස්තකාලය | 17,710 | 2,959 |
| 2. කැලණිය මහජන පුස්තකාලය | 14,393 | 2,959 |
| 3. මැවැල්ල මහජන පුස්තකාලය | 5,736 | 653 |
| 4. දිප්පිටිගොඩ මහජන පුස්තකාලය | 3537 | 99 |
| 5. හුණුපිටිය මහජන පුස්තකාලය | 6897 | 909 |
| 6. නාහේන මහජන පුස්තකාලය | 2439 | 355 |
| 7. පොල්හේන මහජන පුස්තකාලය | 3014 | 434 |
| 8. වේවැල්දූව මහජන පුස්තකාලය | 1711 | 209 |
| 9. වනවාසල මහජන පුස්තකාලය | 4748 | 877 |
| 10. හිඹුටුවැල්ගොඩ මහජන පුස්තකාලය | 1495 | 114 |
| 11. දළුගම්ගොඩ මහජන පුස්තකාලය | 755 | 60 |

**වගුව 6.20 :** කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින මහජන පුස්තකාල
**මූලාශ්‍රය :** වැඩසටහන් අයවැය ලේඛනය - 2017

**06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම**

තිරසර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

පොදු එළිමහන් සහ විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

2030 වන විට ජනගහනය 141,000 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2030 වන විට සෑජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ඉඩම් හෙක්ටයාර් 141 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය. කැලණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය 2018 – 2030 වසර සඳහා වන යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම සිතියම 6.16 යටතේද වගු අංක 6.21 සහ ඇමුණුම 41 මඟින් ද දක්වා ඇත.

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (ha) |
|---|---|---|
| 1 | යෝජිත ඉතා කුඩා උද්‍යාන - Proposed Pocket Parks (PMP) | 0.66 |
| 2 | යෝජිත කුඩා උද්‍යාන - Proposed Mini Parks (PMP) | 10.64 |
| 3 | යෝජිත අසල උද්‍යාන - Proposed Local Parks (PLP) | 4.02 |
| 4 | යෝජිත මධ්‍යම නගර උද්‍යාන - Proposed Central Urban Parks (PCUP) | 29.47 |
| 5 | යෝජිත රේඛීය උද්‍යාන - Proposed Linear Parks (PLiP) | 87.69 |
| **එකතුව** | | **132.48** |
| 6 | පවතින පොදු එළිමහන් විවෘත භූමි ප්‍රමාණය | 9.69 |
| **සමස්ථ එකතුව** | | **142.17** |

**වගුව 6.21 :** යෝජිත සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් සැලැස්ම (2019 – 2030)
**මූලාශ්‍රය :** පරිසර හා භූ දර්ශන අංශය

යෝජිත උද්‍යාන වර්ගය අනුව ඒවායේ අනුමත භාවිතයන් ඇමුණුම 42 මඟින් දක්වා ඇත.

## 1. *යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබද අවකාශීය සැලැස්ම සඳහා උපායමාර්ග*

1.1. *දැනට පවතින සියලුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කළහැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට ක්‍රීඩා සහ සෘජු විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීම, වර්ගීකරණය කිරීම, ප්‍රතිසංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.*

1.2. *ප්‍රදේශයේ පවතින සංවර්ධනය කළ යුතු සියලු ක්‍රීඩාංගන පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.*

1.3. *ඉඩම් සහ අනු බෙදීම්වලදී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් සෘජු විනෝද පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.*

1.4. *සමාජීය විනෝද කටයුතු පහසුකම්*

1.5. *දේශීය සහ විදේශීය සංචාරකයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි සංචාරක අවශ්‍යතාවලට ගැළපෙන ප්‍රමිතියෙන් යුතු නිවාඩු නිකේතන, බංගලා, සංචාරක හෝටල්, ස්ථාපිත කිරීම.*

## 2. ජෛවිය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම

2.1. ප්‍රදේශයේ පවතින ඇළ, ඔය සහ ගඟ රක්ෂිතයන් ජෛවිය උද්‍යාන ලෙස සංවර්ධනය කළ යුතු අතරම එය ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ප්‍රමාණවත් විනෝදාස්වාද කටයුතු සහ පහසුකම් සැලසීමට මෙන්ම ගංවතුර උවදුර පවතින ප්‍රදේශවල එය පාලනයට යොදා ගත හැකිය.

## 3. 2030 වන විට උෂ්ණත්වය අඩු කිරීම - ක්‍රමවේදය

3.1. සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නීල හරිත ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.

3.2. සියලුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුළ ජල විසිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.

3.3. ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබඳව දැනුවත් කිරීම.

3.4. යෝජිත සියලුම වාහන නැවතුම්හලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල් හරිත නැවතුම්පලවල් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම

3.5. බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොළවට උරාගන්නා ක්‍රමවේදයන්ට පමණක් සීමා කිරීම. (interlocking) සහ ඒවා ද ලා වර්ණයන්ට පමණක් සීමාකිරීම.

3.6. පවතින ක්‍රීඩාභූමි, උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මූලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.




**සිතියම 6.16 :** *යෝජිත පොදු එළිමහන් හා විවෘත භූමි සැලැස්ම*

# 6.6. සංස්කෘතිය හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

කැලණිය, එහි ඓතිහාසික පසුබිමත් සමඟ ප්‍රදේශයට ආවේණිකත්වයක් ආරෝපණ වී තිබෙන ප්‍රදේශයකි. වර්තමානයේ පවතින සංවර්ධන විභවතාවයන් සමඟ කැලණිය පූජා භූමි ප්‍රදේශය ආසන්න භූමි පරිහරණය අතිශයින් පූජා භූමි ප්‍රදේශයට නොගැළපෙන අයුරින් වෙනස් වෙමින් පවතී. මෙහි ප්‍රතිඵලයක් ලෙස කැලණිය පූජා භූමිය යන හැඟීම වියැකී යන පරිදි අවට පරිසරය වෙනස් වී ඓතිහාසික පූජනීය වටාපිටාව කැලණිය විහාර භූමියට පමණක් සීමා වී ඇත. විදෙස් රටවල මෙන්ම ලංකාවේ ද ජල ප්‍රභවයන් මූලාශ්‍ර කරගෙන ක්‍රියාත්මක වන මහනුවර, කතරගම වැනි පූජා නගර මෙන් කැලණි ගඟ මූලාශ්‍ර කරගෙන ඒ හා සමඟාමීව පූජනීය, සංස්කෘතික අනන්‍යතාවය ස්ථාපිත කිරීමට සුදුසු වටාපිටාවක් මෙම ප්‍රදේශයෙහි පවතී. මෙම විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් දැක්මෙහි සඳහන් පරිදි පවතින නාගරික තලය දිව්‍යමය නාගරික තලයක් බවට පත් කර ගැනීමටනම් පූජා භූමි ප්‍රදේශයේ වටාපිටාව නිසි පරිදි කළමනාකරණය කළ යුතු වේ.

මෙහි දී කැලණිය පූජා භූමියෙහි නූතන ප්‍රතිරූපය කැලණි ගඟ සමඟ ද ඒකාබද්ධ කරමින් "කැලණිය පූජා නගරය"යන පූජනීය හැඟීම ස්ථාපිත කිරීම 2030 වසර සඳහා වූ දැක්ම වෙත යාමේ ප්‍රධාන අරමුණ වන අතර 2030 වන විට කැලණිය රජමහා විහාරය ඇතුළු පූජා භූමිය සෘජු ප්‍රවේශයන් ඔස්සේ සම්බන්ධ විය හැකි කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාන ගත කිරීමත්, 2025 වන විට කැලණි විහාරස්ථානය වටා මීටර් 500 ක් ආවරණය වන පරිදි හෙක්ටයාර 105 ක භූමි ප්‍රමාණයක් පිටත පූජා භූමිය ලෙස ප්‍රවර්ධනය කිරීමත්, 2025 වන විට කැලණි ගඟේ කි.මී. 6 ක් පමණ කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශයට අයත්වන ගං මුහුණත ප්‍රදේශයෙන් කි.මී. 1ක් පමණ මුහුණත ගං ඉවුර පූජා භූමියේ දර්ශනීයත්වය ඉහළ නැංවීම උදෙසා විවෘත කිරීමත්, 2030 වසර වන විට කැලණිය ප්‍රදේශය පුරාම පවතින පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික වටිනාකමක් සහිත ස්ථාන යා කරමින් නැරඹුම් ස්ථාන ජාලයක් නිර්මාණය කිරීමත්, 2030 වසර වන විට පැරණි මැටි කර්මාන්තය පූජා නගරය හා සම්බන්ධ කරමින් දේශීය කර්මාන්ත නඟා සිටුවීම උදෙසා දායක වීමත් යන පරමාර්ථයන් සපුරා ගැනීම පූජා භූමි සංවර්ධන සැලැස්ම මඟින් අපේක්ෂා කෙරේ.

## 6.6.1 පූජා භූමි සංවර්ධන සැලැස්ම

පූජා භූමි සංවර්ධන සැලැස්ම ප්‍රධාන උපායමාර්ගයන් දෙකක් ඔස්සේ ගොඩනඟා ඇත. පහත පැහැදිලි කිරීම්වලට අදාළ ස්ථානගත කිරීම සිතියම 6.17හි දැක්වේ.

### 6.6.1.1. කැලණිය ශාන්ත පූජා භූමි සංවර්ධනය (Kelaniya Placidity Precinct Strategy)

දැනට හෙක්. 13 ක් පමණ භූමි ප්‍රමාණයක් ආවරණය කෙරෙන ඇතුළත පූජා භූමි කලාපයට පමණක් සීමා වී තිබෙන 'කැලණිය පූජා භූමිය' යන නාමයට ගොඩනැඟී තිබෙන ආවේණිකත්වය ආරක්ෂාකර ගැනීම සඳහා ඇතුළත පූජා භූමියෙන් පිටතට මී. 500 ක පමණ වටප්‍රමාණයක් ආවරණය වන පරිදි පිටත පූජා භූමි ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව කලාපීකරණ සැලැස්ම මඟින් යෝජිත ආකාරයට කැලණි විහාරයද ඇතුළත්ව හෙක්. 150 ක භූමි ප්‍රමාණයක් ආවරණය කෙරෙන ප්‍රදේශය පූජා භූමි හා පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය ලෙස හඳුනාගෙන ඇත. එම කලාපයට යෝජිත රෙගුලාසි මඟින් "කැලණිය පූජා භූමි ප්‍රදේශය" යන වියැකී යන ආවේණිකත්වය ගොඩනැංවීමට යෝජනා කෙරේ. කලාපීකරණ සැලැස්මේ යෝජිත කලාප ඝනත්වයන් පූජා භූමියේ සිට ප්‍රදේශයේ උතුරට යන විට අඩු ඝනත්වයක සිට වැඩි ඝනත්වයක් දක්වා භෞතික ස්වරූපය වෙනස් වන ආකාරයට පෙළගස්වා ඇත.

## 06 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්ම

### සංස්කෘතිය හා උරුමයන් කළමනාකරණය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

#### පූජා භූමි සංවර්ධන සැලැස්ම

යෝජිත මාර්ග හා ප්‍රවාහන සැලැස්ම හා භූ දර්ශන කලමනාකරණ සැලැස්ම මඟින් සඳහන් කෙරෙන පරිදි දැනට පූජා භූමිය දෙසට පවතින කොළඹ – බියගම ඍජු ප්‍රවේශ මාර්ගයට අමතරව කොළඹ – නුවර මාර්ගය හා පූජා භූමි ප්‍රදේශය යා කෙරෙන විශාල වෘක්ෂ තීරයන් සහිත ඍජු ප්‍රවේශ මාර්ගයන් තුනක් තොරණ හන්දිය, ටයර් හන්දිය හා කිරිබත්ගොඩ සිට පූජා භූමිය දක්වා ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ. පවතින තොරණ හන්දිය ප්‍රවේශ දොරටුව ද නවීකරණය කරමින් මෙම ප්‍රධාන ප්‍රවේශයන් තුන ආරම්භ වන ස්ථානයන් පූජා භූමි ප්‍රවේශ දොරටු ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. දැනට ඇතුළත පූජා භූමිය ආසන්නයෙන්ම දිවෙන කොළඹ – බියගම මාර්ගය හරහා බියගම වෙළෙඳ කලාපය හා සම්බන්ධ වන රථවාහනවලින් 1/3 ටත් වඩා ගමන් කිරීම නිසා ඇතිව තිබෙන නොසන්සුන්කාරී තත්ත්වය වැළැක්වීම උදෙසා පිලපිටිය, ගල්බොරැල්ල හා කොහොල්විල හරහා පූජා භූමිය මඟ හැරයා හැකි මෙන්ම ඇතුළත පූජා භූමි කලාපයේ සිට මී. 500 ක් පමණ ආවරණය වන ප්‍රදේශය වට කරමින් යෝජිත පූජා භූමි හා පුරාවිද්‍යා සංරක්ෂණ කලාප මායිම ඔස්සේ කැලණි නිම්න චන්ද්‍රවංක මාර්ගය ලෙස නව මාර්ගයක් යෝජනා කර ඇත.

පූජා භූමි හා පුරාවිද්‍යා සංරක්ෂණ කලාපය සඳහා වන කලාපීය රෙගුලාසි මඟින් කලාපය තුළ පවතින සියලුම ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා සරිලන වර්ණ භාවිතයන්, වීදි අලංකරණය ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම හරහා කලාපය තුළ පූජනීය, පෞරාණික හැඟීම උද්දීපනය කරලීම අපේක්ෂා කෙරේ. ආර්ථික සැලැස්ම මඟින් ප්‍රදේශය තුළ පැරණි මැටි කර්මාන්තය ප්‍රතිස්ථාපනය කර පූජා භූමි ප්‍රදේශය හා සම්බන්ධ කෙරෙමින් කලාපීය ආර්ථිකය නඟා සිටුවීමට කටයුතු කිරීම හරහා ද ප්‍රදේශය තුළ වන්දනාකරුවන් සඳහා පවතින නැරඹුම් ස්ථාන ඇති කිරීමටත් ඒ තුළින් දෛනිකව පූජා භූමිය වැඳපුදාගැනීමට එන 20000ක් පමණ බැතිමතුන් මෙන්ම මාසිකව පැමිණෙන 75000–100000 පමණ වන වන්දනාකරුවන් සැලකිය යුතු වේලාවක් ප්‍රදේශය තුළ රඳවා ගැනීම තුළින් වන්දනාකරුවන් පාදක කරගත් ආර්ථික සංවර්ධනයක් අපේක්ෂා කෙරේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අනුව කැලණිය ප්‍රා.ස. බල ප්‍රදේශය තුළ කැලණි විහාර ප්‍රදේශයද ඇතුළත්ව පුරාවිද්‍යා ස්ථාන 18ක් හඳුනාගෙන ඇත. මේ අතරින් බොහෝමයක් ස්ථානයන් මේ වන විට අභාවයට යන තත්ත්වයට පත්ව ඇති හෙයින් ඒවා සංරක්ෂණය කරමින් කැලණි පූජා භූමියට පැමිණෙන බැතිමතුන් සඳහා විවෘත කිරීමට සැලසුම් කෙරේ. ඒ අනුව පුරාවිද්‍යා සහ සංස්කෘතික හා ආගමික වටිනාකම් සහිත ස්ථාන එක් කරමින් ආගමික සහ සංස්කෘතික සංචාරක මංතීරයක් නිර්මාණය කිරීම හරහා මෙම ප්‍රදේශයේ පෞරාණික අනන්‍යතාවය තවදුරටත් ඔපනංවාලීමට අපේක්ෂිතයි.




*සිතියම 6.17 : යෝජිත සංස්කෘතික හා උරුමයන් කළමනාකරණ සැලැස්ම*

## 6.6.1.2. සමාජ - සංස්කෘතික කැලණි ගංගා තීර සංවර්ධනය (Socio – Cultural River Scape Improvement Strategies)

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය විශ්ලේෂණය කිරීම යටතේ ලංකාවේ මෙන්ම විදෙස් රටවලද පූජා නගරයන් ජල මූලාශ්‍රයන් කේන්ද්‍ර කොටගෙන ඉතා අලංකාරව නිර්මාණය වී ඇත. කැලණි විහාරයද ලංකාවේ ප්‍රධාන ජල මූලාශ්‍රයක් වන කැලණි ගඟබඩ පිහිටා තිබෙන පූජනීය ස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. නමුත් කොළඹට ආසන්නව පවතින ප්‍රදේශයක් ලෙස මෙය සීඝ්‍රයෙන් ජනාකීර්ණ වීම හේතු කොටගෙන කැලණි ගඟ සංරක්ෂණ කලාපයද පැල්පත් මුඩුක්කු හා අනවසර ඉදිකිරීම් සඳහා යොදා ගැනීම හේතු කොටගෙන මේ වන විටත් කැලණිය ප්‍රදේශයේ කැලණි ගංගාව හා කැලණි විහාරය අතර පවතින සබඳතාවය දුරස් වී ඇත. දැනට කැලණිය ප්‍රා.ස බල ප්‍රදේශයට අයත් කැලණි ගඟ රක්ෂිතයේ අනවසර නිවාස 1500 ක් පමණ ව්‍යාප්තව ඇත. 2030 වසර සඳහා වූ දැක්ම සාක්ෂාත් කරගැනීමේදී, 2025 වන විට කැලණි ගඟේ කි. මී. 1 ක් පමණ මුහුණත ගං ඉවුර පූජා භූමියේ දර්ශනීයත්වය ඉහළ නැංවීම උදෙසා විවෘත කිරීම පරමාර්ථයක් වේ.

මේ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා සමගාමීව කරගෙන යනු ලබන Climate Recilient and Improvement යන ව්‍යාපෘතිය හරහා කෙරෙන කැලණි ගඟ ඉවුර අනවසර නිවාස නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ කරගනිමින් පවතින කැලණි ගං ඉවුර වන්දනාකරුවන් හා මහජනතාව වෙනුවෙන් විවෘත කිරීමට යෝජනා කෙරේ. මේ සඳහා කැලණි ගඟ උතුරු බැම්ම රේඛීය උද්‍යානයක් ලෙස ස්ථාපිත කිරීමට යෝජිත අතර එය කැලණිය පූජා භූමි ආගමික සංස්කෘතික මංතීරයට සම්බන්ධ කරමින් පූජනීය හැඟීම ස්ථාපිත කරලීමට කටයුතු කෙරේ.

මෙහිදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් කැලණිය පූජා භූමි ප්‍රදේශය උදෙසා යෝජිත නව යෝජනාවන් සහ සම්බන්ධ කර ගනිමින් කැලණි ගඟ හරහා එගොඩ කැලණිය පූජා භූමිය සහ මෙගොඩ කැලණිය පූජා භූමිය එකිනෙක සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර තිබෙන කැලණිය පූජා නගර සැලැස්ම ඇමුණුම 27 හි දැක්වේ. එමෙන්ම පූජා භූමි ප්‍රදේශයෙන් හා ප්‍රධාන මාර්ගයෙන් යෝජිත කැලණි ගං ඉවුර රේඛීය උද්‍යානයට පවතින ප්‍රවේශයන් පුළුල් කිරීමට යෝජනා කෙරේ.එය පහත සිතියම 6.18 හි දැක්වේ.



***සිතියම 6.18 :*** *සමාජ - සංස්කෘතික කැලණි ගංගා තීර සංවර්ධන සැලැස්ම - කැලණි ගඟ උතුරු බැම්ම*

# 6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම

## 6.7.1. උපායමාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති

කැලණිය සංවර්ධන සැලැස්ම 2018 – 2030 දැක්ම අනුව 'දිව්‍යමය නාගරික තලය' යන දැක්ම සාක්ෂාත් කර ගැනිමෙහිලා කැලණිය පූජා භූමියෙහි නූතන ප්‍රතිරූපය කැලණි ගඟ සමඟ ද ඒකාබද්ධ කරමින් "කැලණිය පූජා නගරය"යන පූජනීය හැඟීම ස්ථාපිත කිරීමත්, ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීමත් හා නීල–හරිත පරිසර පද්ධති ඒකාබද්ධ කරමින් සුවපහසු නගරයක් බිහිකිරීමත් අරමුණු විය. ඒ අනුව යෝජනා කරන ලද නව ව්‍යාපෘති හා අන්තර්ගත කරගනු ලබන වෙනත් ව්‍යාපෘති යන සියල්ල සංකල්පමය සැලැස්ම හා අරමුණු සමඟ අනුගත වීමත්, පාරිසරික හා සාමාජීය ශක්‍යතාවය යන කරුණු පදනම් කොට ගෙන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව පෙළ ගැස්වීම මඟින් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම උදෙසා උපායමාර්ගික ව්‍යාපෘති හඳුනා ගෙන ඇත. මෙම ව්‍යාපෘති ප්‍රමුඛතාකරණය ඇමුණුම 43 මඟින් විශ්ලේෂණය කෙරේ.

### පළමු ප්‍රමුඛතා ව්‍යාපෘති

- *කිරිබත්ගොඩ ගුවන් පදික මංතීරු සහිත බහු මහල් රථගාල*
- *පැලියගොඩ – මහර යා කෙරෙන කිරිබත්ගොඩ විකල්ප මාර්ගය*
- *හුණුපිටිය නගර මධ්‍ය ප්‍රවාහන මධ්‍යස්ථාන සංවර්ධන ව්‍යාපෘතිය*
- *හුණුපිටිය දුම්රිය හරස් මාර්ගය පදික මංතීරු සහිතව සංවර්ධනය කිරීම*
- *හුණුපිටිය දුම්රිය ස්ථානය නවීකරණය*
- *කුඩා බස් නැවතුම් පොළ*
- *රථගාල*
- *වාණිජ සංකීර්ණය*
- *කැලණි ගඟ උතුරු බැම්ම රේඛීය උද්‍යානය හා ප්‍රවේශ මංපෙත් සංවර්ධන ව්‍යාපෘතිය*
- *ඇළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති*
- *නාථ ඇළ ප්‍රතිසංවර්ධනය*
- *හපුගහ වේල්ල ප්‍රතිසංවර්ධනය*
- *ඊරි ඇළ ප්‍රතිසංවර්ධනය*
- *මුදුන් ඇළ ප්‍රතිසංවර්ධනය*
- *කුඹල් ඔය ප්‍රතිසංවර්ධනය*
- *ගුවන් පදික මංතීරු ස්ථාපනය – YMBA හන්දිය / ඊරියවැටිය හන්දිය*
- *කිරිබත්ගොඩ බහුකාර්ය වාණිජ සංකීර්ණය (Kiribathgoda City Center)*
- *පූජා භූමි ප්‍රවේශ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*
- *තොරණ හන්දිය –කැලණි විහාරය*
- *ටයර් හන්දිය – කැලණි විහාරය*
- *කිරිබත්ගොඩ –කැලණි විහාරය*
- *පූජා භූමි ප්‍රවේශ මාර්ග සඳහා හරිත තීර සංවර්ධන ව්‍යාපෘතිය*
- *නව කැලණි නිම්න චන්ද්‍රවංක මාර්ගය ස්ථාපනය*
- *කිරිබත්ගොඩ නගර මධ්‍ය රේඛීය උද්‍යානය*
- *වන්දනාකරුවන් සඳහා නව විශ්‍රාම ශාලාව තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපනය – කැලණිය*

## දෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති

- *කිරිබත්ගොඩ ආරුක්කු වෙළෙඳ තීර සංවර්ධන ව්‍යාපෘතිය*
- *හුණුපිටිය – වත්තල මාර්ගයේ මංතීරු හතරක් දක්වා පුළුල් කිරීම*
- *අභ්‍යන්තර මාර්ග පුළුල් කිරීමේ ව්‍යාපෘතිය*
- *කිරිබත්ගොඩ රෝහල් මාර්ගය මී. 12 දක්වා පුළුල් කිරීම*
- *ඊරියවැටිය මාර්ගය මී. 12 දක්වා පුළුල් කිරීම*
- *වේවැල්දූව මාර්ගය මී. 12 දක්වා පුළුල් කිරීම*
- *දිප්පිටිගොඩ මාර්ගය මී. 12 දක්වා පුළුල් කිරීම*
- *වනවාසල– වත්තල මාර්ගය මී. 12 ක් දක්වා පුළුල් කිරීම*
- *හුණුපිටිය මධ්‍ය ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය හා වෙළඳ සංකීර්ණය*
- *සරසවි චිත්‍රාගාරය නවීකරණය –ටයර් හන්දිය*
- *හුණුපිටිය නව පොදු වෙළඳ සංකීර්ණය*
- *මානෙල්ගම නවීන කසල ප්‍රතිචක්‍රීකරණ හා කොම්පෝස්ට් අංගනය නවීකරණය*
- *ගල්බොරැල්ල මැටි කර්මාන්තය ප්‍රතිස්ථාපනය*
- *කැලණිය මිශ්‍ර වාණිජ සංකීර්ණය*
- *ඇළ රක්ෂිතයන් සඳහා හරිත තීර සංවර්ධන ව්‍යාපෘතිය*
- *හුණුපිටිය රේඛීය උද්‍යානය*
- *පදික මංතීරු සහිත තෙත්බිම් උද්‍යානය කිරිබත්ගොඩ – කොහොල්විල*
- *පූජා භූමි ප්‍රවේශ දොරටු සංවර්ධන ව්‍යාපෘතිය*
  *(තොරණ හන්දිය, ටයර් හන්දිය,කිරිබත්ගොඩ)*
- *කැලණිය පොලිස් ස්ථානය ප්‍රතිස්ථාපනය කිරීම*

## තෙවන ප්‍රමුඛතා ව්‍යාපෘති

- *කැලණිය බස් නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය – (නුන්ගමුගොඩ TOD)*
- *පොල්හේන – නුන්ගමුගොඩ TOD සම්බන්ධක මාර්ගය ස්ථාපනය*
- *කැලණිය පූජා භූමිය වන්දනා කරුවන් සඳහා නව විවෘත විවේකී උද්‍යානය ස්ථාපනය*
- *හුණුපිටිය සති පොළ ස්ථාපනය*
- *කැලණි විශ්ව විද්‍යාලය නව ඉංජිනේරු පීඨය ස්ථාපනය – දාස ගොඩනැගිල්ල*
- *හුණුපිටිය නගර මධ්‍ය මිශ්‍ර සංවර්ධන චතුරශ්‍රය ස්ථාපනය*
- *කැලණි ගඟ බෝට්ටු ජැටිය ස්ථාපනය*
- *එගොඩ කැලණිය – මෙගොඩ කැලණිය විහාර යා කරන එල්ලෙන පාලම ස්ථාපනය*
- *කැලණිය – පහල හංවැල්ල නව ප්‍රවේශ පාලම ස්ථාපනය*
- *භූමි අලංකරණ සහිත ජල රැඳවුම් ප්‍රදේශ සංවර්ධන ව්‍යාපෘතිය – කැලණිය*
- *කිරිබත්ගොඩ බස් නැවතුම් පොළ නවීකරණය සහ උඩු මහල් නාගරික*
  *උද්‍යාන ස්ථාපනය*
- *කළු ඇළ ඉවුර හරහා හුණුපිටිය – වත්තල මංසන්ධි යාකරන පදික මංතීරය*
- *ප්‍රධාන දුම්රිය මාර්ගය නවීකරණය (වනවාසල, හුණුපිටිය දුම්රිය ස්ථානය)*
- *රාගම – නාරාහේන්පිට සැහැල්ලු දුම්රිය මාර්ගය ඉදිකිරීම*
  *(කිරිබත්ගොඩ, ටයර් හන්දිය, මානෙල්ගම දුම්රිය ස්ථානය)*
- *හුණුපිටිය කොට්ටාව සැහැල්ලු දුම්රිය මාර්ග*
  *(හුණුපිටිය දුම්රිය ස්ථානය, ටයර් හන්දිය දුම්රිය ස්ථානය,පොල්හේන දුම්රිය ස්ථානය)*
- *මානෙල්ගම – වනවාසල කසල හුවමාරු ස්ථානය හා අරුවක්කාලු සනීපාරක්ෂක බිම්*
  *පිරවුම් ව්‍යාපෘතිය*
